# ඉස්ලාමය

## අවබෝධ කරගැනීම

එහි මූලධර්ම, වටිනාකම් සහ උරුමය
පිළිබඳව කෙටි හැඳින්වීමක්

සමස්ත මානව සංහතියටම අනතුරු අඟවන්නෙකු වන පරිදි සිය ගැත්තා වන (මුහම්මද්) වෙත (නිවැරැද්දේ හා වැරැද්දේ) මිනුම් දණ්ඩ පහළ කළ ඔහු (අල්ලාහ්) අති උත්කෘෂ්ට වන්නේ ය.

පරිශුද්ධ වූ අල්- අල්-කුර්'ආනය 25:1

# ඉස්ලාමය අවබෝධ කරගැනීම

## එහි මූලධර්ම, වටිනාකම් සහ උරුමය පිළිබඳව කෙටි හැඳින්වීමක්

Islamic Information Center

2 වන සංස්කරණය, මුහර්රම් 1446 / ජූලි 2024

ප්‍රකාශන හිමිකම

මෙහි අඩංගු කිසිදු තොරතුරක් වෙනස් නොකිරීම සහ වාණිජ පරමාර්ථ මත එසේ නොකිරීම යන කොන්දේසි මත පදනම්ව, මානව සංහතිය විසින් ඉසලාමය අවබෝධ කරගැනීම සඳහා උපකාරී වේ යැයි අරමුණින් මෙම පොත ඕනෑම භාෂාවකින් මුද්‍රණය කිරීම සඳහා ඉස්ලාමීය තොරතුරු මධ්‍යස්ථානය සිය අවසරය ලබා දෙයි.

කර්තෘත්වය සහ ප්‍රකාශනය

ඉස්ලාමීය තොරතුරු මධ්‍යස්ථානය
සුල්තාන් ඛබූස් ප්‍රධාන දේවස්ථානය, මස්කට්
ඕමාන සුල්තාන් රාජ්‍යය
ටෙලිෆැක්ස් : (968) 2450 5170
www.iicoman.om




මහා කාරුණික, පරම දයාබර

අල්ලාහ්ගේ නාමයෙන්

# පටුන

කොටස පිටුව


පූර්විකාව ........ 1

1. ඉතිහාසය තුළ ඉස්ලාමය ........ 2
2. ඉස්ලාමයේ අර්ථය සහ එහි මූලික මූලධර්ම ........ 8
3. මැවුම්කරුවා වන අල්ලාහ්ගේ ස්වභාවය සහ ගුණාංග ........ 19
4. මුහම්මද් නබිතුමා - ඔහුගේ ජීවිතය සහ විශේෂ ලක්ෂණ ........ 21
5. නබිතුමා පිළිබඳ විශ්වසනීය බව ........ 24
6. කුර්'ආනයේ ඉතිහාසය සහ ඉන් ලබාදෙන පණිවිඩය ........ 30
7. කුර්'ආනයේ විශ්වසනීය බව ........ 39
8. නබිතුමාගේ සම්ප්‍රදායන් ........ 42
9. මරණින් මතු ජීවිතය ........ 44
10. අන්‍ය ආගම් ගැන ඉස්ලාමීය දර්ශනය ........ 49
11. ඉස්ලාමය තුළ ජේසුතුමා ........ 52
12. හැම ආගමක්ම නිවැරදියි නේද, එසේ නම් ඇයි ඉස්ලාමයම? 55
13. අදේවවාදය (Agnosticism) සහ අඥෙයවාදය (Atheism) පිළිබඳ අනුශාසනාව ........ 57
14. ඉස්ලාමය තුළ කාන්තාවන්ට ලබා දී ඇති තත්ත්වය ........ 61
15. ආගමික අන්තවාදය සහ ප්‍රචණ්ඩත්වය........ 62
16. ඉස්ලාමීය ජිහාදය ........ 64
17. ඉස්ලාමීය ෂරී'ආව ........ 66
18. ඉස්ලාමය තුළ ඇති බෙදීම් ........ 68
19. ඉස්ලාමයේ අඩංගු මූලික මානව හිමිකම් ........ 70
20. ඉස්ලාමයේ සංස්කෘතික විවිධත්වය ........ 74
21. ආගම වැදගත් වන්නේ ඇයි? ........ 78
22. යමෙකු ට මුස්ලිම්වරයෙකු විය හැක්කේ කෙසේද? ........ 80

පාරිභාෂික පදමාලාව ........ 82

සමාප්ති සටහන් ........ 84

යොමු ........ 88

# පූර්විකාව

අල්ලාහ් මනුෂ්‍ය වර්ගයා මැව්වේ ඔහු වෙනුවෙන් සේවය කිරීම සහ ඔහුගේ අණ ට අවනත ව ජීවත් වීම යන එකම අරමුණ මත ය. ඒ අනුව මෙතෙක්, ඔහුගේ අභිමතය ට අපි යටත් වීම (අරාබි බසින් ඉස්ලාම්) හෙවත් ඔහුගේ ආගම ඔහු විසින් ස්ථාපිත කිරීම සිදු වූ අතර, මනුෂ්‍ය වර්ගයා ට මෙම ආගම වෙත ට මඟපෙන්වීම සඳහා ඔහු විසින් පණිවිඩකරුවන් පත්කර, ඔවුන්ට ශුද්ධ වූ ග්‍රන්ථ ද බාදුන්නේයි. එබැවින්, සියලූම මනුෂ්‍ය වර්ගයාට මේ දෙවියන්ගේ ආගම පිළිබඳව දැනගැනීමේ පරම අයිතියක් ඇති අතර, විශ්වාසය සම්බන්ධ කරුණුවල දී දැනුම්වත්ව තේරීම් කිරීමට අවස්ථාවක් ලැබේ. අවාසනාවකට, එහි මුල් කාලයේ සිටම, ඉස්ලාමය පිළිබඳ විකෘති කළ අදහස් එහි විවේචකයන් විසින් පතුරුවා හැරි අතර, එහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ මිනිසුන් අතර ඉස්ලාමය පිළිබඳ වැරදි අවබෝධයක් සෑම විටෙකම පාහේ ඇති වී, ආධ්‍යාත්මික සත්‍යය සොයා යන්නන් සඳහා බාධකයක් ද නිර්මාණය වී ඇතී. තවද, සමහර විට ව්‍යතිරේක ඇති නමුත්, බොහෝ විට ඉස්ලාමය පිළිබඳ "විශේෂඥයන්" යැයි කියාගන්නා පුද්ගලයන් විසින් ඉදිරිපත් කෙරෙන කරුණු-කාරණා නොයෙක් ආකාරයේ ඒකාකෘතීන් සහ පක්ෂග්‍රාහී මතවාද නිසා දැඩි සේ කෙළෙසී ඇතී ඇත්ත වශයෙන්ම, බටහිර ලෝකයේ ලේඛකයන් විසින් සෘණාත්මක සහ නොමඟ යවන සුළු ආකාරයෙන් ඉස්ලාමය තරම් වෙනත් කිසිදු ආගමක් ගැන ලියා නැතී. එබැවින්, පසුගිය දශකයේ හෝ ඒ ආසන්න කාලයේ දී ඉස්ලාමය පිළිබඳව වැඩිමනත් ලියැවී තිබුණත්, එසේ සෘණාත්මක ව ලියැවුණු සාහිත්‍යයන් ට සාපේක්ෂව සත්‍යය මත සහ අන්‍යෝන්‍ය අවබෝධය ඇති කිරීමේ චේතනාව මත පදනම්ව ඉස්ලාමය ගැන ලියැවුණු විශ්වසනීය ලියැවිලි ඇත්තේ අල්ප වශයෙනි.

මෙම පොතේ අරමුණ මේ ශ්‍රේෂ්ඨ ආගම ගැන යම් අදහසක් ලබාදෙමින්, එපිළිබඳ විකෘති කිරීම් සහ දුර්මත ඉවත් කිරීම හරහා සියලූම මනුෂ්‍ය වර්ගයා ට ඉස්ලාමය නියම සහ සත්‍ය දෘෂ්ටිකෝණයෙන් දැකීම සඳහා අවස්ථාවක් ලබාදෙමින්, පුද්ගලයන් ට විශ්වාසය කරා එළැඹීම සඳහා නිවැරදි මාර්ගය පෙන්වා දීමයි. විශ්වාසය බොහෝ විට තීරණය වන්නේ කෙනෙකුගේ සංස්කෘතිය මගින් වන අතර, සත්‍යය ඇත්තේ කොහිද යන්න වෙන්කොට හඳුනාගත හැක්කේ දැනුම මඟින් ම පමණි.

# ඉතිහාසය තුළ ඉස්ලාමය

ඉස්ලාමය ආගමක් පමණක් නොව ශිෂ්ඨාචාරයක් ද වන අතර, එය මානව ඉතිහාසයේ සියවස් දහහතරක කාලයක් ද ඉක්මවමින්, සියලූම මහාද්වීපවල විශාල ප්‍රදේශවල විහිදී භූගෝලීයව ද තහවුරු වූ ඓතිහාසික යථාර්ථයකි. එය ශිෂ්ඨාචාරවල, විශේෂයෙන් බටහිර ශිෂ්ඨාචාරයේ සමහර අංග දියුණු කිරීමේ දී වැදගත් භූමිකාවක් නිරූපණය කළ ආධ්‍යාත්මික යථාර්ථයක් වන අතර, ලෝකයේ විවිධ පැතිවල මිනිසුන් විශාල සංඛ්‍යාවකගේ ජීවිතවල අභ්‍යන්තර සහ බාහිර පැතිකඩ පරිණාමනය ට ලක්කර තිබේ. නොයෙක් ජාතික, ජනවාර්ගික සහ සංස්කෘතික පසුබිම්වලට අයත් බිලියන දෙකක ට ආසන්න ජනතාවක් වර්තමානයේ ධාර්මික, අනුගාමික මුස්ලිම්වරු ලෙස දිවිගෙවති. වර්තමාන ලෝකයේ වැඩි ඉඩකඩක් ඉස්ලාමය විසින් අත්පත් කරගෙන ඇතිවාක් පමණක් නොව, බටහිර රටවල්, ආසියාවේ සහ අප්‍රිකාවේ ද ඉන් ඇති කරන ලද බලපෑම සාක්ෂි සහිතව ඔප්පු වේ. සමකාලීන මනුෂ්‍ය වර්ගයාගේ තත්ත්වය පිළිබඳව බලවත් සැලකිල්ලක් දක්වන අයට සහ බටහිර බුද්ධිමය සහ සංස්කෘතික ඉතිහාසය පිළිබඳව උනන්දුවක් දක්වන අයට මෙන්ම ආගම සහ එහි ආධ්‍යාත්මික පැතිකඩට ආකර්ෂණය වූ අයට ද ඉස්ලාමය පිළිබඳ දැනුම අතිශයින් වැදගත් වන්නේ ඒ නිසාය.

උම්මාහ් හෙවත් මුස්ලිම්වරු අයත් වන, ඉස්ලාමීය ලෝකය සමන්විත වන සමස්ත ජන සමූහයේ වැදගත්කම පිළිබඳව අදහසක් ලබානොගෙන යමෙකුට ඉස්ලාමය පිළිබඳව අවබෝධ කරගත නොහැකී. ඉස්ලාමීය උම්මාහ්ව යනු දෙවියන්ගේ ඒකීයත්වය සහ ස්වෛරීත්වය, මුහම්මද් නබිතුමාගේ (අල්ලාහ්ගේ ආශිර්වාදය සහ සමාදානය එතුමාණන්ට හිමි වේවා)[1] ශාස්තෘත්වය සහ දිව්‍යමය නීතිය (ෂරී'ආව) පිළිබඳව කුර්'ආනයෙන් ලබාදෙන පණිවිඩයෙන් බැඳුනකි. මුස්ලිම්වරු සහෝදරත්වය නම් බලවත් බැඳීම මඟින් එක්සත් වන අතර, සමහර මුස්ලිම් සමාජ එකිනෙකා හා ආරවුල් ඇතිකරගන්නා සමයන් හි දී පවා එම බැඳීම අද වන තුරුම ශක්තිමත්ව දැනේ. දේශපාලනික වශයෙන් මුස්ලිම්වරු තවදුරටත් එක්සත්ව නැත, එතෙකුදු වුවත් ඔවුන් තනි ආගමික ප්‍රජාවක් නොවේ. ඉස්ලාමීය උම්මාහ්වට අයත් වන සාමාජිකයන්ගෙන් වියුක්ත ජනවාර්ගික හෝ ජාතික කණ්ඩායම් මෙලොව ඇත්නම්, ඒ ඉතා සීමිත ප්‍රමාණයක් විය යුතු යී ආගමක් වශයෙන් මුළු මනුෂ්‍යත්වයට ම ආමන්ත්‍රණය කළ ඉස්ලාමය, එහි ආරම්භයේ පටන්ම සියලූම ආකාරයේ ජාතිවාදයන්, බෙදීම් සහ ගෝත්‍රික භාවයන්ට දැඩි ලෙස විරෝධය පළකළේය. ඉස්ලාමීය උම්මාහ්ව ලෝකයේ සෑම මහාද්වීපයක් පුරාම, එනම් ආසියාව, අප්‍රිකාව, යුරෝපය, උතුරු සහ දකුණු ඇමරිකා සහ ඕස්ට්‍රේලියාවේ විසිරී සිටින ජනවාර්ගික හා ජාතික කණ්ඩායම්වලින් සමන්විත වේ.

ඉස්ලාමීය ඉතිහාසය, එය උත්පාදනය වූ ඉස්ලාමීය සමාජය, ආයතන, සහ ශිෂ්ඨාචාරය පිළිබඳ ඉතිහාසයෙන් වෙන්කර දැක්විය නොහැක. මදීනාවේ ප්‍රථම ඉස්ලාමීය සමාජයේ ස්ථාපනය සලකුණු කරමින් නබිතුමා මක්කාහ්වේ සිට මදීනා නුවර දක්වා සංක්‍රමණය වූ කාලයේ පටන් එතුමාණන්ගේ මරණය දක්වාත්, එතැන් පටන් කාලයේ සිට යහමඟ-ලත් කලීෆාවරු සිව්දෙනා ආණ්ඩු කළ කාලය දක්වාත් වූ කාල පරිච්ඡේදය ක්‍රිස්තු වර්ෂ 622 සිට ක්‍රිස්තු වර්ෂ 661) ඉස්ලාමීය ඉතිහාසයේ අසමසම කාල පරිච්ඡේදයක් ලෙස සනිටුහන් වේ. ඔවුන්ගේ පසුකාලීන ඉතිහාසය පුරාවටම මුස්ලිම්වරුන් විසින් එම කාල පරිච්ඡේදය පරමාදර්ශී ලෙස සලකමින් මාර්ගෝපදේශ ලබාගෙන ඇති බව පැහැදිලි වේ.

යහමඟ-ලත් කලීෆාවරුන්ගෙන් පසුව ධූරයට පැමිණි පාලකයා දමස්කසය කේන්ද්‍රය බවට පත්කරගනිමින් විශාල අධිරාජ්‍යයක් ගොඩනැංවූ නමුත්, එය සිදු වූයේ යහමඟ-ලත් කලීෆාවරු ගොඩනගා තිබූ රාජ්‍ය ප්‍රධානීත්වය පරම්පරාගත රාජවංශයක් බවට පරිවර්තනය කරමිනි. ප්‍රථම මුස්ලිම් රාජවංශය වන උමයියාවරු මධ්‍යම ආසියාවේ සිට ස්පාඤ්ඤය සහ ප්‍රංශය දක්වා සිය පාලනය විහිදුවීමට සමත් වූයේ සියවස් ගණනාවක් පුරා බොහෝ සෙයින් රැකුණු සන්නිවේදන, පරිපාලන, නෛතික සහ හමුදා ආදී ආයතනවලින් සමන්විත පද්ධතියක් පිහිටුවමිනි. ඔවුන්ගේ බලප්‍රදේශය ට අදාළ පෙදෙස් තුළ පොදු පරිපාලනය, වාණිජ්‍යය, කෘෂිකර්මය සහ තැපැල් සේවා



ස්පාඤ්ඤයේ ග්‍රනාඩා හි අල්හම්බ්‍රා මාළිගාව

සම්බන්ධ උන්නතිය වෙනුවෙන් බොහෝ ප්‍රතිසංස්කරණ ඔවුන් විසින් හඳුන්වාදෙන ලදී. මුස්ලිම් ලෝකයේ පොදු සන්ධාන භාෂාව ලෙස අරාබි බස පත්කිරීම සහ ඔවුන්ගේම රන් හා රිදී කාසි අච්චු ගසමින් තනි මුදල් ඒකකයක් හඳුන්වාදීම වැනි කැපීපෙනෙන තීරණ ඔවුන් විසින්  ගනු ලැබුවේ උමයියා රාජවංශයේ ඉහළතම අවධියේ දී ය. දමස්කසයේ උමයියාද් දේවස්ථානය සහ ජෙරුසලමේ ශිඛරයේ කොත උමයියාවරුන්ගේ ගෘහනිර්මාණ ශිල්පයේ සාර්ථකත්වයන් සඳහා වැදගත් උදාහරණ වේ.

ඉස්ලාමයේ කේන්ද්‍රය බග්දාදය බවට පත්කළ අබ්බාසීයයන් විසින් ක්‍රි.ව. 750 දී උමයියාවරුන්ව බලයෙන් පහකරන ලදී. අබ්බාසීය පාලනය සලකුණු කරන්නේ ඉස්ලාමීය ශිෂ්ටාචාරය එහි උච්චතම ස්ථානයට ගෙනගිය කාල පරිච්ඡේදය යි. අබ්බාසීය පාලකයන් කලාව, විද්‍යාව සහ දර්ශනය යන ක්ෂේත්‍ර සඳහා ඉමහත් අනුග්‍රහයක් දැක්වූහී ඉස්ලාමීය විද්‍යාව සහ දර්ශනය පිබිදුණේ මෙම සමයේ දී ය. අබ්බාසීයයන් විසින් ධීමත් සංස්කෘතියක් නිර්මාණය කළ අතර, එමගින් සම්භාව්‍ය ග්‍රීසිය සහ රෝමය ට දැඩි අභියෝගයක් එල්ල විය. කාලය ගතවත්ම, බග්දාදයේ මධ්‍යම අධිකාරිය මුස්ලිම් ලෝකය තුළ බලය සහ අධ්‍යාපනය සම්බන්ධ නව ස්වාධීන මධ්‍යස්ථාන බවට විමධ්‍යගත වූ අතර, අධ්‍යාපන සහ පර්යේෂණ ආයතන එකිනෙකා හා තරග කරන මට්ටමට ක්‍රියාකාරී විය. එතෙක් දැනසිටි ලෝකයේ හැම කොණකින්ම පාහේ පැමිණි දැනුම සොයා යන්නෝ බග්දාදය, දමස්කස්, බුඛාරා, කයිරෝ, ෆෙස්, කෝර්දෝබාව, ශිරාස් ආදී මධ්‍යස්ථාන හරහා සිය දැනුම් පිපාසාව සංසිඳුවා ගත්හැ අල්-කින්දි, අල්-ෆරාබි, ඉබ්න් සිනා, ඉබ්න් රුෂ්ද්, ඉබ්න් අල්-හයිතම්, අල්-බිරුණිණි අල-ඛවාරිස්මි සහ තවත් බොහෝ අය නව අදහස් සමගින් අහසේ පෑයූ තරු මෙන් බැබලූහ. දර්ශනය, තාරකා විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, ගණිතය සහ මූලික විද්‍යාව පිළිබඳ බොහෝ ක්‍රියාකාරකම් මුස්ලිම් ලෝකය තුළ, එකල අන්තර්ජාතික පාණ්ඩිත්‍යයේ බස වූ අරාබි බසින් සිදුවෙමින් පැවතුණි. උමයියාවරුන්ගෙන් ආරම්භ වූ ඉස්ලාමීය නීතිය (ෂරී'ආව) කෙටුම්පත් කර සංග්‍රහගත කිරීම සිදුකොට අවසන් කළේ ද, අද පවතින සාම්ප්‍රදායික නීති ගුරුකුල (සුන්නි, ෂියා සහ ඉබාදි) ස්ථාපනය කළේ ද මෙම කාල පරිච්ඡේදයේ දී ය. එමෙන්ම බුඛාරි, මුස්ලිම් සහ අන් අය විසින් නියත සහ ඓතිහාසික හදීස් සංග්‍රහ පළකරන ලද්දේ ද මෙම කාල පරිච්ඡේදයේ දී ය. නවවැනි සහ දහවැනි සියවසේ මුස්ලිම් බග්දාදය සහ කෝර්දෝබාව ලෝක පුදුම බව පැවසීම අතිශයෝක්තියක් නොවේ - ඒවා ශිෂ්ට සම්පන්න බවින් ඉහළම නගර වූ අතර, බුද්ධිමත් සහ සංස්කෘතික මනස් ආකර්ෂණය කරගත් නගර ද විය. ප්‍රංශයේ, එංගලන්තයේ හෝ ඉතාලියේ පාලකයන් ට විශේෂඥ උපදේශකවරු, ශල්‍ය වෛද්‍යවරු, ගෘහ නිර්මාණ ශිල්පීන් සහ සංගීත ශිල්පීන් හෝ ඇඳුම් නිර්මාණ ශිල්පීන් පවා අවශ්‍ය වූ විට බග්දාදය හෝ කෝර්දෝබාව සම්බන්ධ කරගැනීමට

ඔවුන් උත්සුක වූහ. මුස්ලිම් නගර ගොඩනැංවුණේ ගලින් තැනූ නිවාස සහ මාළිගා වලිනි, ඒවායේ වීදි ගල් අතුරා, ආලෝකමත් කර තිබුණි. ජල පහසුකම්, විශ්ව විද්‍යාල සහ පුස්තකාල, රෝහල් සහ ඔසුසල්, කළා භවන් සහ පොදු ස්නාන ආගාර ද ඒවාට අමුත්තක් නොවීය. ඒ වනවිටත් මධ්‍යතන මුස්ලිම්වරු පුද්ගලික සනීපාරක්ෂාව සඳහා සබන්, රූපලාවන්‍ය ආලේපන සහ විලවුන් භාවිතයට හුරුව සිටියහ. අබ්බාසීය කාල පරිච්ඡේදය නියම වශයෙන්ම විද්‍යාව සහ නව සොයා ගැනීම් ඉහළ ජීවන තත්ත්වය සහ නවීන සමාජය සම්බන්ධව මුස්ලිම්වරුන්ගේ "ස්වර්ණමය යුගය" නියෝජනය කරයි.

කෙසේ වුවද, ක්‍රමයෙන් අබ්බාසි රාජවංශයේ බලය බිඳවැටුණු අතර, ඔටෝමන්වරුන් විසින් එම යුගය අවසන් කරමින් ක්‍රි.ව. 1517 වන විට ඔවුන්ගේම කලීෆතයක් පිහිටුවන ලදී. පෙර කල බයිසැන්ටියමේ නගරයක් වූ කොන්ස්තන්තිනෝපල් හි (වර්තමානයේ ඉස්තාන්බුල්) සිට රාජ්‍ය විචාරන ලද සුල්තාන් සුලෙයිමාන් හෙවත් "විශිෂ්ටතමයා" යටතේ ඔටෝමන් අධිරාජ්‍යය එහි උච්චතම අවධිය ළඟා කරගත්තේය. ඔහුගේ මරණය සිදු වූ කාලය වන විට, සම්පූර්ණ සිරියාව, ඊජිප්තුව, උතුරු අප්‍රිකාව, අරාබි අර්ධද්වීපය සහ නැගෙනහිර යුරෝපයේ බොහෝ කොටස් ඔහුග පාලනය යටතේ විය. ඔටෝමන් සුල්තාන්වරු එකල බලයේ සිටි අන් සියලු රාජ්‍යයන්ට සාපේක්ෂව.



තුර්කියේ ඉස්තාන්බුල් හි පිහිටි සුලෙයිමානියා දේවස්ථානය ඇතුළත

අතිවිශිෂ්ට කාර්යක්ෂම නිලධාරී තන්ත්‍රයක් මගින් අතිවිශාල අධිරාජ්‍යයක් පාලනය කළහ. එම සුල්තාන්වරු ඔවුන්ගේ අධිරාජ්‍යයේ විවිධ මූලිකාංග එක් සංස්කෘතියක් බවට බලෙන් පත්කිරීමට උත්සාහ නොකළහ; ඔවුහු වැඩිකොටම අන් මත ඉවසනසුළු, බහුත්වවාදීන් වූහ. විවිධ, වෙනස් කණ්ඩායම් සාමකාමීව එකට එක්ව ජීවත් විය හැකි, නමුත් තම තමන්ට අනන්‍ය මතවාද, සංස්කෘතීන්, නීති සහ ඔවුනොවුන්ගේ කණ්ඩායම්වලට අයත් සාමාජිකයන්ට හා නායකයන්ට පක්ෂපාතීව කටයුතු කළ හැකි ආකාරයේ කාර්යරාමුවක් සැපයීමට ඔටෝමන්වරු සමත් විය. චිරස්ථායී, සාර්ථක අධිරාජ්‍යයක් සියවස් හයක කාලයක් පුරා ස්ථාපනය කොට පවත්වාගෙන යාමට ඔටෝමන් පාලකයන්ට හැකියාව ලැබුණි. මුස්ලිම් නොවන වෙළෙන්දන්, මිෂනාරීන්, සෙබළු සහ යටත්විජිත පාලකයන් මුස්ලිම් ප්‍රදේශවල බලය පැතිරීම හේතුවෙන් දහහත්වන සියවසේ සිට විසිවැනි සියවස දක්වා යුරෝපියානු යටත්විජිත ව්‍යාප්තිය සිදු විය. පෘතුගීසින්, ස්පාඤ්ඤයන්, ලන්දේසීන්, බ්‍රිතාන්‍යයන්, සහ ප්‍රංශ ජාතිකයන් වැනි සංවර්ධිත යටත්විජිත අධිරාජ්‍යයන් මෙන්ම රුසියානුවන් සහ චීන ජාතිකයන් ද ඔවුන්ගේ බලප්‍රදේශ මුස්ලිම් බහුතරය වෙසෙන ප්‍රදේශ දක්වා පුළුල් කරන ලදී. එවැනි විදේශික බලපෑම් සහ බලාතික්‍රමණ බොහෝ මුස්ලිම්වරුන්ට බරපතල අවමානයක් ඇති කළා පමණක් නොව, යුරෝපියානු පාලකයන් විසින් සාම්ප්‍රදායික මුස්ලිම් අධ්‍යාපන, නීතිමය සහ ආණ්ඩුකරන ආයතන බටහිර පන්නයේ ආයතන මගින් ප්‍රතිස්ථාපනය කළ හෙයින්, ඉස්ලාමීය සමාජයක මූලික පදනමට ද තර්ජන එල්ල කළේ ය. යුරෝපීයයන් මුස්ලිම් බහුතරය ඇති ප්‍රදේශවල ආගමික ආචාර විධි පීඩාවට පමුණුවමින්, ක්‍රිස්තියානි ආභාෂයට, ඓහික සහ භෞතිකවාදී සංස්කෘතික වටිනාකම්වලට මුල්තැන දුන්නේය. විසිවැනි සියවස ආරම්භ වන විට අතිශය බෙලහීන ඔටෝමන් පාලනයක් විසින් රාජ්‍ය විචාරන ලද අතර, එය ද පළමු ලෝක යුද්ධයෙන් පසුව පරාජය කර, අහෝසි කර දමන ලදී. ඔටෝමන් අධිරාජ්‍යයේ බිඳවැටීමෙන් පසු බටහිර ඌරුවේ ඓහික ආකෘතිය පදනම් කරගෙන වර්තමානයේ ද පවතින තුර්කි ජනරජය ස්ථාපනය කරන ලදී. ඔටෝමන් සංයුක්ත රාජ්‍යයේ අනෙකුත් රටවල්වලට නිදහස ලබාදෙන ලදී.

වර්තමාන කාලයේ දී ඔවුන්ගේ සාම්ප්‍රදායික දෘෂ්ටිකෝණයන් ට නිතරම ප්‍රහාර එල්ල වෙද්දී වුවද, මුස්ලිම්වරුන්ගෙන් සාතිශය බහුතරයක් ඔවුන්ගේ සම්ප්‍රදායන් ආරක්ෂා කරගෙන ජීවත් වනු දක්නට ලැබේ. වර්තමාන ඉස්ලාමය අවබෝධ කරගැනීමට නම්, එකිනෙකට වෙනස් ආගම් සියල්ලම එකම ඓතිහාසික ගමන්මග අනුගමනය කළ යුතු නොවන බව මුලින්ම ප්‍රත්‍යක්ෂ කරගත යුතු වීම වැදගත් වේ. ප්‍රොතෙස්තන්ත වාදය බිහි වුණේ දහසය වැනි සියවසේ දී ක්‍රිස්තියානි ආගමිකයන් අතර ඇති වූ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය හරහා ය. කෙසේ වුවද, ඉස්ලාමය, නීතිමය වශයෙන් හෝ දේවධාර්මික වශයෙන් තවමත් එවැනි කැපීපෙනෙන පරිණාමනයක් අත්දැක

නැති අතර, එවැන්නක් සිදු වේයැයි බලාපොරොත්තු වීම ද අසීරු ය. එහි ආගමික දිවිය සහ සිතුවිලි ලෝක සම්මතයේත්, සම්ප්‍රදායේත් කාර්යරාමුව තුළම බොහෝ තරමින් රැඳී පවතී. ඉස්ලාමීය සමාජයේ සමහර අංශවල සහ සමහර ප්‍රදේශවල දක්නට ඇති නවීනත්වය සහ ඊනියා මූලධර්මවාදය නිසා සාම්ප්‍රදායික ඉස්ලාමීය ජීවන රටාව යම් පසුබෑමකට ලක්ව ඇතිමුත්, නබිතුමාගේ කාලයේ සහ ඉන්පසුව යහමඟ-ලත් කලීෆාවරුන් සිව්දෙනාගේ සමයේ ස්ථාපනය කළ එම සාම්ප්‍රදායික ජීවන රටාව අභියෝගයට ලක්කරන ආකාරයේ කිසිදු දේවධාර්මික හෝ නෛතික විශ්වීය දර්ශනයක් නිර්මාණය කිරීමට අපොහොසත්ව ඇත. සාතිශය බහුතරයක් වූ මුස්ලිම් ජනතාව තවමත් මුල්කාලීනව විස්තර කර ඇති සාම්ප්‍රදායික සිරිත් අනුගමනය කරන අතර, ඉස්ලාමයට අදාළ සිදුවීම්වලින් සාම්ප්‍රදායිකව අවබෝධ කරගත් පරිදි ඔවුන්ගේ ජීවිතවල රිද්මය හැසිරෙයි. තව ද, සාම්ප්‍රදායික අධ්‍යාපන හා නෛතික පද්ධතීන් වැනසීමට ලක්වූවත්, කුර්'ආනය, හදීස්, ෂරීආ වැනි සාම්ප්‍රදායික ඉස්ලාමීය විද්‍යාවන් සියවස් ගණනක් තිස්සේ පැවත එන ආකාරයට ම අඛණ්ඩව ක්‍රියාත්මක වේ.



එකම දෙවියා වන අල්ලාහ් ව නැමදීම සඳහා මෙලොව ඉදිකරන ලද ප්‍රථම ගෘහය මක්කාවේ පිහිටි කඃබාහ්වයි. (කුර්'ආනය 3:96)

# ඉස්ලාමයේ අර්ථය සහ එහි මූලික මූලධර්ම

ඔහුගේ අවසාන පණිවිඩකරුවා වන මුහම්මද් (ඔහුට අල්ලාහ්ගේ ආශිර්වාදය සහ සමාදානය අත්වේවා) විසින් අනාවරණ කළ පරිදි, මැවුම්කරුවාණන් වන අල්ලාහ්ගේ ඒකීයත්වය පිළිබඳ විශ්වාසය සහ ඔහුගේ අභිමතය සම්පූර්ණයෙන් පිළිගෙන ඊට අවනත වීම හරහා ඉස්ලාම් ආගම නිර්වචනය කෙරෙන්නේ ය.

එබැවින්, ඉස්ලාමය යනු අල්ලාහ්ගේ අභිමතය ට කැමැත්තෙන්, අවංකව සහ සාමකාමීව යටත් වීම යි. අල්ලාහ්ගේ අභිමතය ට යටත් වීම යන්නෙන් අදහස් කෙරෙන්නේ මැවුම්කරුවාණන්ට නමස්කාර කිරීම, භක්තිමත් වීම ශ්‍රද්ධාවෙන් පසුවීම වන අතර, මේවා දෙවියන් සමග, තමන් සමග, අනෙකුත් මැවීම් සමග සහ පරිසරය සමග සාමයෙන් - සමාදානයෙන් විසීම සඳහා වන පරිපූර්ණ තත්ත්වයන් ය. ඉස්ලාම් ආගම පිළිපදිමින් දෙවියන්ගේ කැමැත්ත විශ්වාස කරන සහ ඊට යටත් වන පුද්ගලයන් මුස්ලිම්වරු ලෙස හැඳින්වේ.

ඉස්ලාමය යනු නව ආගමක් නොවේ. එය ආදම්ගේ සිට නෝවා, ඒබ්‍රහම්, ඉශ්මායෙල්, ඉසාක්, මෙන්ම මෝසස්, ජේසුස් සහ අවසානයේ මුහම්මද් (ඔවුන් සියල්ලන්ටම දෙවියන් අල්ලාහ්ගේ සමාදානය සහ ආශිර්වාදය ලැබේවා) දක්වා වූ දෙවියන්ගේ සියලුම ශාස්තෘවරුන්ට පහළ කළ ආගමයි. අල්ලාහ්ගේ අභිමතයට පමණක් හිස නමමින්, ඔහුවම පමණක් පිළිගත් බැවින් මේ ශාස්තෘවරු (නබිවරු) සියල්ලෝම මුස්ලිම්හු වෙති.[2] එමෙන්ම, දෙවියන්ගේ සියලුම ශාස්තෘවරු හරහා ප්‍රචාරය කෙරුණු ආගම අනුගමනය කරන පුද්ගලයන් ද මුස්ලිම්වරු ලෙස හැඳින්වේ. 'ඉස්ලාම්' යන වචනයට උරුම අර්ථය අල්ලාහ් විසින් ශුද්ධ වූ අල්-කුර්ආනයේ යොදාගෙන ඇත්තේ මේ සන්දර්භයෙනි (3:19);

> දේව දර්ශනය ට අනුව ආගම යනු ඔහුගේ කැමැත්තට යටත් වීමයි (ඉස්ලාමය)

ඉස්ලාමය පදනම් වී ඇත්තේ විශ්වාසයේ (ඊමාන්) කොටස් හයක් සහ ආගමේ (ඉස්ලාම්) කොටස් පහක් මත ය. විශ්වාසය යනු යමෙකු අවබෝධයෙන් යුතුව අදහන දෑ වන අතර, එම විශ්වාසය ප්‍රායෝගිකව තහවුරු කරන්නේ ආගම යි. ආගම සඳහා විශ්වාසය අත්‍යවශ්‍ය බවට ඉස්ලාමය සලකයි, ඒ විශ්වාසය යනු, මැවුම්කරුවා සහ ඔහුගේ දිව්‍යමය බව, අධිපතිත්වය සහ අප ඔහුගේ ගැත්තන් කරගැනීමට ඔහුට අයිතිය හඳුනාගෙන පිළිගැනීම වන බැවිනි (අරාබියෙන් මේවා උළුහියියා, රුබබියියා සහ උබූදියියා ලෙස පිළිවෙළින් හැඳින්වේ).

# විශ්වාසයේ කොටස් හය

ශුද්ධ වූ අල්-කුර්ආනයේ බොහෝ වැකිවල විශ්වාසයේ කොටස් පිළිබඳව සටහන් කර ඇත.[3] උදාහරණයක් වශයෙන් 112 වන පරිච්ඡේදයේ දී විශ්වාසයේ පළමු කොටස පිළිබඳව අල්ලාහ් මෙසේ පවසයි:

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ

قُلْ هُوَ اللَّهُ أَحَدٌ * اللَّهُ الصَّمَدُ * لَمْ يَلِدْ وَلَمْ يُولَدْ *
وَلَمْ يَكُن لَّهُ كُفُوًا أَحَدٌ

(නබිවරය, ) පවසවු: සැබෑ විෂයය නම් අල්ලාහ් ඒකීය ය; අල්ලාහ් (සෙසු අය විසින්) සදා සරණ පතනු ලබන්නා වූ ද (කිසිදු) අවශ්‍යතාවක් රහිත වූ ද අයෙකි. ඔහු කිසිවෙකු ජනිත නොකළේය. ඔහු කිසිවෙකුගෙන් ජනිත කරනු ද නොලැබුවේය. තවද ඔහුට සමාන කිසිවෙකු නොවූයේමය.

පළමුවැනි කොටස

අල්ලාහ් හැර නැමදීමට සුදුසු වෙන කිසිවෙකුත් නැති බව විශ්වාස කිරීම. ඔහු ඒකයා ය, විශ්වයේ මැවුම්කරුවා ය, ඔහුගේ ලක්ෂණ ඔහුටම ආවේණික වන අතර, ඔහුගෙන් ඒවා ඉවත් කළ නොහැක, එමෙන්ම ඔහුට හවුල්කරුවන් අවශ්‍ය ද නොවේ. මෙම විශ්වාසය පිළිබඳ මූලධර්මය ඒකදේවවාදය යනුවෙන් හැඳින්වේ (අරාබි බසින් අත්-තවුහීද්).

විශ්වාසයේ මෙම කොටසෙහි ඇති වැදගත්කම: (a) මැවුම්කරුවාගේ ඒකීයත්වයෙන් ඇඟවෙන්නේ ඔහුගේ මැවීම් සඳහා වූ අරමුණේ ඒකීයත්වය සහ ආගමේ ඒකීයත්වය යි - ඉන් ජීවන මාර්ගයේ ඒකත්වය පිළිඹිබු වේ. මනුෂ්‍යයන් අතර බහුතරයක් ආධ්‍යාත්මිකව අපේක්ෂා භංගත්වයට සහ එකමුතුවක් නොමැති තත්ත්වයට පත්ව සිටින්නේ ජීවිතයේ අරමුණ පිළිබඳව ඒකීයත්වයක් නොමැති නිසාවෙනි. (b) දෙවියන්ට අනන්‍ය ලක්ෂණ අනෙකුත් ජීවින්ට හෝ දේවල්වලට ආදේශ කිරීමෙන් මිථ්‍යාවන් නිර්මාණය කෙරෙන අතර, ඉන් බිය, දූෂණය සහ සූරාකෑම් සඳහා මඟ විවර වේ.

දෙවැනි කොටස

අල්ලාහ්ගේ ආධ්‍යාත්මික සේවකයන් සහ නියෝජිතයන් වන දේවදූතයන්ව තරයේ විශ්වාස කොට පිළිගැනීම. දේවදූතයන් මිනිසුන් මෙන් නොවේ, ඔවුහු ආත්ම පමණක් වන අතර, භෞතික ශරීරයක් නැත. අල්ලාහ්ට සදාකාලිකව නැමදුම් කිරීම සහ ඔහුගේ අණ ක්‍රියාත්මක කිරීම ඔවුන්ගේ ස්වභාවය යි.

විශ්වාසයේ මෙම කොටසෙහි ඇති වැදගත්කම: භෞතිකව අපේ මනුෂ්‍ය අවබෝධයට එපිටින් ඇති දෑ විශ්වාස කිරීම ද විශ්වාසයේ එක් අවශ්‍ය අංගයකි. මෙම කොටස මඟින් අපට භෞතිකව ගෝචර නොවන මැවීම් අවබෝධ කරගැනීමටත්, ඒවා අගය කිරීමටත්, සහ ආධ්‍යාත්මික අවබෝධය හා ප්‍රඥාව වෙත මඟ හෙළිපෙහෙළි කිරීම සඳහා මනුෂ්‍යයාගේ බුද්ධිමය ධාරිතාව තවදුරටත් උසස් කරයි.

තුන්වැනි කොටස

අල්ලාහ්ගේ පණිවිඩකරුවන්ට අල්ලාහ් විසින් පහළ කළ වූ සියලු දෙනා දිව්‍යමය ග්‍රන්ථ හෝ ශුද්ධ වූ ලියැවිලි තරයේ විශ්වාස කොට පිළිගැනීම. උදාහරණ වශයෙන්, ඩේවිඩ් ට පහළ කළ පුස්තකය වන ගීතාවලිය (අරාබි බසින් සබූර්), මෝසස් ට පහළ කළ පුස්තකය වන ටෝරාව (අරාබි බසින් අත්-තවුරාත්), ජේසුස් ට පහළ කළ ශුභාරංචිය හෝ ධර්ම දූතිකය (අරාබි බසින් අල්-ඉන්ජීල්) සහ මුහම්මද් ට පහළ කළ කුර්ආනය (ඔවුන් සියල්ලන්ටම අල්ලාහ්ගේ සමාදානය හා ආශිර්වාදය ලැබේවා!).

විශ්වාසයේ මෙම කොටසෙහි ඇති වැදගත්කම: සෑම ආගමික ග්‍රන්ථයක්ම පහළ කර ඇත්තේ විශ්වාසය සහ සදාචාරය පිළිබඳ සමාන මූලික මූලධර්ම සහිතව එකම මැවුම්කරුවා විසින් නිසා මෙය තාර්කික මූලධර්මයකි. එක් ආගමික ග්‍රන්ථයක් විශ්වාස කරන අතරතුර අනෙක්වා ප්‍රතික්ෂේප කිරීම එකිනෙකට පරස්පර වන තත්ත්වයකි. මැවුම්කරුවා විසින් මනුෂ්‍යයන් වෙත එකිනෙකට වෙනස් හා පටහැනි පණිවිඩ එවයි යනුවෙන් සිතීම ද අතාර්කික යි පෙර සිටි දේව පණිවිඩකරුවන්ගේ පණිවිඩ යැයි වර්තමානයේ වටහාගෙන සිටිනමුත් ඇත්තටම මිනිසුන් විසින් ඒවාට පසුකාලීනව කළ වෙනස්කම් නැවත නිවැරදි කරමින්, මනුෂ්‍යයන් වෙත දෙවියන් එවන පණිවිඩය පෙර කාලයේ පහළ කළ ආගමික ග්‍රන්ථවලින් සම්පූර්ණ කරන බව කුර්'ආනය මඟින් තහවුරු කරයි.

සිව්වැනි කොටස

ආදම්ගේ සිට අල්ලාහ්ගේ අවසාන පණිවිඩකරු මුහම්මද් (ඔවුන්ට අල්ලාහ්ගේ සමාදානය හා ආශිර්වාදය ලැබේවා!) දක්වා අල්ලාහ්ගේ පණිවිඩකරුවන් වූ

සියලු දෙනාවම විශ්වාස කොට පිළිගැනීම.

විශ්වාසයේ මෙම කොටසෙහි ඇති වැදගත්කම: සෑම පණිවිඩකරුවෙකුම එවන ලද්දේ එකම මැවුම්කරුවා විසින් නිසාත්, ඔවුන් මනුෂ්‍යයන් වෙනුවෙන් ප්‍රචාරය කළේ එකම මූලික පණිවිඩය නිසාත්, මෙය ද තාර්කික මූලධර්මයකි. එක් පණිවිඩකරුවෙකුව විශ්වාස කරමින්, අනෙක් අය ප්‍රතික්ෂේප කිරීම එකිනෙකට පරස්පර වන තත්ත්වයක් පමණක් නොව, දෙවියන් විසින් පහළ කළ ආගමේ බෙදීම් ද ඇති කරයි.

පස්වැනි කොටස

විනිශ්චය දිනය ගැන විශ්වාස කොට පිළිගැනීම. දේවදූතයන් මෙන් නොව, මනුෂ්‍යයන් සඳහා තෝරාගැනීමේ නිදහසක් ලබා දී ඇත: එනම් යම් පුද්ගලයෙකුට අල්ලාහ්ගේ අණ පිළිපැදීමට හෝ නොපිළිපැදීමට තෝරාගත හැකි කෙසේ වුවත්, මෙම නිදහස අල්ලාහ්ට වගකීමට සහ වගවීමට යටත් වේ. විනිශ්චය දිනයේ දී අප විසින් මේ ජීවිතයේ දී කළ තෝරාගැනීම් සඳහා වගවිය යුතුය. නිවැරදි තේරීම් කරමින් දෙවියන්ගේ පණිවිඩය අනුගමනය කළ පුද්ගලයන් ස්වර්ගයට පිවිස සදාකාලිකව එහි විසීමේ භාග්‍යය උදා කරගන්නා අතර, වැරදි තේරීම් කරමින් දෙවියන්ගේ පණිවිඩය ප්‍රතික්ෂේප කළ පුද්ගලයන් නරකාදියට පිවිස සදාකාලිකව එහි විසීමේ අභාග්‍යය ලබති.

විශ්වාසයේ මෙම කොටසෙහි ඇති වැදගත්කම: මෙම කොටසෙන් දෙවියන් සඳහා සහ මේ ලොවේ අප විසින් කළ ක්‍රියාවන් සඳහා වගවීම පිළිබඳව අඟවයි. නියම යුක්තිය සහ සදාකාලික සැපත සඳහා වන අපේ අභිරුචීන් සහ අපේක්ෂාවන් මුදුන්පත් කරගත හැකි වන්නේ සත්‍ය සහ නිරපේක්ෂ දිව්‍යමය යුක්තිය විනිශ්චය දිනයේ දී ස්ථාපිත වන විටයි.

හයවැනි කොටස

දේව නිර්ණනය සහ ඉරණම හෙවත් සියල්ල සිදුවන්නේ දෙවියන්ගේ පෙර සැලසුම හා අනුමැතිය මත බව විශ්වාස කොට පිළිගැනීම: මැවුම් සම්බන්ධයෙන් සිදුවන සියලු දෑ (හොඳ, නරක හා නොවැදගත්) අල්ලාහ් විසින් ඔහුගේ අනන්ත වූ ඥානය සහ දැනුම උපයෝගී කොටගෙන, ඔහු පෙර සැලසුම් කළ පරිද්දෙන් ඔහුගේම නීති සහ පරිමාණ හරහා (අරාබි බසින් කළා ව කද්ර්) සිදුකරන බව මෙහිදී කියැවේ. මෙලෙස පැනවී ඇති නීති (භෞතික සහ ආධ්‍යාත්මික) සහ නියමිත පරිමාණ (එනම්: කුමන තරමට ද යන්න) නිසා මැවුම්වලින් කිසිවක් අල්ලාහ්ගේ පාලනයෙන් බැහැර නොවේ. එමෙන්ම, එම නීති සහ පරිමාණ මත අල්ලාහ්ගේ පරම පාලනයක් ක්‍රියාත්මක වනවා පමණක් නොව, ඔහු මෙලොව මැවූ කාලයත්, අවකාශයත් ඇතුළුව සියල්ල ගැන අපරිමිත දැනුමක් ඇත්තා වන හෙයින්,

අතීතය, වර්තමානය සහ අනාගතය ගැන සියල්ලම සටහන් කර තබා ඇත. කුර්'ආනයේ 6:59 හි මෙසේ සඳහන් වී තිබේ.

> තවද ගුප්ත දැහි යතුරු ඔහු සතුව ඇත. ඔහු හැර (අන්) කිසිවෙකු ඒවා නොදනියි. තවද ඔහු ගොඩබිමෙහි හා සාගරයෙහි ඇති දෑ දන්නේය. (ගසක) කොළයක් බිම වැටෙන්නේ නැත, ඔහු එය දැනගෙන සිටියේ නම් මිස. මිහිතලයේ (පතුලේ ඇති) අන්ධකාරයන්හි වූ බීජයක් වුවද තෙත්වූවක් වුව ද වියළිවූවක් වුව ද (එය) පැහැදිලි වූ (ලව්හුල් මහ්ෆූල් නැමැති) පුස්තකයෙහි (සඳහන් වී) මිස නැත.

මිනිස් ජීවිතයේ ගලායාම පමණක් නොව, එහි උස්-පහත් වීම් ද අල්ලාහ් සතු අපරිමිත දැනුමට අන්තර්ගත වේ. එහෙත්, යම් පුද්ගලයෙකු විසින් යම් ක්‍රියාවක් කිරීම පිළිබඳව අල්ලාහ් පූර්වයෙන් දැනසිටීම, එම පුද්ගලයා එම ක්‍රියාව කිරීම සඳහා වන බලපෑමක් නොවේ - මීට සමාන උදාහරණයක් ලෙස තාරකා විද්‍යාඥයන් ඔවුන්ගේ විද්‍යාත්මක දැනුම භාවිතා කර, සූර්යග්‍රහණ පිළිබඳව වසර ගණනකට පෙර පුරෝකථනය කරමින් ඒ පිළිබඳව වාර්තා කිරීම දැක්විය හැක. නමුත් මතක තබාගත යුතු කරුණ නම් එම සූර්යග්‍රහණ ඇතිවන්නේ ඔවුන්ගේ දැනුම හෝ පුරෝකථන නිසා නොවන බවයි. එසේම, (යම් කාලයකට හෝ අවකාශයකට සීමිත නොවන) අනන්තයක් වූ දැනුම හිමි අල්ලාහ්, මනුෂ්‍යයන් කුමක් කරයිද යන්න දැනසිටින අතර, ඔවුන්ගේ ක්‍රියාවන් ගැන වාර්තාවන් තබාගනී, නමුත් එමඟින් අදාළ පුද්ගලයන් එම ක්‍රියාවන් එලෙසින්ම කළ යුතු බව අදහස් නොවේ.

එබැවින්, ඉහත කී මූලධර්ම මඟින් මිනිසාට ලබා දී ඇති තෝරාගැනීමේ නිදහස නිශේධනය නොකරයි; ඉන් සරලවම අදහස් කරන්නේ අපේ තෝරා ගැනීම් සඳහා වන ක්‍රම සහ විධි සෑමවිටම (a) අල්ලාහ්ගේ නීති, (b) අපේ තෝරාගැනීම් සඳහා වන ප්‍රතිඵල දිව්‍යමය සැලසුම් හා සමපාත වන බව සහ (c) අපේ තෝරාගැනීම් සහ ක්‍රියාවන් ගැන අල්ලාහ්ට පූර්ව දැනුමක් ඇති බවත්, නමුත් අපි අපේ තෝරාගැනීම් සඳහා වගවීම අනිවාර්ය වේ.[4] තවද, මනුෂ්‍ය ජීවීන්ට තෝරාගැනීම සඳහා නිදහස තිබෙන අතර, ඔවුන් ඔවුන්ගේ තෝරාගැනීම් සහ ක්‍රියාවන් සඳහා වන නියෝජිතයන් වේ, නමුත් ඔවුන්ට ඔවුන්ගේ එවැනි තෝරාගැනීම් පවරාගැනීම සඳහා මැවුම්කාර බලයක් නැත.

> "නුඹලාව ද නුඹලා අඹමින් සිටි දැය ද අල්ලාහ් මවා තිබිය දී නුඹලා(ගේ දෑතින්ම) නෙළූ දෑ නුඹලා නමදින්නෙහු දැ"යි ඔහු විමසුවේ ය. අල්-කුර්'ආන් (37:96)

මෙයින් අදහස් කරන්නේ මිනිසාගේ තෝරාගැනීමේ නිදහස සම්බන්ධයෙන් අල්ලාහ් "මිනිස් කැමැත්ත" "දිව්‍ය කැමැත්තට" හෝ මිනිස් ක්‍රියාවන්ට

අදාළ ඇතැම් ක්‍රියාවන්හි දිව්‍යමය ආරම්භයට පූර්ව කොන්දේසියක් බවට පත් කර ඇති බවයි. වෙනත් වචන වලින් කිවහොත්, මිනිසුන් එම ක්‍රියාවන් සඳහා ප්‍රාර්ථනා කරන අතර අල්ලාහ් ඒවා ඉටු කරයි (ඔහු ඒවා ඉටු කිරීමට තීරණය කරන්නේ නම්). අල්ලාහ්ගේ "දිව්‍ය කැමැත්ත" තුළ " මිනිස් කැමැත්ත" ක්‍රියාත්මක වන්නේ එලෙසයි. යහපත හා අයහපත යන දෙකෙහිම නිර්මාණාත්මක කොටස අල්ලාහ්ට අයත් යැයි පැවසිය හැකිය. එහෙත්, නපුර නිර්මාණය වී ඇත්තේ මිනිස් තේරීමේ ප්‍රතිඵලයක් ලෙසය - එය මිනිසාගේ ස්වාධීන කැමැත්ත භාවිතා කිරීම හෝ අනිසි ලෙස භාවිතා නොකිරීමේ ප්‍රතිඵලයකි. අල්ලාහ් ක්‍රියාවන් හා එහි ප්‍රතිඵල නිර්මාණය කරයි.

> (නබිවරය) නුඹට යම් යහපතක් ඇති වුයේ නම් එය අල්ලාහ්නේ ය. නුඹට යම් අයහපතක් ඇති වුයේ නම් එය නුඹගෙන්මය. අල්-කුර්’ආන් (4:79)

අල්ලාහ්ගේ දෘෂ්ටිකෝණයට අනුව, නපුර මැවීම හෝ නපුර සිදුවීමට ඉඩහැරීම ඔහුගේ නපුරු බව නොවනමුත්, නපුර තෝරාගැනීම ම නපුරකි. දෙවියන් නපුර තෝරානොගන්නා අතර, එසේ කරන්නේ මිනිසුන් ය.

විශ්වාසයේ මෙම කොටසේ වැදගත්කම: මැවුම්කරු අල්ලාහ් සතුව මැවීම්වල සම්පූර්ණ පාලනය සහ ආණ්ඩුකරණය ඇති බව විශ්වාස කිරීමෙන් මැවීම්වලට ඉහළින් ඔහුගේ ස්වෛරීත්වය ඇති බවට වන අපේ විශ්වාසය තහවුරු කරයි. මෙම කොටස මඟින් ඔහුගේ මැවීම් සඳහා අල්ලාහ් පෙන්වන කාරුණිකත්වය සහ රැකවරණය දීම පිළිබඳ ඔහුගේ ගුණාංග හරහා අපේක්ෂාව සහ අභ්‍යන්තර සාමය අප තුළ තහවුරු කර, විශ්වාසිකයන්ගේ හදවත් ශක්තිමත් කරයි.

විශ්වාසයේ මෙම මූලධර්ම හය හරහා ආධ්‍යාත්මික අවබෝධය සහ ප්‍රඥාව කරා මනුෂ්‍ය බුද්ධිය මෙහෙයවයි. තවද, ඒවායින් "විශ්වාසිකයා" යන්න තවදුරටත් සම්පූර්ණ අර්ථයකින් නිර්වචනය කරයි; එක් නබිවරයෙක් විශ්වාස කරන අතරතුර අනෙක් අය ප්‍රතික්ෂේප කිරීම වැනි ආකාරයෙන් මින් එක් මූලධර්මයක් හෝ විශ්වාස කිරීම පැහැර හැරීම මඟින් යම් පුද්ගලයෙකු නිතැතින්ම "අවිශ්වාසිකයෙකු" බවට පත් වේ.

# නැමදුම් සඳහා කෙරෙන ඇමතීම

උසස්තමයා අල්ලාහ් වන්නේ ය, උසස්තමයා අල්ලාහ් වන්නේ ය,

උසස්තමයා අල්ලාහ් වන්නේ ය, උසස්තමයා අල්ලාහ් වන්නේ ය,

අල්ලාහ් හැර නැමදුමට ලක්වීමට සුදුසු වෙන කිසිවෙක් නැත්තේය යන්නට මම සාක්ෂි දරමි,

අල්ලාහ් හැර නැමදුමට ලක්වීමට සුදුසු වෙන කිසිවෙක් නැත්තේය යන්නට මම සාක්ෂි දරමි,

මුහම්මද් දෙවියන්ගේ පණිවිඩකරුවා ය යන්නට මම සාක්ෂි දරමි,

මුහම්මද් දෙවියන්ගේ පණිවිඩකරුවා ය යන්නට මම සාක්ෂි දරමි,

නැමදීම සඳහා පැමිණෙන්න, නැමදීම සඳහා පැමිණෙන්න,

සාර්ථකත්වය වෙත පැමිණෙන්න, සාර්ථකත්වය වෙත පැමිණෙන්න,

උසස්තමයා අල්ලාහ් වන්නේ ය, උසස්තමයා අල්ලාහ් වන්නේ ය,

අල්ලාහ් හැර නැමදුමට ලක්වීමට සුදුසු වෙන කිසිවෙක් නැත්තේය.

නැමදුම් සඳහා කෙරෙන ඇමතීම මඟින් මිනිසුන්ට සර්වකාලීන සාර්ථකත්වය අත්කර ගැනීමට ආරාධනා කරයි. අල්ලාහ් හැර නැමදුමට ලක්වීමට සුදුසු වෙන කිසිවෙක් නැත්තේය යන්න ගැන සහ මුහම්මද්, ඔහුට අල්ලාහ්ගේ ආශිර්වාදය සහ සමාදානය හිමි වේවා, අල්ලාහ්ගේ පණිවිඩකරුවා ය යන්න ගැන එය අඛණ්ඩ මතක් කිරීමක් ව පවතියි.

# ආගමේ කොටස් පහ

ආගමේ කොටස් පහ පිළිබඳව කුර්ආනයේ විවිධ වාක්‍යයන් මඟින් දක්වා ඇත.[5] උදාහරණයක් ලෙස, පළමුවැනි කොටස සම්බන්ධයෙන් කුර්ආනයේ 49:15 හරහා අල්ලාහ් මෙසේ පවසයි.

إِنَّمَا الْمُؤْمِنُونَ الَّذِينَ آمَنُوا بِاللَّهِ وَرَسُولِهِ ثُمَّ لَمْ يَرْتَابُوا وَجَاهَدُوا بِأَمْوَالِهِمْ وَأَنفُسِهِمْ فِي سَبِيلِ اللَّهِ ۚ أُولَٰئِكَ هُمُ الصَّادِقُونَ

නියත වශයෙන්ම සැබෑ විශ්වාසිකයින් අල්ලාහ් සහ ඔහුගේ පණිවිඩකරුවා විශ්වාස කර, ඉන්පසුව ඒ ගැන සැක පහළ නොකර, තම ධනයෙන් ද තම දිවියෙන් ද අල්ලාහ්ගේ මාර්ගයේ සටන් කළ අය යි. සැබෑ සත්‍යවාදීහු මොවුන්ම යැ.

පළමුවැනි කොටස

අල්ලාහ් හැර නැමදුමට ලක්වීමට සුදුසු වෙන කිසිවෙක් නැත්තේය සහ මුහම්මද් අල්ලාහ්ගේ පණිවිඩකරුවා ය යන ප්‍රකාශය හදවතෙහි සහ මනසෙහි තහවුරු කිරීම. මෙම ප්‍රකාශය මඟින් මැවුම්කරුවාගේ ඒකීයත්වය පිළිබඳ විශ්වාසය (ඒකදේවවාදය) සහ මුහම්මද් නබිතුමා (ඔහුට සමාදානය සහ දේවාශිර්වාදය ලැබේවා) දෙවියන්ගේ අවසන් පණිවිඩකරුවා බව තහවුරු කරයි. මෙය ෂහාදාව නම් අරාබි වචනයෙන් හඳුන්වන අතර, එය ප්‍රකාශිත සත්‍යය සහතික කිරීම, ඒ වෙනුවෙන් පෙනීසිටීම සහ එය ස්ථාපනය කිරීම යන තේරුම් දෙයි.

සිය විශ්වාසය පිළිබඳව ප්‍රකාශ කළ පසු, එම විශ්වාසයට තමන්ගේ ඇති ප්‍රායෝගික බැඳීම තහවුරු කරනු වස් යම් මුස්ලිම්වරයෙක් පහත දැක්වෙන ආගමික කොටස් ඉටුකිරීම සඳහා බැඳී සිටී.

දෙවැනි කොටස

දවසේ වේල් පහක දී අල්ලාහ් වෙනුවෙන් නැමදුම් ඉටුකිරීම (අරාබි බසින් සලාහ්); පාන්දර, මධ්‍යහ්නයේ, දිවා කාලය අවසානයේ, හිරු බැසයාමෙන් පසු සහ රාත්‍රියේ දී. දේව නැමදුම යනු අතරමැදියන් නොමැතිව අල්ලාහ් සමග කරන ඍජු සන්නිවේදනයක් වන අතර, ඊට අල්ලාහ්ට ප්‍රශංසා කිරීම මෙන්ම අපේ යාඥාවන් ඔහු වෙත ඉදිරිපත් කිරීම ද ඇතුළත් වේ.

ආගමේ මෙම කොටස සම්බන්ධ වැදගත්කම: නැමදුම යනු ඔහු ගැන ආවර්ජනය කිරීමක් මෙන්ම ඔහුට අකීකරු වීමෙන් ආරක්ෂා කරන්නක් ලෙස අල්ලාහ් විස්තර කරයි (කුර්ආනයේ 20:14 සහ 29:45). එනිසා, නිතිපතා නැමදුම් කිරීම මගින් දෙවියන් පිළිබඳව සවිඥානිකත්වය අඛණ්ඩව පවත්වාගෙන වැඩිදියුණු කළ හැක (අරාබි බසින් තක්වා).[6]

තුන්වැනි කොටස

දුප්පත් සහ උදව්-උපකාර අත්‍යවශ්‍ය අයට පුණ්‍යාධාර ලබාදීම (අරාබි බසින් ස'කාහ්). සෑම මුස්ලිම්වරයෙකුම එක් වසරක් තුළ තමන්ගේ පාවිච්චියට නොගත් ඉතුරුම් මුදල්, රිදී සහ රන් වැනි පුද්ගලික ධනයෙන් 2.5% ක් ගෙවිය යුතුය. කෘෂිකාර්මික ඵලදාව, වෙළඳපොළ කොටස් වැනි දෑ සඳහා ද පුණ්‍යාධාර ගෙවීම අනිවාර්ය වේ.

ආගමේ මෙම කොටස සම්බන්ධ වැදගත්කම: ස'කාහ් ගෙවීම මගින් සමාජය තුළ ධනය බෙදා දීම මෙන්ම දුප්පත්කම, ඊර්ෂ්‍යාව සහ ක්‍රෝධය මුලිනුපුටා දැමීම තහවුරු කරයි. 'ස'කාහ් යන වචනයේ තේරුම 'පාරිශුද්ධ කිරීම'යන්නයි, එනයින් දෙවියන්ගේ අනුග්‍රහයෙන් එමගින් අප උපයාගත් ධනය සහ අපේ ආත්ම පිරිසිදු කරයි.

සිව්වැනි කොටස

ඉස්ලාමීය චන්ද්‍ර දින දර්ශනයේ නවවන මාසය වන රමළාන් මාසය පුරා උදෑසන සිට හිරු බැසයෑම දක්වා නිරාහාරව උපවාසයේ යෙදීම. දිවා කාලයේදී මුස්ලිම්වරයෙකු ආහාර ගැනීම, මත්පැන් පානය කිරීම සහ ලිංගක ක්‍රියාකාරකම් වලින් වැළකී සිටිය යුතු අතර, ආගම තුළ තහනම් කර ඇති දේ වන ඕපාදූප කියවීම, බොරු සාක්ෂි දැරීම වැනි දේවලින් වැළකී සිටිය යුතුය.

ආගමේ මෙම කොටස සම්බන්ධ වැදගත්කම: උපවාසයේ යෙදීම යනු කෙනෙකුගේ අධිෂ්ඨානය, ඉවසීම සහ අවසානයේදී කෙනෙකුගේ විශ්වාසය සහ දෙවියන් පිළිබඳව සවිඥානිකත්වය (තක්වා) වර්ධනය කිරීමට සහ ශක්තිමත් කිරීමට උපකාරී වන පුහුණුවකි. දිනකට එක් ආහාර වේලක්වත් ලබා ගත නොහැකි, අපට වඩා අඩු වරප්‍රසාද ලබන පුද්ගලයින් ගැන මතකයේ රඳවාගැනීමට ද එය උපකාරී වේ.

පස්වැනි කොටස

ජීවිතයේ එක්වරක් හෝ මූල්‍යමය හා ශාරීරික ශක්තිය ඇති අය මක්කාහ්වට වන්දනාවේ යාම (අරාබි බසින් හජ්).



මක්කාහ්වේ ඒබ්‍රහම්ගේ ස්ථානය (මකාම් ඉබ්‍රාහීම්) යනුවෙන් හැඳින්වෙන, ඒබ්‍රහම් (ඔහුට සමාදානය ලැබේවා) කාබාහ්ව ගොඩනැගීමේදී සිටගෙන සිටි ස්ථානය.

ආගමේ මෙම කොටස සම්බන්ධ වැදගත්කම: වන්දනාව යනු ලොව වටා සිටින මුස්ලිම්වරු එකට එක්වන මහා වාර්ෂික රැස්වීමකි. එය මනුෂ්‍ය වර්ගයාගේ එකමුතුකම සහ ආගමේ එකමුතුකම සනාථ කිරීමක් සහ ආදර්ශනය කොට පෙන්වීමකි. දෙවියන් වහන්සේ ඒකීය වේ, මනුෂ්‍යත්වය ද, ඔවුන්ගේ ආගම ද එකක්ම වේ. වන්දනාව යනු අල්ලාහ්ට නැමදුම් කරන එක් ආකාරයක් වන අතර, අල්ලාහ්ව උත්කර්ෂයට නැංවීමක් ද වේ - එපමණක් නොව ඒබ්‍රහම් සහ ඉශ්මායෙල් (අල්ලාහ්ගේ සමාදානය සහ ආශිර්වාදය ඔවුන්ට ලැබේවා) යන ශාස්තෘවරුන්ගේ නැමදුම් විධි සහ කැපකිරීම් ස්මරණය කෙරෙන අවස්ථාවක් ද වේ.

**ආගමේ මෙම මූලධර්ම මගින් මුස්ලිම්වරුන්ගේ හදවත් සහ මනැස් ආධ්‍යාත්මික විඥානය සහ සංවර්ධනයෙන් පොහොසත් කර, ලෞකික අවශ්‍යතා සහ භෞතිකවාදයෙන් වියුක්ත කරයි. වෙනත් වචනවලින් පවසන්නේ නම්, ඒවා මගින් අපව අපේ පැවැත්මේ භෞතිකවාදී මානයෙන් ආධ්‍යාත්මික මානය දක්වා උසස් කර, අප විසින් අඛණ්ඩව මැවුම්කරුවා පිළිබඳව, ඔහුට අපේ ඇති වගවීම් සහ යුතුකම් පිළිබඳව මෙන්ම මනුෂ්‍යත්වය හා සබැඳි අපේ වගකීම් පිළිබඳවත් මෙනෙහි කරන බව තහවුරු කරයි.**



ඕමානයේ මස්කට් හි සුල්තාන් අල් ඛබූස් ප්‍රධාන දේවස්ථානයේ මිනරතයේ දර්ශනයකි. අතීතයේ දී නම්, නැමදුම සඳහා වන ආරාධනාව කිරීමට අවශ්‍ය උස් ස්ථානය මිනරතය මගින් සැපයුණි. වර්තමානයේ දී මුස්ලිම් දේවස්ථානයක් හඳුනාගත හැකි ගෘහ නිර්මාණ ශිල්ප කොටසක් ලෙස ඒවා භාවිතයට යොදාගැනේ.

# අල්ලාහ්ගේ ස්වභාවය සහ ගුණාංග - මැවුම්කරුවා

සෑම පුද්ගලයෙකුටම නමක් ඇත්තා සේ ම, විශ්වයේ මැවුම්කාරයා සහ අධිපතියා ද ඔහුගේ පෞද්ගලික නම වන "අල්ලාහ්" නමින් හැඳින්වේ. ස්ත්‍රී-පුරුෂ සමාජභාවී, බහු තේරුම් හෝ කොහෙන්වත් උපුටාගත් හෝ උත්පාදනය නොකළ එය සුවිශේෂී, ආවේණික නමකි. අල්ලාහ්ට ස්ත්‍රී හෝ පුරුෂ භේදයක් ඇත්තේ නොවේ. ඔහු මවකට හා/හෝ පියෙකුට දාව උත්පාදනය නොවූයේ ය. ඔහුට පිටපත් හෝ අනුරූප නැත - ඔහු කිසිවෙකුට සමාන නොවීල. අසමගාමීව සිටියි. ඔහුගේ තත්ත්වය කොතරම් නොකිලිටි හා නොබෙදී ඇත්ද යත්ල. අල්-වාහිද් හෙවත් එකම ඒකයා ලෙස සැලකිය හැකි තරමේ වටිනාකමක් ඇත්තේ ඔහුටම පමණි. අල්ලාහ් සුවිශේෂී ය. එබැවින්:

1. අල්ලාහ්ට (a) ඔහුගේ ස්වාධීන පැවැත්ම, ස්වයං-යැපීම, ආරම්භයක් හෝ අවසානයක් නොතිබීම වැනි ආවේණික උත්තරීතර ලක්ෂණ තිබීම, (b) ඔහුගේ ස්වභාවය සහ අපරිමිත හැකියාවන්, උදා. ඔහු ඔහුගේ මැවීම් මෙන් නොවීම, ඔහු සදාකාලික ය, ජීවය දෙන්නාය, ඔහු සියල්ලටම සවන් දෙයි - සියල්ල දකියි, එම හැකියාවන් ඔහුගේ මැවීම් තුළ සක්‍රීයක කිරීම, වැනි ආවේණික ලක්ෂණ නිසා ඔහුව සන්සන්දනය කළ නොහේ. ඔහු සියලු බලයෙන් අනූන වන අතර, ඔහුගේ අභිරුචියම බලපවත්වයි - එවැනි ගුණාංග රාශියකි. මේ සියලුම ගුණාංග ඔහුට ආවේණික අතර, වෙන කිසිවෙකුට ඒවා නොපිහිටයි.

2. ඔහුගේ ලක්ෂණ විස්තරාත්මකව විදහා දක්වන ආකාරයෙන් අල්ලාහ් සතු අලංකාර නාම රාශියකි. මෙම නම් අතරට මහා කාරුණිකයා, සමාව දෙන්නා, සර්වකාලීන සානුකම්පිතයා, ඉහළම බුද්ධිමතා ආදිය ඇතුළත් වේ.

3. අල්ලාහ්ගේ දිව්‍යමය බව, අධිපතිත්වය සහ අප ඔහුගේ ගැත්තන් කරගැනීමට ඔහුට අයිතිය, (අරාබි බසින් උළුහියියා, රුබූබියියාහ් සහ උබූදියියාහ්) වෙන කිසිදු ජීවි-අජීවී දෙයක් සමග බෙදාගැනීමට හෝ ලබාගැනීමට නොහැක.

4. මේ උත්කර්ෂවත් දිව්‍යමය බව සමගින්, අල්ලාහ් යන නමෙහි තේරුම වන්නේ අපේ පූර්ණ අවනත බව හා ආදරය ලැබිය යුතු සහ අපට පූර්ණ ආරක්ෂාව හා පිහිට ලබාදෙන ඒකයා ඔහු බවයි.

ඒ අනුව, අල්ලාහ්ගේ නමෙහි අර්ථය සැබෑ ඒකදේවවාදය නිර්වචනය කරයි. තවද, ඔහුගේ නමෙහි ඇති මෙම ප්‍රබල අර්ථය නිසා ඔහුව විස්තර කිරීමට දෙවියන් යන වචනය ප්‍රමාණවත් නොවනමුත්, ඉස්ලාමීය සාහිත්‍යයේ මෙම වචන දෙකම එක හා සමාන අර්ථවලින් භාවිතා වේ.

විශ්වයේ සහ එහි සියලුම මැවීම්වල නිර්මාපකයා සහ පවත්වාගෙන යන්නා වන අල්ලාහ් ඔහු වෙනුවෙන් අප තුළ ඇති කෘතඥතාව තහවුරු කරනු වස් ඔහු පිළිබඳ අපගේ දැඩි විශ්වාසය සහ අවනත වීම අපේක්ෂා කරයි. අල්ලාහ්ගේ ස්වභාවය, ලක්ෂණ සහ අලංකාර නාම ප්‍රතික්ෂේප කිරීම හෝ ඒවා ඔහුගේ වෙනත් මැවීමක් සමග සමපාත කිරීම (අරාබි බසින් ෂිර්ක් යනුවෙන් හැඳින්වෙන) ඔහුට එරෙහිව කරන බරපතල අකෘතඥතාවක් වන අතර, යමෙකු ඒ පිළිබඳව පසුතැවිලි වූවොත් මිස, එය අල්ලාහ් විසින් කිසිකලෙක සමාව නොදෙන බරපතලම පාපය යි. අල්ලාහ් කුර්ආනයේ 4:48 හි මෙසේ පවසයි.

> සැබැවින්ම අල්ලාහ් තමන්ට ආදේශ තබනු ලැබීමට සමාව නොදෙන්නේමය. එය නොවන දෑ සඳහා ඔහු කා හට අභිමත කරන්නේ ද ඔහුට සමාව දෙන්නේය. කවරෙකු අල්ලාහ්ට ආදේශ තබන්නේ ද ඔහු මහත් වූ පාපයක් ඇති කළෙහිය.



කෝර්දෝබාවේ විශිෂ්ට දේවස්ථානය සහ මෙස්කිටාව ලෙස ද හැඳින්වෙන කෝර්දෝබා මුස්ලිම් දේවස්ථාන - ආසන දෙව්මැදුර, එහි සමයානුකූල නම වන අප ස්වර්ගාරෝපිත දේවමාතාවන්ගේ ආසන දෙව්මැදුර යනුවෙන් ද හැඳින්වෙන අතර, එය කෝර්දෝබා දියෝකීසයේ කතෝලික ආසන දෙව්මැදුර යි. එහි ව්‍යුහය යෝනක ගෘහ නිර්මාණ ශිල්පයේ එක් අග්‍රගණ්‍ය ස්මාරකයක් ලෙස අදටත් සැලකේ.

## මුහම්මද් නබිතුමා - ඔහුගේ ජීවිතය සහ පුද්ගල විශේෂතාව

මුහම්මද් (අල්ලාහ්ගේ සමාදානය හා ආශිර්වාදය ඔහුට ලැබේවා), සියලුම මනුෂ්‍ය වර්ගයා සඳහා අල්ලාහ් විසින් එවනු ලැබූ ශාස්තෘවරයෙකි. මුහම්මද් නබිතුමා මෙන්ම, නෝවා, ඒබ්‍රහම්, මෝසෙස් සහ ජේසුස් ඇතුළු තවත් ශාස්තෘවරු රාශියක් (අල්ලාහ්ගේ සමාදානය හා ආශිර්වාදය ඔවුන්ට ලැබේවා) අල්ලාහ් විසින් එවන ලදී. මේ සෑම ශාස්තෘවරයෙකුම නිශ්චිත කාලසීමාවක් හා නිශ්චිත ජාතියක් වෙනුවෙන් එවන ලදී. මුස්ලිම්වරු අල්ලාහ් විසින් එවන ලද සියලුම ශාස්තෘවරුන්ව විශ්වාස කරන අතර, ඔවුන්ව පිළිගනිති, ගෞරව කරති. මුස්ලිම්වරු මුහම්මද් නබිතුමාව ඉතාම ඉහළතම ගරුත්වයෙන් යුතුව සලකන්නේ ඔහු සකල මනුෂ්‍ය වර්ගයා වෙනුවෙන්ම වූ සදාකාලික හා පාරිශුද්ධ වූ විශ්වීය පණිවිඩය හෙළිදරව් කිරීම සඳහා එවන ලද අන්තිම ශාස්තෘවරයා වන බැවිනි.[7]

ඔහුගේ පෙළපත

මුහම්මද් නබිතුමා යනු අරාබි ජාතිකයෙක් වන අතර, ඒබ්‍රහම්ගේ පුත් ඉශ්මායෙල්ගෙන් (අල්ලාහ්ගේ සමාදානය හා ආශිර්වාදය ඔවුන්ට ලැබේවා) පැවත එන්නෙකි. ඔහු බනී හාෂිම් නම් ගෞරවාන්විත කුලයට අයත් වූ අතර, එය මක්කාහ්වේ ප්‍රබල කුරෛෂ් ගෝත්‍රවලින් එකකි.

ඔහුගේ උපත

ජේසුස්ගේ (අල්ලාහ්ගේ සමාදානය හා ආශිර්වාදය ඔහුට ලැබේවා) උපතින් සියවස් හයකට ආසන්න කාලයකින් පසු මුහම්මද් නබිතුමා (අල්ලාහ්ගේ සමාදානය හා ආශිර්වාදය ඔහුට ලැබේවා) ක්‍රිස්තු වර්ෂ 570දී මක්කාහ්වේ දී උපත ලැබීය. ඔහුගේ දෙමාපියන් උසස් පෙළපතකින් පැවත ආ, එකිනෙකාට ඥාතීන් වූ අය විය. මුරාහ්ගේ පුත් කිලාබ්ගේ පුත් කුසේගේ පුත් අබ්දුල් මනාෆ්ගේ පුත් හාෂිම්ගේ පුත් අබ්දුල් මුත්තලිබ්ගේ පුත් අබ්දුල්ලාහ් ඔහුගේ පියා විය. මුරාහ්ගේ පුත් කිලාබ්ගේ පුත් කුසේගේ පුත් අබ්දුල් මනාෆ්ගේ පුත් වහාබ්ගේ දියණිය වූ ආමිනා ඔහුගේ මව විය.

මුහම්මද් නබිතුමාගේ පියා ඔහු උපත ලබන්නටත් පෙරදීම මියගිය අතර, මුහම්මද් ට වයස අවුරුදු හයක් වන විට ඔහුගේ මව ද මියගියාය. ඉන්පසු ඔහුව හදාවඩාගත්තේ ඔහුගේ සීයා වූ අබ්දුල් මුත්තලිබ් විසිනි. ඉන් වසර දෙකකට පසු අබ්දුල් මුත්තලිබ්ගේ මරණය සිදු වූ අතර, එයින් පසු බනී හාෂිම් කුලයේ ප්‍රධානියා වූ ඔහුගේ බාප්පා වන අබූ තාලිබ්ගේ රැකවරණය යටතට ඔහු පත්විය.

ඔහුගේ පුද්ගල විශේෂතාව සහ චරිතය


මුහම්මද් (අල්ලාහ්ගේ සමාදානය හා ආශිර්වාදය ඔහුට ලැබේවා)

නබිවරයෙකු වීමට පෙර මුහම්මද් (අල්ලාහ්ගේ සමාදානය හා ආශිර්වාදය ඔහුට ලැබේවා) සරලවත්, ශීලාචාරවත් ලෙස ඉතා ශක්තිමත් සදාචාරසම්පන්න චරිතයක් ඇතිව හැදී වැඩුණේය. ඔහු නූගත් නමුත් කිසිවිටෙකත් පිළිරූ වැඳීම නොකළ අතර එහි විශේෂත්වය වන්නේ පිළිරූ වැඳීම යනු එකල ජනතාව අතර සාමාන්‍ය පුරුද්දක් වීමයි. ඊට පටහැනිව, ඔහු මක්කාහ්වට පිටතින් වූ ගුහාවක මැවුම්කරු සහ ඔහුගේ මැවීම් ගැන දින ගණනක් ධ්‍යානයකට සමවැදී භාවනා කළේය.

ඔහු ඒ සමාජය තුළ 'සත්‍යවාදී සහ විශ්වාසී' ලෙස පිළිගැනීමට ලක් වී සිටි අතර (අරාබි බසින් අස්-සාදිකුල් අමීන්), අතිශයින්ම අවංක වූවෙක් විය. සිය ව්‍යාපාර සඳහා හෝ දේපළ ආරක්ෂිතව තබා යාම සඳහා ඔහුව විශ්වාසයෙන් යුතුව තෝරාගැනීමට බොහෝ පුද්ගලයන් හුරුව සිටියහ.

මුහම්මද් නබිතුමා (අල්ලාහ්ගේ සමාදානය හා ආශිර්වාදය ඔහුට ලැබේවා) දුප්පතුන් සහ වරප්‍රසාද නොලත් අයට රැකවරණය දෙමින්, ඔවුන්ට ආරක්ෂා කිරීම සහ උපකාර කිරීම සඳහා වූ සන්ධානයක සාමාජිකයෙකු ද විය.

හෙළිදරව්ව

මුහම්මද් නබිතුමාට (අල්ලාහ්ගේ සමාදානය හා ආශිර්වාදය ඔහුට ලැබේවා) අල්ලාහ්ගේ පළමු හෙළිදරව්ව සුරදූත ගේබ්‍රියල් හරහා ලැබුණේ එම ගුහාවේ හුදෙකලාව විසීම සඳහා ගිය එවන් ගමනක දී යː

> (සියලු දෑ) මැවූ නුඹේ පරමාධිපතිගේ නාමයෙන් නුඹ කියවවු. ලේ කැටියෙන් මිනිසාව මැව්වේයි නුඹ කියවවු. තවද නුඹගේ පරමාධිපති මහත් පරිත්‍යාගශීලීය. ඔහු පෑන මගින් දැනුම බෙදා දුන්නේය. මිනිසාට නොදන්නා දෑ ඔහු ඉගැන්වූයේය. අල්-කුර්'ආන් (96:1-5)

මේ හෙළිදරව්ව ඔහුට ලැබුණේ ක්‍රිස්තු වර්ෂ 610 දී ය, එවිට මුහම්මද් නබිතුමාට (ඔහුට අල්ලාහ්ගේ සමාදානය හා ආශිර්වාදය ලැබේවා), වයස අවුරුදු 40කි.

මෙම මුල් හෙළිදරව්ව මගින් ද, විශ්වාසය සඳහා වූ පදනම මෙන්ම එම විශ්වාසය ප්‍රචාරය කිරීම සඳහා වූ පදනම පිණිස දැනුම සහ හේතු දැක්වීම වැදගත් වන බව අවධාරණය කෙරේ.

ඉන්පසු එළඹි වසර 23ක් පුරා අඛණ්ඩව සුරදූත ජේබ්‍රියල් හරහා මුහම්මද් නබිතුමාට හෙළිදරව් කිරීම් පහළ විය. එහි මුල් වසර 13 දී ඔහු මක්කාහ්ව තුළ ඉස්ලාමයේ පණිවිඩය ප්‍රචාරය කළ අතර, එහි දී ඉතා දරුණු විරෝධතා සහ හිංසනයට මුහුණ දීමට ඔහුට සිදුවිය. නමුත් ක්‍රි.ව. 622 දී, අඛණ්ඩ සහ වර්ධනය වූ හිංසනයන් හේතුවෙන් නබිතුමාට සහ ඔහුගේ අනුග ාමිකයන්ට මක්කාහ්වේ සිට කිලෝමීටර් 400ක් පමණ උතුරෙන් පිහිටි මදීනාවට සංක්‍රමණය වීමට සිදු විය. මදීනාවේ ජනතාව මුහම්මද් නබිතුමා සහ ඔහුගේ අනුගාමිකයන්ව මහත් හරසරින් සහ ඉහළ සත්කාරකත්වයෙන් පිළිගත්හ. මදීනාවේ මුහම්මද් නබිතුමා වාසය කළ ඊළඟ වසර 10 තුළ ද අඛණ්ඩව අල්ලාහ්ගේ හෙළිදරව් ලබාගෙන ඒවා ජනතාව අතර ප්‍රචාරය කිරීමට අමතරව, ඔහු විසින් ඉස්ලාමීය රාජ්‍යයක් ගොඩනැංවීමේ මූලික කටයුතු ද ආරම්භ කරන ලදී.

ඔහුගේ මරණය

ක්‍රිස්තු වර්ෂ 632 දී, එනම් ඔහුගේ දිවියේ 63 වැනි වියේදී මුහම්මද් නබිතුමා (ඔහුට අල්ලාහ්ගේ සමාදානය හා ආශිර්වාදය ලැබේවා) කෙටිකාලයක අසනීපයකින් පසු අභාවප්‍රාප්ත විය. එතුමාගේ ශ්‍රී දේහය මදීනාවේ පිහිටි ඔහුගේ බිරිඳ ආයිෂාගේ (ඇයට අල්ලාහ්ගේ සතුට අත්වේවා) නිවසේ දී මිහිදන් කරන ලදී.

(නබිවරය,) එබැවින් නුඹ අල්ලාහ් කෙරෙහි සියල්ල භාර කරවු. සැබැවින්ම නුඹ පැහැදිලි සත්‍ය (දහම)යෙහිය. අල්-කුර්ආන් (27:79)



# නබිතුමා පිළිබඳ විශ්වසනීයත්වය

මනුෂ්‍යත්වයේ ඉතිහාසය පුරාවටම, දෙවියන් විසින් පත්කළ සියලුම ශාස්තෘවරු පිළිබඳව ඇති තොරතුරු ප්‍රශ්න කිරීමට ලක්වන අතර, මුහම්මද් නබිතුමා (ඔහුට අල්ලාහ්ගේ සමාදානය සහ ආශිර්වාදය ලැබේවා) සම්බන්ධයෙන් ද එහි කිසිදු වෙනසක් නොමැත. කුර්'ආනයේ සඳහන් වන්නේ දෙවියන්ගේ ශාස්තෘවරු පිළිබඳ තොරතුරු ඔවුන්ගේ උසස් පෞද්ගලික චරිතය සහ ඔවුන්ගේ අධිපතියාගෙන් ඔවුන් ගෙනෙන පණිවිඩයේ සත්‍යවාදී බව විදහා දක්වන බවයි. මුහම්මද් නබිතුමාගේ විශ්වසනීයත්වය තහවුරු කරන වාද 4ක් තිබේ.

පළමුවැනි වාදය

4 වන කොටසෙන් විස්තර කර ඇති ආකාරයට, මුහම්මද් නබිතුමා දැඩි ලෙස අවංක පුද්ගලයෙකු වූ අතර, ඔහුගේ ජනතාව අතර ඉහළ ගරුත්වයක් හිමිකරගෙන සිටි අයෙකු විය. ඔහුව අන් අය හැඳින්වූ අන්වර්ථ නාමය වූයේ ද 'සත්‍යවාදී විශ්වාසකටයුතු පුද්ගලයා' යන්නයි. නබිතුමා ඔහුගේ ශාස්තෘත්ව ප්‍රචාරණ මෙහෙවර ඇරඹුවේ ඔහුට වයස හතළිහක් වන විට දී ය. එවැනි උසස් චරිතයක් තිබූ පුද්ගලයෙකු හදිසියෙන් මෙන් එවැනි වයසකදී බොරුකාරයෙකු හා ප්‍රතිරූපකයෙකු බවට පත්වනු ඇතැ'යි සිතීම සියලුම තර්ක සහ හේතු දැක්වීම් නිෂ්ප්‍රභ කරයි.

සමහරවිට තම සමාජ තත්ත්වය උසස් කරගැනීමට ඔහුට අවශ්‍ය විණැ'යි යමෙකුට වාද කළ හැක. නමුත් ඔහු ඒ වනවිටත් ඉහළ ගරුත්වයක් හිමිව සිටි අතර, කුරෛෂ් ගෝත්‍රයේ ඉහළතම බලයක් සහ ගරුත්වයක් සහිතව සිටි කුලයට අයත්ව සිටියේය. ඇත්ත වශයෙන්ම, ඔහුගේ ශාස්තෘත්ව ප්‍රචාරණ කටයුතු අරඹන විට, ඔහුගේ ශාස්තෘත්ව පණිවිඩය ප්‍රචාරය කිරීමෙන් වැළැක්වීම පිණිස එම කුලයේ ඉහළ නායකත්ව තනතුරක් ද පිරිනැමීමට උත්සාහ කරන ලද නමුත්, එතුමා එය එකහෙළා ප්‍රතික්ෂේප කළේය.[8] ඉන් ඔහු කිසිදු සමාජීය තත්ත්වයක් අපේක්ෂා නොකළ බව තහවුරු වේ.

දෙවන වාදය

දෙවියන්ගේ පණිවිඩකරුවන්ට අවශ්‍ය සහයෝගය ලැබුණේ ඔවුන්ට පහළ කළ දිව්‍යමය පණිවිඩය හරහා ය. මුහම්මද් නබිතුමාට අවශ්‍ය සහයෝගය ලැබුණේ කුර්'ආනයෙනි. 7 වන කොටසෙහි පෙන්වා දී ඇති ආකාරයට නබිතුමාට කුර්'ආනය ලියන්නට හැකියාවක් නොතිබිණි; එය අනිවාර්යයෙන්ම දිව්‍යමය හෙළිදරව්වකි. ඇත්ත වශයෙන්ම, කුර්'ආනය ලියන ලද්දේ නබිතුමා විසින් නම්, එයාකාරයේ ලියැවිල්ලක් අන් මිනිසුන්ටත් ලිවිය හැකි විය යුතු බැවින්, හැකි නම් එවැන්නක් ලියන ලෙස සකල මනුෂ්‍ය සංහතියටම විවෘත

අභියෝගයක් කුර්'ආනය තුළින්ම එල්ල කරයි. මීට පෙර සඳහන් කළාක් මෙන් එවැනි ලිවීමක් කළ හැකි විද්වත් පරිචයක් නබිතුමාට නොවීය යනු නබිතුමාගේ විශ්වසනීයත්වය සඳහා වූ සජීවී විශ්වාසකටයුතු හේතුකාරකයක් වන අතර, සත්‍ය වශයෙන්ම නබිතුමා විසින් ප්‍රාතිහාර්යයක් බවට සඳහන් කර ඇති එකම දෙයත් කුර්'ආනයම පමණි.[9]

තුන්වැනි වාදය

මානව ඉතිහාසයේ අන් කිසිදු ව්‍යාපාරයක මින් පෙර සිදු නොවූ අන්දමින් මුහම්මද් නබිතුමා ආරම්භ කළ නවමු ව්‍යාපාරය මඟින් මානව ශිෂ්ඨාචාරය ධනාත්මකව පුළුල් හා ශීඝ්‍ර අන්දමේ පරිණාමනයකට ලක්කරන ලදී. තවද, කිසිදු ආගමක් මඟින් ඉස්ලාමය තරම් මානව ශිෂ්ඨාචාරය සහ සංවර්ධනය සඳහා තිරසාර බලපෑමක් ඇති කර නොමැත. මානව ශිෂ්ඨාචාරයේ මෙම ශීඝ්‍ර සහ තිරසාර පරිණාමනය සාක්ෂාත් කරගැනීමේ හැකියාව ප්‍රතිරූපකයෙකුට තිබිය නොහැක. එවැනි සිතුවිලි පවා හේතු දැක්වීම් සහ තර්ක සමග අනුකූල නොවේ.

සිව්වැනි වාදය

මුහම්මද් නබිතුමා (එතුමාට අල්ලාහ්ගේ සමාදානය සහ ආශිර්වාදය ලැබේවා) පිළිබඳව ලොව පවතින අනෙකුත් ප්‍රධාන ආගම් සියල්ලේම ආගමික ග්‍රන්ථවල පුරෝකථනය කර ඇත: යුදෙව් ආගම, ක්‍රිස්තියානි ආගම, හින්දු ආගම සහ බෞද්ධාගම.

මුහම්මද් නබිතුමා (එතුමාට අල්ලාහ්ගේ සමාදානය සහ ආශිර්වාදය ලැබේවා) පිළිබඳව යුදෙව් සහ ක්‍රිස්තියානි ආගමික ග්‍රන්ථවල පුරෝකථන කර ඇති බව කුර්'ආනයේ සඳහන් වේ.

> ඔවුන් කවරහුද යත්, කවරෙකුව තව්රාතයෙහි හා ඉන්ජීලයෙහි සටහන් කරනු ලැබූවෙකු ලෙස තමන් අබියස දකින්නේ ද එම අකුරු නොදත් නබිවරයා වූ රසූල්වරයාණන්ව අනුගමනය කරන්නන්ය. (අල් කුර්'ආන් 7:157)

ද්විතීය නීති සංග්‍රහයේ 18:18 හි මෙසේ සඳහන් වේ:

> නුඹේ සහෝදර ජනතාව අතරෙන් නුඹ (මෝසෙස්) හා සමාන දිවැසිවරයෙකු පත්කොට, ඔහු කිය යුතු දේ ඔහුට කියා දෙන්නෙමි. ඔහුට මා අණ කරන සියල්ල ඔවුන්ට ඔහු දන්වනු ඇත.

මුහම්මද් නබිතුමා හැර, පැරණි තෙස්තමේන්තුවේ මේ වගන්තියට අනුකූල වන කිසිවෙක් මෝසෙස්ට පසුව පැමිණි බවට පිළිගත නොහැක: මුලින්ම,

අරාබීන් යුදෙව්වන්ගේ සහෝදරයන් ය. ඉස්‍රායෙල්ගේ දරුවෝ ඉසාක්ගෙන් පැවත එන අතර, අරාබි ජාතිය ඉශ්මායෙල්ගෙන් පැවත එයි. ඉසාක් සහ ඉශ්මායෙල් යනු ඒබ්‍රහම්ගේ පුතුන් නිසා ඔවුන්ගෙන් පැවත එන්නෝ සහෝදරයෝ වෙති. දෙවනුව, මුහම්මද් හා මෝසෙස් අතර සමාන ලක්ෂණ ඇති අතර, ජේසුස් එසේ නොවේ: (1) මෝසෙස් සහ මුහම්මද් යන දෙදෙනාටම පියෙක් සහ මවක් සිටියහ. නමුත් ජේසුස්ට මවක් පමණක් වූ අතර, පියෙක් නොවීය. (2) මෝසෙස් සහ මුහම්මද් යන දෙදෙනාම තම තමන්ගේ මව්වරුන්ගේ කුස් තුළ ස්වභාවිකව පිළිසිඳගත්හ. ජේසුස් ඔහුගේ මවගේ ගර්භාෂයේ පිළිසිඳගත්තේ ප්‍රාතිහාර්යයක ප්‍රතිඵලය ලෙසිනි. (3) මෝසෙස් සහ මුහම්මද් විවාහප්‍රාප්තව දරු සුරතල් ද බැලූ නමුත්, ජේසුස් එසේ නොවීය. (4) මෝසෙස් සහ මුහම්මද් ඔවුන්ගේ ජනතාව වෙනුවෙන් නව නීති රීති හඳුන්වා දුන් නමුත්, ජේසුස් එසේ නොකළේය. (5) මෝසෙස් සහ මුහම්මද් යන දෙදෙනාම ස්වභාවික මරණයක් අත්කරගත්හ. ඉස්ලාමීය සහ ක්‍රිස්තියානි විශ්වාසයන්ට අනුව, ජේසුස් මෙලොව හැරගියේ ස්වභාවික ආකාරයෙන් නොවේ. තුන්වෙනුව, කුර්ආනයේ 53:3-4 හි සඳහන් වී ඇති ආකාරයට, මුහම්මද් නබිතුමා කියා සිටි දෑ ඔහු විසින්ම කියූ දෑ නොවන අතර, ඒවා ඍජුවම දෙවියන්ගේ හෙළිදරව් කිරීම් හෝ දෙවියන්ගේ ආභාෂය ලත් වචන විය.

නව තෙස්තමේන්තුව දෙස බැලූ විට, ජොහාන්ගේ ශුභාරංචියේ මෙලෙස සඳහන් වේ:

> ඔබට කීමට තව බොහෝ දේ මට ඇත. එහෙත්, දැන් ඒවා දරාගැනීමට ඔබට නොහැකිය. එසේ වී නමුත්, ඒ තැනැත් වහන්සේ, එනම්, සත්‍යතාවේ ආත්මයාණන් වහන්සේ පැමිණි කල, ඔහු සම්පූර්ණ සත්‍යය කරා යෑමට ඔබට මඟපෙන්වන සේක. මන්ද, ඔහු සිය කැමැත්තෙන් ම කතා නොකොට, ඔහු අසන දේ ම පවසා, මතු සිදුවන දේ ඔබට ප්‍රකාශ කරනු ඇත. ඔහු මා සතු දෙයින් ගෙන ඔබට ප්‍රකාශ කරන බැවින්, මා මහිමයට පමුණුවන සේක. (ජොහාන් 16:12-14)

මෙම වැකිවලින් තමන් විසින්ම යමක් නොකියන 'සත්‍යතාවේ ආත්මය' පිළිබඳව නැවතත් සඳහන් කරයි. සත්‍යතාවේ ආත්මය යනු ශුද්ධ වූ ආත්මය විය නොහැක, ඒ ශුද්ධ වූ ආත්මය ඒ වනවිටත් ජේසුස් සමග සිටි බැවිනි (ලූක් 4:1සහ 3:22, ජොහාන් 20:22, ක්‍රියා පොත 2:4, යනාදිය). තවද, මෙම සත්‍යතාවේ ආත්මය ජේසුස්ව උත්කර්ෂයට පත්කරයි. මුහම්මද් හැර, ජේසුස්ට පසුව පැමිණ ජේසුස්ව උත්කර්ෂයට පත්කළ වෙන කිසිදු ශාස්තෘවරයෙක් නොමැත (කොටස 11 බලන්න). එනිසා ජේසුස් ට පසුව පැමිණීමට නියමිතව



ඉස්තාන්බුල් හි ආසියාතු නගර කොටසේ ක්ෂිතිජය හරහා මිනරත් නැගීසිටින දර්ශනය

සිටි 'සත්‍යතාවේ ආත්මය' මුහම්මද් බවට කිසිදු සැකයක් නොමැත (ඔවුන් සියලු දෙනාටම සාමය වේවා).

තවද, මුහම්මද් නබිතුමා පිළිබඳව බයිබලයේ යෙසායා 29:12, ජොහාන් 14:16, ජොහාන් 16:7, මතෙව් 21:43 සහ ක්‍රියාපොත 3:22 හි අනාවැකි පළකොට ඇති මෙම බයිබල් වගන්තිවල සඳහන්ව ඇති 'පහසු කරන්නා' යන වචනය 'පැරක්ලෙටොස්' නම් ග්‍රීක වචනයේ පරිවර්තනයක් බව විශේෂයෙන් සඳහන් කළ යුතු ය. මෙම වචනය 'පෙරික්ලිටොස්' නම් නියම ග්‍රීක වචනයෙන් උකහාගෙන ඇති අතර, එහි පරිවර්තනය 'ප්‍රශංසා ලද පුද්ගලයා' වේ - අරාබි බසින් මෙය 'අහමද්' හෝ 'මුහම්මද්' නම් වේ.[10]

සූක්ෂ්ම සහ අපක්ෂපාතී අධ්‍යයනවලින් පෙනී යන්නේ ද මුහම්මද් නබිතුමා පිළිබඳව හින්දු සහ බෞද්ධ ආගමික ග්‍රන්ථවල ද පුරෝකථනය කර ඇති බව යි. ආචාර්ය වේද් ප්‍රකාශ් උපාධ්‍යායි විසින් රචිත “Muhammad in the Hindu Scriptures”, නම් පොතේ අප නබිතුමා පිළිබඳ හින්දු ආගමික ග්‍රන්ථවලින් ඔහු අනාවරණ කරගෙන ඇති බොහෝ යොමුකිරීම්, සඳහන් කිරීම් විස්තර කෙරේ. වේද ග්‍රන්ථවල සඳහන් කෙරෙන පැමිණීමට නියමිත ඉසිවරයා පිළිබඳව ඇති විස්තර මුහම්මද් නබිතුමා සමග කදිමට ගැලපේ. සංස්කෘත භාෂාවෙන් ඇති ඔහුගේ මුල් විස්තරයට පහත දැක්වෙන සටහන ද ඇතුළත් වේ:

1. නරෂග්සා යනු 'ප්‍රශංසා ලද්දා' යන අරුත් දෙයි. නබිතුමාගේ මුහම්මද් සහ අහමද් යන නම් දෙකම මෙම අර්ථය ගනී. තවද, නරෂග්සාගේ උපන්බිම සහ ලක්ෂණ ද නබිතුමාගේ ඒ සම්බන්ධ තොරතුරු සමග කදිමට පැහේ.

2. අන්තිම් රිෂි හෝ 'අවසාන ඉසිවරයා' මුහම්මද් නබිතුමා යනු මනුෂ්‍ය සංහතිය වෙනුවෙන් පැමිණි අවසන් දේව පණිවිඩකරුවා ය.
3. අවසාන පරපුර සඳහා පැමිණෙන ඉසිවරයා කල්කි අවතාරය ලෙස හඳුන්වයි. මුහම්මද් නබිතුමාව මුළු මනුෂ්‍ය සංහතිය සඳහාම අවසාන පණිවිඩකරුවා ලෙස එවන ලදී.
4. කෞරම් යන්නෙහි තේරුම සංක්‍රමණිකයා යන්නයි. මුහම්මද් නබිතුමා මදීනාහ්වට සංක්‍රමණය වූවෙකි (4 වන කොටස බලන්න).
5. ඔහුගේ පියා "වෛශ්ණුවේශ්" යනුවෙන් හැඳින්වෙන අතර, එහි තේරුම 'දෙවියන්ගේ ගැත්තා' යන්නයි. එමෙන්ම, ඔහුගේ මවගේ නම "සුමති" වන අතර, එහි තේරුම 'සාමය' යන්න වේ. මේ නම් ද්විත්වය පිළිවෙළින් අරාබි භාෂාවේ 'අබ්දුල්ලාහ් ' සහ 'අමිනා' යන වචන හා ගැලපෙන අතර, ඒවා පිළිවෙළින් නබිතුමාගේ පියා සහ මවගේ නම් වේ.
6. පැමිණීමට නියමිත ඉසිවරයා මමහා නම් වේ. මෙය සංස්කෘත වචනයක් නොවනමුත්, එය අරාබියෙන් මුහම්මද් යන නමේ සංස්කෘත ආකාරය මෙන් දිස් වේ.

බෞද්ධ ආගමික ග්‍රන්ථවලට අනුව මෛත්‍රේය නමින් අන්තිම බුදුවරයා හෝ අවසාන ඉසිවරයා පහළ වන බව ගෞතම බුදුරජාණෝ වදාළහ. (කැරස් විසින් රචිත "Gospel of Buddha" පොතේ 217 පිටුව). මෛත්‍රේය පිළිබඳ විස්තරය මුහම්මද් නබිතුමා පිළිබඳ විස්තරයට හොඳින් ගැලපේ:

1. අවසාන පණිවිඩකරුවා, අවසන් ඉසිවරයා වූයේ මුහම්මද් නබිතුමා ය.
2. මෛත්‍රේය යන්නෙහි තේරුම 'කාරුණිකයා' යන්න යි. මුහම්මද් නබිතුමාව අල්-කුර්'ආනයේ (21:107) හි විස්තර කර ඇත්තේ ලොවේ සියලුම මනුෂ්‍යයන්ට 'කාරුණික' පුද්ගලයෙකු ලෙස යි.
3. බුදුවරයෙකු සතු සියලුම ලක්ෂණ මෛත්‍රේය විසින් දරන්නේය: ඔහු වංශවත් කුලීන පවුලකින් පැවත එයි, ගුහාවකට ගොස් හුදෙකලාව සිටින විට සුරදූතයන් ඔහුව හමුවීමට පැමිණේ, බිරින්දෑවරු සහ ඔවුන්ට දාව ඉපදුණු දරුවන් ද සිටී, ජීවිකාව සඳහා වැඩපළ කරයි, සහ ඔහු ඔහුගේ සාමාන්‍ය ජීවිතය සම්පූර්ණ කරයි, එනම්, ඔහු ස්වභාවික මරණයක් අත්දකියි. මේ සියලු විස්තර මුහම්මද් නබිතුමා සමග තිතටම ගැලපේ.
4. මෛත්‍රේය පාලකයෙකු ලෙස ද කටයුතු කරනු ඇත. මුහම්මද් නබිත්වය දැරීමට අමතරව මුස්ලිම් රාජ්‍යයේ පාලකයාව ද සිටියේය.

5. මෛත්‍රේය ඊට පෙර සිටි බුදුවරුන් ගැන කතාකරන බව කියයි. මුහම්මද් ඔහුට පෙර සිටි බුදුවරුන් ගැන ඉතාම විස්තරාත්මකව කතා කළේය. මුහම්මද් නබිතුමාට පෙර විසූ නබිවරු විසිහතර දෙනෙක් ගැන වූ කතා අල්-කුර්ආනයේ අඩංගු වේ.

6. මෙලොව තුළ මෛත්‍රේය ට කිසිදු ගුරුවරයෙකු නොවේ. මුහම්මද් නබිතුමා නූගතෙකු වූ අතර, මෙලොව කිසිදු ගුරුවරයෙකු නොවීය. ඔහුට සියලුම දැනුම ඔහුට ලැබුණේ දෙවියන්ගෙන් ලද හෙළිදරව් හරහා ය.

කෙටියෙන් පවසන්නේ නම්, නබිතුමා පිළිබඳ තොරතුරු/විස්තර, ඔහුගේ උසස් චරිතය, ඔහු රැගෙන පැමිණි පණිවිඩය, ඔහුගේ ව්‍යාපාරය හරහා මානව ශිෂ්ඨාචාරයේ ඇති වූ තිරසාර පරිණාමනය සහ සියලු ප්‍රධාන ආගම්වල ශුද්ධ වූ ග්‍රන්ථවල ඔහුගේ පැමිණීම පිළිබඳව අනාවැකි පළකර තිබීම යන කරුණු තුළ කැටි වේ.



මදීනාවේ පිහිටි මුහම්මද් නබිතුමාගේ දේවස්ථානය (මස්ජිදුන් නබවි). ක්‍රි.ව. 622 දී නබිතුමා විසින් ඔහුගේ නිවසට යාබදව පිහිටි ඉඩමක මෙම දේවස්ථානය ඉදිකරන ලදී. කාලාන්තරයක් පුරා කළ විස්තීර්ණ කිරීම්වලින් පසු අද එය ලොව විශාලතම මුස්ලිම් දේවස්ථානවලින් එකක් වන අතර, මක්කාවේ මහා දේවස්ථානයට (මස්ජිද් අල් හරාම්) පමණක් දෙවැනිව සැලකෙන ශුද්ධ වූ දේවස්ථානය ද වේ.

# කුර්'ආනයෙන් ලබාදෙන පණිවිඩය හා එහි ඉතිහාසය

කුර්'ආනය යනු මුහම්මද් නබිතුමාට (ඔහුට අල්ලාහ්ගේ ආශිර්වාදය සහ සමාදානය අත්වේවා) අල්ලාහ් විසින් ඔහුගේ සුරදූතයා හරහා හෙළිදරව් කළ ශුද්ධ වූ ආගමික ග්‍රන්ථයයි. එය මෙලොව පවතින තාක් කල් අල්ලාහ් විසින් සියලු මනුෂ්‍ය වර්ගයාට කරන ලද අවසාන හෙළිදරව්ව වේ. අල්-කුර්ආනය හෙළිදරව් කරනු ලැබුවේ අල්ලාහ්ගේ පණිවිඩය මනුෂ්‍ය වර්ගයාට සම්පූර්ණ කිරීමට, පෙර කළ හෙළිදරව් කිරීම් සනාථ කිරීමට සහ පෙර පහළ කළ ශුද්ධ ලියවිලිවල දැනට පවතින අවශේෂවල අඩංගු වෙනස්කම් හා වෙනස් කිරීම් නිවැරදි කිරීම සඳහා ය.[11]

එමගින් කෙරෙන හෙළිදරව්ව

අල්-කුර්ආනය ක්‍රි.ව. 610 සිට 632 දක්වා අදියරෙන් අදියර වසර 23ක් පුරා අරාබි භාෂාවෙන් හෙළිදරව් කරන ලදී. නබිතුමාට ක්‍රමානුකූලව කරන ලද මෙම හෙළිදරව් කිරීම් හරහා විශ්වාසවන්තයන්ට අදාළ තත්ත්වයන්වල දී යොදාගත හැකි ප්‍රගතිශීලී මගපෙන්වීම් ලබා දෙන ලදී. ඉන් විශ්වාසවන්තයන්ගේ ජීවිත තුළ අල්ලාහ්ගේ නීති ඵලදායී ලෙස උකහා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම සහතික කළේය.

එය වාර්තා කිරීම සහ ආරක්ෂා කිරීම

නබිතුමාණන්ට (ඔහුට සමාදානය ලැබේවා) හෙළිදරව් කිරීම් ලැබෙද්දී, ඔහුගේ උපදෙස් හා අධීක්ෂණය යටතේ ඒවා ලියා තබන ලෙස ඔහු තම ලියන්නන්ට උපදෙස් දුන්නේය. ඒ අතරම, නබිතුමා සහ ඔහුගේ සගයන් වූ පුරුෂයන් හා ස්ත්‍රීන් බොහෝ දෙනෙක් එම හෙළිදරව් කිරීම් කටපාඩම් කළහ. මේ ආකාරයට අල්-කුර්'ආනය නබිතුමාගේ ජීවිත කාලය තුළ දී ම පිරිමි සහ ගැහැණු විශ්වාසිකයන් විසින් ලියා කටපාඩම් කර ඇත. අල්-කුර්'ආනය කටපාඩම් කිරීමේ මෙම පුරුද්ද අද දක්වාම පවතී. ඉස්ලාමයේ ඉතිහාසයේ ඕනෑම මොහොතක, මුළු අල් කුර්'ආනයම එහි මුල් පිටපතට අනුව කටපාඩම් කර ඇති මිලියන සංඛ්‍යාත මුස්ලිම්වරු සිටිති. අද වන විට ඇස්තමේන්තු කර ඇති පරිදි මුස්ලිම්වරුන් මිලියන විස්සකට වැඩි පිරිසක් මුළු අල් කුර්ආනය කටපාඩම් කර ඇති අතර, මිලියන ගණනක් අල් කුර්'ආනයේ කොටස් කටපාඩම් කර ඇත.

එහි අන්තර්ගතය සහ සාමාන්‍ය තේමා

අල්-කුර්'ආනය පරිච්ඡේද 114 කින් සමන්විත වේ. සෑම පරිච්ඡේදයකම ඇති වාක්‍ය ගණන 3 (103 සහ 108 පරිච්ඡේද) සිට වාක්‍ය 286 (2 වන පරිච්ඡේදය) අතර ගණනක් ගනී. අල්-කුර්ආනය මගපෙන්වීම, අනතුරු

ඇඟවීම සහ ශුභාරංචිය මෙන්ම අතීත ජාතීන් සහ ඔවුන්ගේ ශාස්තෘවරුන් පිළිබඳ විස්තරයක් ද දෙන ග්‍රන්ථයකි. පොදුවේ, එය තේමාවන් හතරක් ආවරණය කරයි:

පළමුව, එය අල්ලාහ් ගැන, ඔහුගේ ස්වභාවය සහ ලක්ෂණ ගැන අපට කියයි; නිදසුනක් වශයෙන්, මෙම පොතේ 2 වන වගන්තියේ 112 වන පරිච්ඡේදය ඔහුගේ ඒකීයභාවය (තව්හීද්) සහ වෙනත් කිසිදු ජීවියෙකු විසින් බෙදා නොගන්නා ඔහුගේ සුවිශේෂී ගුණාංග විස්තර කර ඇත. 'සිංහාසනය පිළිබඳ පදය' (අරාබි බසින් ආයතුල් කුර්සි) ලෙස හැඳින්වෙන පහත පදය අල්ලාහ්ගේ ගුණාංග විස්තර කරන තවත් උදාහරණයකි;



අල්ලාහ්, ඔහු හැර (නැමදුමට) වෙනත් දෙවියෙකු නොමැත. (ඔහු) සදා ජීවමානය, සර්ව පෝෂකය. මඳ නින්දක් හෝ දැඩි නින්දක් හෝ ඔහුව ග්‍රහණය නොකරන්නේය. අහස්හි ඇති (සියලු) දෑ හා මිහිතලයේ ඇති (සියලු) දෑ ඔහුටම සතුය. ඔහුගේ අනුමැතියෙන් මිස ඔහු අබියස රෙකමදාරු කළ හැක්කේ කවරෙකුට ද? ඔවුනට ඉදිරියෙන් හා ඔවුනට පසුපසින් ඇති දෑ ඔහු (මැනවින්) දන්නේය. ඔහු (අල්ලාහ්) අභිමත කළේ නම් මිස ඔවුන් (කිසිවෙකු) ඔහුගේ දැනුමෙන් කිසිවක් පරිග්‍රහණය කර නොගනිති. ඔහුගේ රාජධානිය අහස් හා මිහිතලයට වඩා විශාල විය. ඒවා ආරක්ෂා කිරීම ඔහුව වෙහෙසට පත් නොකරන්නේය. තවද ඔහු උත්තරීතරය, පරමෝත්තමය. (අල්-කුර්'ආන් 2:255)

දෙවනුව, එය මුලින්ම අල්ලාහ් සමග අපගේ සම්බන්ධතාව විස්තර කරයි; ඔහු අපව මැව්වේ ඇයි සහ ඔහුට අප විසින් ඉටුකළ යුතු යුතුකම් මොනවාද යන්න. උදාහරණයක් ලෙස අල්ලාහ් අල්-කුර්'ආනයේ 51:56 හි මෙසේ පවසයි.

> ජින් වර්ගයා හා මනුෂ්‍ය වර්ගයා මා නැමදුම් කිරීමට මිස නොමැව්වෙමි.

මෙහිදී 'නැමදුම' යන වචනය යෙදී ඇත්තේ මැවුම්කරුට සේවය කිරීම සහ ඔහුගේ ආඥාවන්ට අනුව ජීවත් වීම යන අර්ථයෙන් වේ. අල්-කුර්'ආනය විස්තර කරන්නේ අනෙකුත් මැවීම් සමග අපගේ ඇති සම්බන්ධතාවයි; දේවදූතයන්, ජින්වරු, සත්ව ලෝකය සහ අනෙකුත් භෞතික ලෝකය; අපගේ පැවැත්ම සමග ඒවායේ අදාළත්වය හා අන්තර්ක්‍රියාකාරිත්වය කුමක්ද?[12]

තෙවනුව, නීති සහ නියමයන් ආකාරයෙන් ඉන් මගපෙන්වීම් ලබාදෙන අතර, සදාචාරය හා යහපත් ජීවන තත්ත්වයන් පිළිබඳ ප්‍රමිතීන් ඉන් සකස් කරයි: අප අල්ලාහ් නැමදිය යුතු ආකාරය සහ අපගේ ජීවිත හැසිරවිය යුතු ආකාරය. මගපෙන්වීම අනුගමනය කරන්නන්ට සදාකාලික ප්‍රීතිය හා මගපෙන්වීම ප්‍රතික්ෂේප කරන අයට සදාකාලික වධ හිංසා පැමිණෙන බව ද ඉන් සහතික කරයි.[13]

අවසාන වශයෙන්, අල්-කුර්'ආනය අපට පවසන්නේ සියලුම ජාතීන්ට ශාස්තෘවරුන් මාර්ගයෙන් මගපෙන්වීම ලැබී ඇති බවයි. උදාහරණයක් ලෙස, 10:47 දී අල්ලාහ් මෙසේ පවසයි.

> සෑම සමූහයකටම රසූල්වරයෙකු සිටියි. ඔවුන්ගේ රසූල්වරයා පැමිණි කල්හි (ඔවුන් අතුරින් පිරිසක් ඔහුව ප්‍රතික්ෂේප කළේ නම් විශ්වාස කරන්නන්ට ජයග්‍රහණය ද අවිශ්වාස කරන්නන්ට විනාශය ද යන්නෙන්) ඔවුන් අතර සාධාරණ අයුරින් විනිශ්චය දෙනු ලැබේ. තවද ඔවුහු අසාධාරණයට ලක් නොවෙති.

මේ අනුව, මානව වර්ගයාට පාඩමක් ලෙස අතීත ජාතීන් සමග අල්ලාහ් කටයුතු කළ ආකාරය පිළිබඳ කථාන්තර අල්-කුර්'ආනයෙන් විස්තර කරයි. නිදසුනක් වශයෙන්, නෝවා නබිතුමා සිය ජනතාව සමග කළ අරගලය හා පසුව ඇති වූ ගංවතුර තත්ත්වය ගැන එය අපට කියයි. මෝසෙස් නබිතුමා තම ජනතාව හා පාරාවෝ සමග කළ අරගලය ගැන එය අපට කියයි. මේ අතුරින් "විශිෂ්ටම කථාන්තරය" වන ජෝසප් නබිතුමාගේ ජීවිත කතාව ද එහි කියැවේ. සමස්තයක් ලෙස, අල්ලාහ් විසින් මනුෂ්‍ය වර්ගයා වෙත කාලයෙන් කාලයට එවන ලද දහස් ගණන් අනාගත වක්තෘවරුන්ගෙන් 25



අල්-කුර්'ආනය පාරායනය කිරීම ඉස්ලාමයට අනුව නැමදීමේ ක්‍රියාවකි. මේ අනුව, කුර්ආනය අද ලෝකයේ වැඩිපුරම කියවන පොතයි.

දෙනෙකුගේ කථා අල්-කුර්'ආනයෙන් විස්තර කෙරේ.[14]

## නවීන විද්‍යාවන් සමග අල්-කුර්'ආනයේ අනුකූලතාව

අල්-කුර්'ආනය සියවස් දහහතරකට පෙර හෙළිදරව් කෙරුණි. එහෙත් නූතන විද්‍යාවන් විසින් මෑත කාලයේ දී පමණක් සොයාගෙන ඇති බොහෝ විද්‍යාත්මක කරුණු එහි දී අපට හමු වේ. මෙම කරුණු තාරකා විද්‍යාව, භූ විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ව විද්‍යාව ඇතුළු ස්වාභාවික විද්‍යාවන්හි බොහෝ ක්ෂේත්‍ර ආවරණය කරයි. අපි උදාහරණ කිහිපයක් විමසා බලමු.

## විශ්වයේ මැවීම

අල්-කුර්'ආනයේ 21:30 හි අල්ලාහ් මෙසේ පවසයිඃ

> අහස් හා මිහිතලය එකිනෙකට බැඳී තිබී පසුව අපි ඒ දෙක වෙන් කළ බව ද, ප්‍රාණය ඇති සෑම දෙයක්ම අපි ජලයෙන් ඇති කළ බව ද ප්‍රතික්ෂේප කළවුන් නොදුටුවෝ ද? ඔවුහු විශ්වාස නොකරන්නෝ ද?

තවද, 51 වන පරිච්ඡේදයේ 47 වන වාක්‍යයේ අල්ලාහ් මෙසේ පවසයිඃ

> අහස ද අපේම බලයෙන් අපි ඒවා සාදා ඇත්තෙමු. තවද, නියත වශයෙන්ම අපි ඒවා පිළිබඳව බලය දරන්නන් වෙමු.

මෙම වැකි නවීන දැනුමට අනුකූල වේ - විශ්වය එක් වායුමය ඒකකයක් ලෙස ආරම්භ වූ අතර පසුව එය පුපුරා ගියේ මන්දාකිණි සෑදීමට මුල්වෙමිනි. මෙය මහා පිපිරුම් න්‍යාය ලෙස හැඳින්වේ. තවද, නවීන විද්‍යාව සනාථ කරන්නේ එම පළමු පිපිරීමෙන් පසු අපේ විශ්වය තවමත් පුළුල් වන බවයි.



අල්ලාහ්ගේ බිලියන ගණනක් වූ මන්දාකිණි මැවීම්වලින් එකක් වන ඇන්ඩ්‍රොමීඩා. පර්සියානු තාරකා විද්‍යාඥ අබ්දුල් රහ්මාන් අල් සුෆි විසින් ක්‍රි.ව. 964 දී එය සොයා ගන්නා ලදී.

## කලලරූපයේ වර්ධනය

කලලරූපී අවධිවල ළදරුවාගේ වර්ධනය ගැන අල්-කුර්ආනයේ ස්ථාන කිහිපයක විස්තර කර ඇත:

> තවද සැබැවින්ම අපි මැටියෙන් යුත් සාරයෙන් මිනිසාව මැව්වෙමු. පසුව අපි ආරක්ෂක ස්ථානයෙහි (ගර්භාෂයෙහි) ශුක්‍ර ධාතුවක් ලෙස ඔහුව පත් කළෙමු. පසුව අපි ශුක්‍ර ධාතුව (ඇලෙනසුළු) ලේ කැටියක් බවට මවා, පසුව ලේ කැටිය මස් කැබැල්ලක් බවට මවා, පසුව මස් කැබැල්ල අස්ථි බවට මවා, පසුව අපි එම අස්ථි මාංශයෙන් පැළඳුවෙමු. පසුව වෙනත් මැවුමක් බවට අපි එය නිර්මාණය කළෙමු. නිර්මාපකයින් අතුරින් ඉතා අලංකාර අල්ලාහ් අති උත්කෘෂ්ට විය. (අල්-කුර්'ආන් 23:12-14)

කලලරූපයේ ආරම්භයේ සිටම නිශ්චිත අරාබි වචනවලින් මෙම වැකි රූපමය ලෙස හා නිවැරදි ලෙස විස්තර කෙරේ. පළමුවෙන්ම, සංසේචනය වූ ඩිම්බය සංජානනීය රුධිර කැටියක් (අලකා) දක්වා වර්ධනය වන අතර පසුව එය ගැටිත්තක් (මුධ්ගා) බවට වර්ධනය වේ. ඊට පසු, ගැටිත්ත තුළ අස්ථි වර්ධනය වීමට පටන්ගන්නා අතර, අවසානයේ අස්ථි වටා මස් වැඩීමට පටන් ගනී. අල්-කුර්'ආනය ළදරුවාගේ වර්ධනය විස්තර කරන්නේ එලෙසයි.

මෙම කුර්'ආන වැකියෙහි භාවිතා කර ඇති 'අලකා සහ මුධ්ගා' නම් අරාබි වචන දෙක, ඒවායේ නිරවද්‍යතාවයෙන් ඉතා වැදගත් වේ.

කැටි ගැසුණු රුධිරය යන්නට අමතරව, 'අලකා' යන්නෙහි තේරුම 'ඇලෙන දෙයක්' සහ 'කුඩැල්ලෙකු වැනි ද්‍රව්‍යයකි' යන්න යි. කලලරූපයේ මුල් අවධියේ දී විමසා බැලුවහොත් එය ගර්භාෂයේ බිත්තියට ඇලී ඇති බව අපට පෙනී යයි, එය පාවෙන්නේ නැත. එය කුඩැල්ලෙකු මෙන් පෙනේ. කුඩැල්ලෙකු යනු සමට ඇලී සතෙකුගේ රුධිරය උරා බොන සත්වයෙකි. කලලරූපය වැදෑමහ හරහා මවගෙන් රුධිර සැපයුම ලබා ගනී.

'අලකා' පසුව මුධ්ගා බවට වර්ධනය වේ, එහි අර්ථය 'හපන ලද මස් ගැටිත්තක' යන්නයි. 'අලකා අවධියෙන් පසු කලලරූපය පරීක්ෂා කර බැලුවහොත්, එය දත් සලකුණු සහිත හපන ලද විදුරුමස් මෙන් පෙනේ.

මෙය 7 වන සියවස වන විට කලලරූපයෙහි වර්ධනය පිළිබඳ අල්-කුර්'ආනයේ ලබා දී ඇති විස්මිත රූපමය විස්තරයකි. මෙම හැඩතල සනාථ කිරීමට විද්‍යාඥයින්ට හැකි වී ඇත්තේ 19 වන සියවසේ දී ඡායාරූපකරණ උපකරණ සොයා ගැනීමෙන් පසුව පමණි.

අල්-කුර්'ආනයේ සඳහන් තවත් සිත්ගන්නා කරුණක් නම් කලලරූපය අඳුරු වැස්ම තුනකින් ආරක්ෂා වීමයි. අල්-කුර්'ආනයේ 39:6 වැකියේ අල්ලාහ් මෙසේ පවසයි.

> ඔහු ඔබේ මව්වරුන්ගේ කුස තුළ, අදියර වශයෙන්, එකින් එක, අන්ධකාරයේ වැස්ම තුනකින් ඔබව සාදයි.

කලලරූපය පළමුව මවගේ උදර බිත්තිය, දෙවනුව ගර්භාෂ බිත්තිය සහ තෙවනුව ඇම්නියෝ - කොරියොනික් පටලය මගින් ආරක්ෂා වන බව නවීන තාක්ෂණය භාවිතයෙන් අපි දැන් දනිමු. මෙම වැස්ම තුන මගින් අල්-කුර්'ආනයේ ප්‍රකාශවල නිරවද්‍යතාවය නැවත වරක් පෙන්නුම් කරයි.






වම්පස ඇති පින්තූරයේ දැක්වෙන කලලරූපය ඇත්තේ "මුධ්ගා" අවධියේ දී වන අතර, එය හපන ලද විදුරුමස් කැබැල්ලක් මෙන් පෙනේ. දකුණුපස ඇති පින්තූරයෙන් ගර්භාෂයේ ඇති කලලය ගර්භාෂයේ බිත්තියට ඇලී ඇති අයුරු පෙන්වන අතර, එය ස්ථර තුනකින් ආරක්ෂා වේ.

## කඳුවල ක්‍රියාකාරීත්වය

පෘථිවි කබල මත ඉතා ආකර්ෂණීය හා දර්ශනීය අයුරින් කඳු ස්ථාපිත වී ඇති අයුරු අපි දකිමු. නමුත් ඇත්ත වශයෙන්ම, පෘථිවි කබලේ ස්ථායිතාව පවත්වා ගැනීම සඳහා කඳු ඉතා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. පෘථිවි කබලට පහළින් ඝනකමින් අඩු හා තරලයකින් යුත් තට්ටුවක් ඇත, එබැවින් කබලට එය ස්ථාවරව තබාගැනීමට යමක් අවශ්‍ය වේ. පෘථිවි කබල ස්ථාවරව තබාගන්නේ කඳු බව විද්‍යාඥයින් සොයාගෙන ඇති අතර, ඒවා පෘථිවි කබලට ඉහළින් පවතිද්දී, පෘථිවි කබලට පහළින් මුල් ඇත. මේ අනුව, කඳු ඇණ ආකාරයට ක්‍රියා කරයි.

අල්-කුර්ආනයේ 21:31 හි අල්ලාහ් මෙසේ පවසයි:

> තවද මිහිතලය ඔවුන් සමග කම්පා නොවීමට අපි එහි ස්ථිරසාර දෑ (කඳු) ඇති කළෙමු.

78 වන පරිච්ඡේදයේ 6 සහ 7 වැකිවල අල්ලාහ් මෙසේ පවසයි.

> මිහිතලය යහනාවක් ලෙස හා කඳු කූඤ්ඤ ලෙස අපි නිර්මාණය නොකළෙමු ද?

කඳුකරයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ මෙම වැකි නවීන විද්‍යාත්මක දැනුම සමග සම්පූර්ණයෙන්ම එකඟ වේ. කඳුකරයට මුල් තිබේ යන අදහස 1865 දී න්‍යායාත්මක වූ අතර, මෙම මූලයන් පෘථිවි කබල ස්ථාවර කරයි යන දැනුම 20 වන සියවස අග භාගයේදී වර්ධනය විය.[15]




පෘථිවි ආවරණය තුළ ගැඹුරට ගිය මූලයක් සහිත කන්ද පෙන්වන නිදර්ශනය.

## ජලය යනු ජීවිතයයි

ජීවයේ මූලය ජලය බව සාමාන්‍ය දැනුම වුවත්, අල්-කුර්'ආනය ඊටත් වඩා ඉදිරියට යන්නේ සෑම ජීවියෙකුම ජලයෙන් සෑදී ඇති බව ඇත්ත වශයෙන්ම නිශ්චිතව සඳහන් කිරීමෙනි. ඉහත උපුටා ගත් 21:30 වැකියට අමතරව, 25:54 වැකියේ මෙසේ සඳහන් වේ.

> තවද ජලයෙන් මිනිසා මැව්වේ ඔහුමය: පසුව ලේ ඥාතිත්වයක් හා විවාහ ඥාතිත්වයක් ඇත්තෙකු බවට ඔහුව පත් කළේය. තවද නුඹගේ පරමාධිපති අති බලසම්පන්නය.

ජීව සෛලයකින් 80% ක්ම ජලයෙන් සෑදී ඇති බවත්, සියලු ජීවීන් අවම වශයෙන් 50% ක්වත් ජලයෙන් සමන්විත බවත් දැන් සනාථ වී ඇති කරුණකි. තවද, අප කවුරුත් දන්නා පරිදි, සියලු ජීවීන්ගේ පැවැත්මට ජලය අවශ්‍ය වේ.



ජලය යනු ජීවිතයයි: වෙනස්වන ගෝලීය කාලගුණික රටාව සහ එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂාව හිඟ වීම නිසා ලෝකයේ බොහෝ රටවලින් සත්ව හා ශාක ජීවීන් වඳවෙමින් යයි.

ඉහත විද්‍යාත්මක ප්‍රකාශ මීට වසර 1400 කට පෙර පහළ වූ අල්-කුර්'ආනයෙහි ඇති විද්‍යාත්මක ප්‍රකාශ රාශියෙන් කිහිපයක් පමණි - එකල තාරකා විද්‍යාව, භෞතික විද්‍යාව හෝ ජීව විද්‍යාව පිළිබඳව මිනිසුන් දැනසිටියේ ඉතා අල්ප වශයෙනි. ඒවා නූතන විද්‍යාවන් සමග සම්පූර්ණයෙන්ම එකඟ වන නමුත් ඒවායින් බොහොමයක් විද්‍යාත්මක දැනුමේ දියුණුව නිසා තහවුරු කර ඇත්තේ පසුගිය සියවස තුළ දී ය.[16]

# අල්-කුර්'ආනයේ සත්‍යතාව

අල්-කුර්'ආනය සැබවින්ම දෙවියන් කළ එළිදරව්වක්ද? මෙය වැදගත් ප්‍රශ්නයකි, මන්ද අද ලෝකයේ එකිනෙකාට පටහැනි බොහෝ ශුද්ධ වූ ග්‍රන්ථ හෝ ලියවිලි ඇති නමුත් ඒවා සියල්ලම දෙවියන්ගෙන් යැයි කියති. මෙම ප්‍රශ්නයේ දිගුවක් ලෙස අල්-කුර්ආනය යුග ගණනාවක් තිස්සේ වෙනස් වී නොමැති බවට අපට සහතික විය හැක්කේ කෙසේද යනුවෙන් සමහරු ඇසීමට ඉඩ ඇත:

මෙම ප්‍රශ්නවලට පිළිතුරු සත්‍යය සඳහා නිර්ණායක තුනක් ඉදිරිපත් කරන අල්-කුර්'ආනය තුළම දක්නට ලැබේ.

පළමු නිර්ණායකය

දෙවියන්ගෙන් පැමිණෙන සත්‍ය එළිදරව්වක් මුළුමනින්ම අඛණ්ඩ වන අතර, කිසිදු ප්‍රතිවිරෝධතාවකින් තොර වේ. අල්-කුර්ආනයේ 4:82 හි අල්ලාහ් මෙසේ පවසයි:

> අල්-කුර්'ආනය ඔවුන් පරිශීලනය නොකරන්නෙහු ද? එය අල්ලාහ්ගෙන් තොර වෙනත් කෙනෙකුගෙන් වී නම් එහි ඔවුන් බොහෝ පරස්පරයන් දකිනු ඇත.

ප්‍රතිවිරෝධතා හෝ දෝෂ ඇති කිසිදු ශුද්ධ ලියවිල්ලක් දෙවියන්ගෙන් විය නොහැක. අල්-කුර්'ආනය කිසිදු විෂමතාවයකින් හෝ පරස්පරතාවයකින් තොරය. මෙය යුග ගණනාවක් තිස්සේ කිසිදු මිනිසෙකු විසින් වෙනස් කර නොමැති බව ද ඉන් සනාථ වේ. අල්-කුර්ආනයේ සමහර විචාරකයින් විසින් බොහෝ විට උපුටා දක්වන ලද පරස්පර විරෝධීතාවයන් ලෙස පෙනෙන ඒවා ඇත්තටම අල්-කුර්ආනයේ යොදාගෙන ඇති අරාබි භාෂාව පිළිබඳ නිසි දැනුමක් නොමැතිකම සහ එම වැකිවලින් හෙළි වන සන්දර්භය පිළිබඳව නොදැන කරන චෝදනාවන් ය.

දෙවන නිර්ණායකය

නීති සම්පාදනය, සදාචාරාත්මක සාරධර්ම සහ අධ්‍යාත්මික මඟපෙන්වීම මෙන්ම තර්කය, හේතුව, වාග්චාතුර්යය හා ශෛලිය යන කාරණාවලදී මිනිස් අවශ්‍යතා පුළුල් ලෙස ඉටු කිරීමට ඇති හැකියාව දෙවියන්ගෙන් පැමිණෙන සත්‍ය හෙළිදරව්වක් මඟින් ඉක්මවා යයි. මේ සම්බන්ධයෙන් අල්-කුර්'ආනය ට සමාන පොතක් නිෂ්පාදනය කරන ලෙස අල්ලාහ් මානව වර්ගයාට අභියෝග කර තිබේ. 2:23-24 වැකියේ අල්ලාහ් අවිශ්වාසිකයන් ට අභියෝග කරයි:

> (ප්‍රතික්ෂේපකයිනි, ) අපගේ ගැත්තා (මුහම්මද්) වෙත අප පහළ කළ දෑ (අල්-කුර්'ආනය) පිළිබඳව (ඔහු එය තමා විසින් ගෙතුවේ යැයි) නුඹලා සැකයෙහි පසුවන්නෙහු නම් (එහි ඇති) මෙවැනිම සූරාවක් (පරිච්ඡේදයක්) නුඹලා (ගොතා) ගෙන එවු. තවද අල්ලාහ් හැර (නුඹලා නැමදුම් කරන) නුඹලාගේ සහයකයින්ව (මේ සඳහා) කැඳවා ගනිවු. ("මුහම්මද් එය තමා විසින් ගෙතුවේය" යන නුඹලාගේ ප්‍රකාශයෙහි) නුඹලා සත්‍යවාදීහුව සිටින්නෙහු නම් (මෙය ඉටු කර පෙන්වවු.) එනමුත් නුඹලා (එසේ) නොකළේ නම් - සැබැවින්ම නුඹලාට කිසිසේත් (එසේ) කළ නොහැක්කේමය. - (නිරා) ගින්නෙන් (බිය වී නුඹලාව) ආරක්ෂා කර ගනිවු. එම ගින්නෙහි ඉන්ධන මිනිසුන් හා ගල් වේ. එය ප්‍රතික්ෂේපකයින් සඳහා පිළියෙල කරනු ලැබී ඇත.

අල්ලාහ් 17:88 වැකිය මගින් මෙම අභියෝගය නැවත අවධාරණය කරයි:

> "මෙම අල්-කුර්'ආනය මෙන් යමක් ගෙන ඒමට මිනිසුන් හා ජින්වරුන් ඒකරාශි වී ඔවුන්ගෙන් සමහරෙකු තවත් සමහරෙකුට (එම කර්තව්‍යයට) උදව්කරුවන් ලෙස සිටිය ද මෙවැන්නක් ඔවුන් නොගෙනෙන්නෝය" යැයි (නබිවරය, ) පවසවු.

මෙවැනි අභියෝගයක් ඉදිරිපත් කළ හැක්කේ සර්වඥ මැවුම්කරුට පමණි. කිසිම මිනිසෙකුට පොතක් ලිවීමෙන් පසු, එවැනි පොතක් දැන් හෝ අනාගතයේ නොව කෙදිනකවත් කා හටවත් ලිවිය නොහැකි බව කියාසිටිය නොහැක. තවද, අල්- කුර්'ආනය මිනිසුන් විසින් යුග ගණනාවක් තිස්සේ වෙනස් කර තිබුණේ නම්, ඒ හා සමාන පොතක් නිෂ්පාදනය කිරීමට මිනිසුන්ට හැකි විය යුතු ය. පසුගිය වසර 1400 තුළ සිදු වූවාක් මෙන් මෙම අභියෝගය අදටත් එලෙසින්ම විවෘතව පවතී.

තෙවන නිර්ණායකය

දෙවියන්ගෙන් ආ එළිදරව්වක් කාලයාගේ ඇවෑමෙන් ඇති වන අභියෝග සඳහා ඔරොත්තු දිය යුතු අතර, මානව දැනුම වර්ධනය වන විට හා මානව අවශ්‍යතා වෙනස් වන විට ද එය එලෙසින්ම අදාළ කරගත හැකි විය යුතුය. මීට වසර 1400 කට පෙර අල්- කුර්'ආනය හෙළිදරව් වූ විට එහි සඳහන් වුණු නීතිය හා යුක්තිය, ආර්ථික විද්‍යාව, සමාජ පද්ධති සහ සදාචාරාත්මක සාරධර්ම පිළිබඳ මූලධර්ම අදටත් අදාළ වේ. තවද, 6 වන කොටසේ පෙන්වා ඇති පරිදි අල්-කුර්'ආනය ස්වාභාවික විද්‍යාවන්හි නූතන දැනුමේ සියලු අංග සමග සම්පූර්ණයෙන්ම අනුකූල වේ.

අල්-කුර්ආනය දෙවියන් වහන්සේ හැර වෙනත් අයෙකුගෙන් හෙළිදරව් කෙරුණා නම් හෝ වෙනස් කර තිබුණා නම්, එහි අදාළත්වය යුග ගණනාවක් තිස්සේ අනතුරට ලක්වීමට ඉඩ තිබුණි. අල්-කුර්ආනය මානව දැනුමේ සහ අවශ්‍යතාවයේ සෑම අංශයක් සඳහාම සදාකාලිකවම අදාළ වේ.

මෙම නිර්ණායකයන් අල්-කුර්ආනයේ ඉතිරිව ඇති හෙළිදරව් කිරීම් සමග මානව අවශ්‍යතා සහ මග පෙන්වීම කෙරෙහි දැඩි හා දුරදිග යන බලපෑමක් ඇති කරයි, ඉන් අල්-කුර්ආනයේ ආශ්චර්යමත් ස්වභාවය පෙන්නුම් කරයි. ඔහු විසින් අල්ලාහ්ගේ අභිමතය සහිතව වෙනත් ප්‍රාතිහාර්යයන් පා තිබුණද, සැබවින්ම එය මුහම්මද් නබිතුමා (අල්ලාහ්ගේ සමාදානය හා ආශිර්වාදය ඔහුට ලැබේවා) විසින් ප්‍රකාශ කරන ලද එකම ප්‍රාතිහාර්යය වේ.




අල්-කුර්ආනයේ 7 වන පරිච්ඡේදයේ 86-87 වැකි මුල් පිටපත (දකුණේ) සහ පසුව ලියූ ලියැවිලි (වමේ). නබිතුමාගේ කාලයේ දී, අරාබි ලිවීම ස්වර හෝ අක්ෂර ලකුණු නොමැතිව, මූලික සංකේතවලින් සමන්විත විය (අරාබි බසින් තෂ්කිල් සහ ඉජාම්). ඉස්ලාමය අරාබි නොවන කතා කරන පුද්ගලයින් වෙත පැතිරෙත්ම, අල් කුර්ආනය වැරදි ලෙස කියවීම සහ උච්චාරණය කරන බව දැකිය හැකි විය. මෙම අනතුරට මුහුණදීම සඳහා නබිතුමාගේ මරණයෙන් දශක හයකට පමණ පසු ස්වර සහ අක්ෂර ලකුණු හඳුන්වා දෙන ලදී.

# නබිතුමාගේ සම්ප්‍රදායන්

නබිතුමාගේ සම්ප්‍රදායන් (අරාබි බසින් සුන්නා හෝ සුනන්) යනු දිව්‍යමය ආනුභාවයෙන් (අල් කුර්ආනය 53:3) නබිතුමා කළ ඉගැන්වීම් සහ ඔහු විසින් දෙන ලද ජීවන උදාහරණ වන අතර, ඒවා ඔහුගේ සගයන් විසින් බෙදාහරින ලදී / වාර්තා කරන ලදී. ඒවා අල්-කුර්'ආනයෙන් සුවිශේෂී ලෙස වෙනස් වන අතර, අල්-කුර්'ආනයට පසුව ඉස්ලාමීය ඉගැන්වීම්වල දෙවන ප්‍රාථමික මූලාශ්‍රය වේ.

නබිතුමාගේ ජීවිත කාලය තුළ හෙළිදරව් කර, වාර්තා කර සහ සම්පාදනය කරන ලද අල්-කුර්'ආනය මෙන් නොව, නබිතුමාගේ සම්ප්‍රදායන් ප්‍රධාන වශයෙන් වාර්තා කර සම්පාදනය කරන ලද්දේ ඔහුගේ මරණයෙන් පසුවය (ක්‍රි.ව. 632). සම්ප්‍රදායන් වාර්තා කිරීම නබිතුමාගේ මරණයෙන් ඉක්බිතිව ආරම්භ වූ නමුත්, ඒවා සමුච්චිත පොත් ලෙස සම්පාදනය 8 වන සියවසේ මැද භාගය වන විට ඉතා උනන්දුවෙන් ආරම්භ වූ අතර, එය 9 වන සියවස වන විට වැඩිදියුණු කොට සිදුකරගෙන යන ලදී. නිදසුනක් වශයෙන්, මුස්නද් අර්-රබී බින් හබීබ් සම්පාදනය කරන ලද්දේ 8 වන සියවස අග භාගයේදී ය. සහීහ් අල් බුහාරි සහ සහීහ් මුස්ලිම් ක්‍රි.ව. 9 වන සියවසේ මුල් වරට සම්පාදනය කරන ලදී.

සම්ප්‍රදායන් කාලයාගේ ඇවෑමෙන් මිනිසුන්ගේ දාමයක් මගින් විස්තර කර සම්ප්‍රේෂණය කරන විට, සම්ප්‍රදායන් සත්‍යාපනය කිරීම සඳහා විස්තීර්ණ ක්‍රමවේදයක් විකාශනය විය. ක්‍රමවේදය මගින් ආඛ්‍යාන දාමය, සම්ප්‍රදායන්හි අන්තර්ගතය සහ විශේෂිත සම්ප්‍රදායන් සිදුවී ඇති බවට වාර්තා වූ සන්දර්භය සෝදිසි කරන ලදී. මෙම ක්‍රමවේදය මගින් සම්ප්‍රදායන්වල අව්‍යාජභාවය කාණ්ඩ කිහිපයකට වර්ග කරන ලදී. මෙම සත්‍යාපන ක්‍රමවේදය (අරාබි බසින් ඉස්නාද්) මුල් එකතුවට එකතු වී ඇති ව්‍යාජ සම්ප්‍රදායන් තීරණය කිරීම සඳහා අද පවා භාවිතා කරයි.

ඉස්ලාමීය මඟපෙන්වීම සහ එහි නීති සම්පාදනය කිරීමේ දී නබිතුමාගේ සම්ප්‍රදායන් පහත සඳහන් කාර්යභාරය ඉටු කරයි:

1. අල්-කුර්'ආනයේ හෙළිදරව් කරන ලද වැකිවල අරමුණු පැහැදිලි කර ඒවායේ අර්ථයන් විස්තර කිරීම.
2. අල්-කුර්'ආනයෙන් පසු ඉස්ලාමීය නීතියේ දෙවන ප්‍රාථමික මූලාශ්‍රය ඉන් නිර්මිත වන අතර, අවසර දී ඇති දේ සහ තහනම් කර ඇති දේ සම්බන්ධයෙන් ඔවුන්ගේ තීන්දු අල්-කුර්ආනය හා සමාන තත්ත්වයක් උසුලයි.

3. අල්-කුර්'ආනයේ තහනම් නියෝග බලගන්වමින් එහි අධිකාරිය පිළිබඳව සාක්ෂි දැරීම.

4. අල්- කුර්'ආනයෙහි අණ කර ඇති නැමදීමේ ක්‍රියා සිදුකරන අයුරු ගැන විස්තර කිරීම.

5. අල්-කුර්'ආනයේ අඩංගු ආචාර ධාර්මික වටිනාකම් පිළිබඳව පැහැදිලි කරමින්, උදාහරණ ලබාදීම.

පහත දැක්වෙන්නේ නබිතුමාගේ සම්ප්‍රදායන් සඳහා වූ උදාහරණ තුනකි.

> නබිතුමාණන් (අල්ලාහ්ගේ සාමය හා ආශිර්වාදය ඔහු කෙරෙහි වේවා) පවසා ඇති බව ඉබ්නු අබ්බාස්ගෙන් ජාබීර් බින් සෙයිද් දැනගත් පරිදි අබූ උබයිදා වාර්තා කරයි: "අපට වංචා කරන කෙනෙක් අපේ කෙනෙක් නොවේ. අපේ ලාබාලයන්ට දයාව නොදක්වන සහ අපේ වැඩිහිටියන්ට ගෞරව නොකරන කිසිවෙක් අපේ කෙනෙක් නොවේ". (මුස්නද් අර්-රබී බින් හබීබ්, හදීස් අංක 582)

> අබු අල්-මින්හාල් වාර්තා කළේය. "මම අල්-බරා බින් අසිබ් සහ සයිද් බින් අර්කම්ගෙන් මුදල් හුවමාරුව පිළිබඳව විමසුවෙමි. 'ඔවුන් පිළිතුරු දෙමින්, අපි අල්ලාහ්ගේ දූතයාගේ (අල්ලාහ්ගේ සාමය හා ආශිර්වාදය ඔහු කෙරෙහි වේවා) කාලයේ වෙළඳුන් වූ අතර, අපි මුදල් හුවමාරුව ගැන ඔහුගෙන් විමසුවෙමු. ඔහු පිළිතුරු දුන්නේ, 'එය අතින් අතට නම්, එහි කිසිදු හානියක් නැත, එසේ නොමැති නම් එය අවසර නැත.'" (සහීහ් අල් බුහාරි, විකුණුම් පිළිබඳ පොත, හදීස් අංක 276)

> අල්ලාහ්ගේ පණිවිඩකරුවාණන් (අල්ලාහ්ගේ සමාදානය සහ ආශිර්වාදය ඔහුට ලැබේවා) පැවසූ බවට අබු හුරෙයිරා වාර්තා කරයි: "ස්ත්‍රියක් සමග කතාබස් නොකරන තෙක් ඇය විවාහ කර නොදිය යුතු අතර, කන්‍යාවක් ඇයගේ අවසරය ලබා නොදෙන තෙක් විවාහ නොවිය යුතුය. ඔවුන් නබිතුමාගෙන් ඉල්ලා සිටියේ, ඇයගේ (කන්‍යාවගේ) කැමැත්ත ලබා ගන්නේ කෙසේ ද?'නිහඬ බව යනුවෙන් ඔහු පිළිතුරු දුන්නේය. (සහීහ් මුස්ලිම්, විවාහ පිළිබඳ පොත, පොත 008, අංක 3303)

මෙම උදාහරණ නබිතුමාගේ සම්ප්‍රදායන් බොහොමයක් අතර කිහිපයකි - ඒවායින් නීතිය විස්තර කරන අතර සමාජ සම්මතයන් පිළිබඳ මඟපෙන්වීමක් ලබා දේ.

# මරණයෙන් පසු ජීවිතය

මරණය නොවැළැක්විය හැකි අතර, එබැවින් මරණින් මතු ජීවිතයේ යථාර්ථයට මුහුණ දිය යුතුය. කෙනෙකුට එය මුළුමනින්ම ප්‍රතික්ෂේප කළ හැකිය, එනම් මරණයෙන් පසු කිසිවක් නැත යන මතය වින්දනය කළ හැකි අතර තවත් කෙනෙකුට එය නොසලකා හරිමින් සියල්ල හොඳින් සිදු වේ යැයි උපකල්පනය කළ හැක. නමුත් මේ අවස්ථා දෙකේදී ම ඔවුන් කෙළින්නේ සූදුවකි - ඒ මරණින් මතු ජීවිතය යනු සදාකාලික පැවැත්ම නම් ඉතා බැරෑරුම් කාරණය පිළිබඳව වන නිසාය. කෙනෙකුට ඒ ගැන කළ හැකි වඩාත්ම සංවේදී දෙය නම් එය අපේක්ෂා කිරීම සහ ඒ පිළිබඳව යමක් කිරීමයි. ආගම යනු පරලොව අපගේ සදාකාලික පැවැත්ම සඳහා අපේ සූදානම් වීමයි.

පරලොවක් ඇති බවට ඔප්පු කිරීම

ආගම කෙරෙහි ඇති විශ්වාසයට අමතරව, මරණින් මතු ජීවිතයේ යථාර්ථය තර්කානුකූලව හා පොදු සංවේදනය ආධාරයෙන් අපෝහනය කරගත හැක. පහත දැක්වෙන තර්ක සලකා බලන්න:

1 වන තර්කය: දෙවියන්ගේ මැවීම් අතර වන මිනිසා සතුව හේතු දැක්වීමේ හැකියාව සහ අභිමතයක් කිරීමේ නිදහසක් ඇත. මෙම ලක්ෂණ මගින් අනෙකුත් සියලුම මැවීම් අභිබවා යාමට අධ්‍යාත්මික, භෞතික හා ද්‍රව්‍යමය හැකියාවන් ලබා දේ. මේ හේතුව නිසා, ආදම්ව මැවීමෙන් පසු දෙවියන් විසින් සුරදූතයන්ට අණ කරනු ලැබුවේ මෙම මහා විභවය පිළිගැනීමේ ලකුණක් ලෙස ඔහුට ආචාර කරන ලෙසයි.[17] ඒ අනුව, මිනිසා විශ්වයේ අභුමුලු සොයා යන අතර, ලෝකයේ ඕනෑම පෙදෙසක සිටින තවත් කෙනෙක් සමග එවෙලේම සන්නිවේදනය කිරීමේ හැකියාව, ජාන නවීකරණය කළ ආහාර නිපදවීම, කෘතීම බුද්ධිය හඳුන්වාදීම සහ මිනිසාගේ දැනුම තවත් ව්‍යාප්ත වෙද්දී එවැනි බොහෝ සංවර්ධන පියවර ඉදිරියට ද ඒමට නියමිත ය. දැන්, මනුෂ්‍යයා නම් වූ මෙම ශ්‍රේෂ්ඨ මැවීම කිසිදු දිව්‍යමය අරමුණක් හෝ දිව්‍යමය සැලසුමක් සඳහා නොවන්නට හේතුවක් නැත. ජීවත් වීම හා මරණය හැර වෙන යම් දෙයක් නොමැත. පුරාතනයේ මිනිසුන් මෙලෙස කල්පනා කළ අතර, ඒ ගැන අල්-කුර්'ආනය අපට මෙසේ පවසයි:

> "මෙය අපගේ ලෞකික ජීවිතය මිස නැත. (එහි) අපි මරණයට පත්වන්නෙමු. තවද ජීවත් වන්නෙමු. කාලය මිස වෙන කිසිවක් අපව විනාශ නොකරන්නේයැ"යි ඔවුහු පැවසුවෝය. තවද ඒ පිළිබඳව ඔවුනට කිසිදු දැනුමක් නැත. ඔවුන් අනුමාන කරන්නන් මිස නැත. (අල්-කුර්'ආනය 45:24)

ඇත්ත වශයෙන්ම, මරණයෙන් පසු කිසිවක් නැත යන මතය හුදු අනුමානයකි!

2 වන තර්කය: විශ්වයේ ඇති සෑම දෙයක්ම දෙවියන්ගේ දැනුමේ සහ නිර්මාණයේ අවසාන පරිපූර්ණත්වය දෙසට අපේ අවධානය යොමු කරවයි. එසේ වුවද, මිනිසුන් සැමවිටම ජීවත් වන්නේ මේ ලෝකයේ වඩා තෘප්තිමත් ජීවිතයක්, සමාන්තර ජීවිතයක් අපේක්ෂා කරමිනි. මෙය අපගේ ලෞකික පැවැත්මේ අසම්පූර්ණකම පෙන්නුම් කරයි; අපගේ ජීවිත කෙතරම් සැපපහසු සහ සම්පූර්ණ වුවත්, අපට නිශ්චිතවම නිර්වචනය කළ නොහැකි පරමාදර්ශී ජීවිතයක් සඳහා මිනිසුන් නිතරම අපේක්ෂාවෙන් හා ආශාවෙන් බලා සිටින අතර, ඒ නිසාමදෝ අපට එය කරා ළඟා විය නොහැක - ඉන් අපට අසතුට සහ අපේක්ෂා භංගත්වයක් ඇති වේ. අප අපේක්ෂා කරන මෙම සමාන්තර ජීවිතය යනු ඇත්ත වශයෙන්ම දෙවියන් වහන්සේගේ මැවීමේ අවසාන පරිපූර්ණත්වය සම්පූර්ණ කරන්නා සේ වන මරණින් මතු ජීවිතයයි. මේ ලෝකයේ අපගේ පැවැත්ම පරිපූර්ණ නොවූවද, එය සදාකාලික හා පරිපූර්ණ වූ ඊළඟ ජීවිතයට අපව සූදානම් කිරීම සඳහා නිර්මිත තාවකාලික එකකි.

3 වන තර්කය: මිනිසුන් මවා ඇත්තේ තෝරාගැනීමේ නිදහස සමගිනි; අපෙන් සමහරෙක් ධර්මිෂ්ඨ විය හැකි අතර, අපෙන් සමහරෙකුට නපුරු හා දුෂ්ට වීමට තෝරාගත හැකිය. දුෂ්ටයන් සෙසු මිනිසුන්ට බොහෝ දුක් වේදනා ගෙන දෙන අතර විවිධ හේතූන් මත ඒවායේ ප්‍රතිවිපාකවලින් ගැලවී යයි; බලවත් තනතුරක් හෙබවීම සහ බලපෑම් කිරීමේ හැකියාව, මානව නීතිවල දුර්වලතා, නීති පද්ධතිවල දූෂණය යනාදිය. කිසිදු මනුෂ්‍යයෙකුට දඬුවම් දී අවසන් කළ නොහැකි තරම් අපරාධ සමහරු කරති. මිනිසුන් මිලියනයක් අසාධාරණ ලෙස ඝාතනය කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු පුද්ගලයෙකු ගැන සලකා බලන්න; එවැනි පුද්ගලයෙකුට සැබවින්ම සාධාරණය ඉටු කළ හැක්කේ කිනම් ආකාරයේ දඬුවමකින් ද? අවසාන යුක්තිය මෙලොව දී කිසි විටෙකත් ඉටුකළ නොහැකිය. සැබෑ යුක්තිය පිළිබඳ අපගේ බලාපොරොත්තුව ඉටු කරගත හැක්කේ පරලොව දී පමණි. ඇත්ත වශයෙන්ම, පරලොවක් නොමැති නම් එය මුළුමනින්ම අසාධාරණ වනු ඇත.

4 වන තර්කය : කලින් සඳහන් කළ පරිදි, මිනිසාව නිර්මාණය කර ඇත්තේ යථාර්ථය පිළිබඳ ස්වභාවික පිළිගැනීමක් සහිතවය. (අරාබි භාෂාවෙන් ෆිත්රා). මේ අනුව, මානව ඉතිහාසය පුරාම මානව වර්ගයාගේ අතිමහත් බහුතරය මරණින් මතු ජීවිතය විශ්වාස කරන බව අපට පෙනී යයි. උදාහරණ වශයෙන්, පැරණි ශිෂ්ටාචාරවල ඓතිහාසික වාර්තා පෙන්නුම් කරන්නේ මිනිසුන් ඔවුන්ගේ මරණයෙන් පසු අඛණ්ඩ පැවැත්මකට සංක්‍රමණය වීමට සූදානම් වූ සිටි බවයි. මරණය වෙනත් තලයක, නව ලෝකයක ආත්මයේ පැවැත්මකට මඟ

පෙන්වන බව ඔවුන් හොඳින් හඳුනා ගත්හ.

5 වන තර්කය: මානව ශිෂ්ඨාචාරය ධනාත්මක ලෙස පරිවර්තනය කර ඇති සහ අදටත් අඛණ්ඩව මනුෂ්‍යත්වය මත ගැඹුරු බලපෑමක් ඇති කරන (a) ස්වාභාවික විද්‍යාවන්හි බොහෝ සංසිද්ධි (6 වන කොටස බලන්න), (b) ඓතිහාසික සිදුවීම්, (c) නීති සහ සදාචාර ප්‍රමිති පිළිබඳව අල්-කුර්'ආනය විස්තර කරයි: මෙම විස්තර කිසිවක් අසත්‍ය හෝ අවලංගු බව මෙතෙක් පෙන්වා දී නැත. අල්-කුර්'ආනයේ මෙලෙස ස්ථාපිත වී ඇති නිරවද්‍යතාවය සහ වලංගු භාවයක් ඇති විට, අල්-කුර්'ආනය මෙතරම් සවිස්තරාත්මකව කියාපාන මරණින් මතු ජීවිතයේ යථාර්ථය ගැන යමෙකු ප්‍රශ්න කරන්නේ ඇයි?

ඉහත තර්ක හරහා ඕනෑම කෙනෙකුට ඒත්තු යා යුත්තේ මරණින් මතු ජීවිතය යථාර්ථයක් පමණක් නොව අවශ්‍යතාවයක් බවයි. එපමණක් නොව, එහි පැවැත්මක් නොමැති බවට යෝජනා කරන තර්ක මොනවාද?

මරණය සහ මරණින් පසු ජීවිතය පිළිබඳ ඉස්ලාමීය ඉගැන්වීම්

මිනිස් ආත්මය එහි සදාකාලික පැවැත්මේ දී විවිධ අවධීන් හරහා ගමන් කරයි. මේ ලෝකයේ අපි ගෙවන ජීවිතය අපගේ පැවැත්මේ ඊළඟ අදියර සඳහා සූදානම් වීමකි. මරණය අපගේ පැවැත්මේ ඊළඟ අදියරෙහි ආරම්භය සනිටුහන් කරයි, එය 'මරණය සහ නැවත නැගිටීම අතර අතරමැදි තත්ත්වය' වේ. මෙම අදියර අරාබි බසින් බර්සාක් ලෙස හැඳින්වේ. එය පූර්ණ අධ්‍යාත්මික විඥානයකින් යුතුව, වෙනත් පැවැත්මක, වෙනස් තලයක අවදි වී මිනීවළේ ගතකරන කාලයයි. මෙම භූමික ජීවිතය ගතකරන අතරතුර, මරණින් මතු ජීවිතය සඳහා සූදානම් වී සිටින අයට ඉදිරියේ ඇත. සැප සහ තෘප්තියේ අපේක්ෂාව නිසා ප්‍රීතිය හා සහනය අත්විඳිය හැකි අතර, මරණින් මතු ජීවිතයේ යථාර්ථය නොසලකා හැරිය අය ඉදිරියේදී ඇති විය හැකි විපත් හේතුවෙන් ඉමහත් පසුතැවිල්ලට පත්වනු ඇත. අල්-කුර්'ආනය අපට දන්වා සිටින්නේ මෙම ප්‍රතිවිරුද්ධ තත්ත්ව දෙක මරණයට පත්වන මොහොතේදීම සුරදූතයන් විසින් අදාළ ආත්මයට ප්‍රකාශ කරන බවයි:

> සැබැවින්ම "අපගේ පරමාධිපති අල්ලාහ්" යැයි (විශ්වාසයෙන් යුතුව) පවසා පසුව (එහි) ස්ථිරව සිටියවුන් (පිළිබඳව නම්) මලක්වරුන් ඔවුන් වෙත (මරණාසන්න මොහොතේ දී මෙලෙස පවසමින්) පහළ වෙති. "නුඹලා බිය නොවවු. තවද නුඹලා දුක් නොවවු. නුඹලාට ප්‍රතිඥා දෙනු ලබමින් සිටි (ස්වර්ග) උයන පිළිබඳව නුඹලා ශුභාරංචි ලබා ගනිවු. (අල්-කුර්'ආනය 41:30)
>
> මලක්වරුන් (යුද පිටියෙහි) ප්‍රතික්ෂේප කළවුන්ව ඔවුන්ගේ මුහුණු වලට ද, ඔවුන්ගේ පිටවලට ද පහර දෙමින් "ඇවිළෙන

ගින්නෙහි දඬුවම භුක්ති විඳිවු" යැයි (පවසමින්) ඔවුන්ව මරණයට පත් කරන අවස්ථාවෙහි (ඔවුන්ගේ තත්ත්වය) නුඹ දකින්නේ නම් (එවිට නුඹට භයානක දැයක් දර්ශනය වනු ඇත). (අල්-කුර්ආනය 8:50)

මිනීවළේ මෙම කාල පරිච්ඡේදය මරණින් මතු ජීවිතයේ පළමු අදියර වන අතර, එය අපගේ භූමික ජීවිතයේ දී අප විසින් කර ඇති තේරීම්වල ප්‍රතිවිපාක පෙන්වාදෙයි. නබිතුමා මෙසේ පැවසූ බව වාර්තා වී ඇත; "මිනීවළ යනු ඊළඟ ජීවිතයේ පළමු අදියරයි. යමෙක් එය හරහා ආරක්ෂිතව ගමන් කරන්නේ නම්, ඉන් පසුව එළඹෙන දේ ඊට වඩා පහසුය. කෙසේ වෙතත්, මෙම පළමු අදියරේදී යමෙකු අසමත් වුවහොත්, ඉන් පසුව එළඹෙන දේ ඊට වඩා දරුණු ය".

ආත්මය මෙම අතරමැදි තත්ත්වයෙන් කාලාවසානය තෙක් හෝ නියමිත පැය දක්වා පවතී. අප දන්නා පරිදි, භෞතික මැවීම පරිණාමනය වන්නේ නව පැවැත්මක් ඇති නව ලෝකයක් පරිවර්තනය වන විටයි. මෙය අල්-කුර්ආනයෙහි විචිත්‍රවත් ලෙස විස්තර කර ඇති වැදගත් සිදුවීමකි. උදාහරණයක් ලෙස 22:1-2 හි අල්ලාහ් මෙසේ පවසයි;

ජනයිනි, නුඹලාගේ පරමාධිපතිට බිය භක්තිමත් වවු. සැබැවින්ම (ලොව අවසන්) හෝරාවේ කම්පනය මහත් වූ දෙයකි. නුඹ එය දකින දින සෑම කිරි දෙන ස්ත්‍රියක්ම තමන් කිරි පෙවූ අය(දරුවන්) ගැන අමතක කරනු ඇත. තවද ගැබ් ගත් සෑම ස්ත්‍රියක්ම ඇයගේ ගැබ ප්‍රසූත කරනු ඇත. තවද නුඹ ජනයින්ව, ඔවුන් මත් බවින් නොවූවන්ව සිටිය දී මත් වූවන් ලෙස දකිනු ඇත. එනමුත් අල්ලාහ්ගේ දඬුවම (ඉතා) දැඩිය.

කාලයාගේ ඇවෑමෙන් නව ලෝකය ආරම්භ වන අතර, එය මළවුන්ගේ උත්ථානයෙන් ආරම්භ වී මුළු මිනිස් සංහතියම නැවත ප්‍රතිනිර්මාණය වනු ඇත. අල්-කුර්ආනය මෙම දිනය විස්තර කරන්නේ ප්‍රතික්ෂේප කරන්නන්ට සැබවින්ම අසීරු දිනයක් වන බවයි - ඔවුන්ට ඔවුන්ගේ මාර්ග ශෝධනය කළ හැකි වීම පිණිස ඔවුහු මිහිපිට ජීවත්වීමේ දෙවන අවස්ථාව ඉල්ලා සිටී. විශ්වාසිකයන් ට මෙම දිනයේ දී බිය වීමට කිසිවක් නැත.[18]

අවසාන විනිශ්චය සඳහා මනුෂ්‍යත්වය එක්රැස් වනු ඇත. අල්-කුර්ආනය විසින් බොහෝ ආකාරවලින් විස්තර කරන තරමටම වැදගත් විනිශ්චය දිනය මෙයයි. කණගාටු දිනය (19:39), ජයග්‍රාහී දිනය (32:29), විපත් දිනය (76:10), බරින් වැඩි දිනයක් (76:27), අතිවිශිෂ්ට දිනයක් (19:37), ගණනය කළ දිනය (38:16, 40:27) ලෙස නොයෙකුත් ආකාරයෙන් මේ පිළිබඳව සඳහන් වේ. විනිශ්චය දිනය යනු අපගේ ආත්මික වටිනාකම අපගේ ස්වාමින්

වහන්සේ විසින් විනිශ්චය කරනු ලබන දිනයයි. එය ධර්මිෂ්ඨයන් සඳහා මහත් ප්‍රීතියෙන් හා ප්‍රීතිමත් අපේක්ෂාවන්ගෙන් යුත් දිනයක් වන අතර දෙවියන් වහන්සේව ප්‍රතික්ෂේප කරන්නන් සහ මේ විනිශ්චය දිනය වන අවසාන දිනය ගැන පසුතැවිලි වී විලාප දෙන දිනයකි. අල්-කුර්'ආනයේ පහත දැක්වෙන වැකිවලින් මෙම අවස්ථා දෙක සාරාංශ කොට ඇත:

> අහෝ මිනිස, සැබැවින්ම නුඹ නුඹගේ පරමාධිපති වෙත යෑමට (තම ක්‍රියාවන්හි) දැඩි වෙහෙසකින් වෙහෙස දැරිය යුත්තෙකි. එවිට (නුඹගේ ක්‍රියාවන් සමග) ඔහුව හමු වනු ඇත. තම වාර්තාව තම දකුණතට දෙනු ලැබූ අය පිළිබඳව (සඳහන් කරන්නේ) නම් ඔහු පහසු ගිණුම් බැලීමකින් විමසුමකට ලක් වනු ඇත. පසුව තම ජනයා වෙත ඔහු සතුටින් හැරී යන්නේය. තම වාර්තාව තම පිටු පසින් (වමතෙහි) දෙනු ලැබූ අය පිළිබඳව (සඳහන් කරන්නේ) නම් ඔහු විනාශය (මරණය) අයැදිනු ඇත. තවද ඇවිළෙන ගින්නෙහි පිවිස දැවෙනු ඇත.- සැබැවින්ම ඔහු (ලොවෙහි ජීවත්ව සිටිය දී) තම ජනයා අතර සතුටින් සිටියේය. සැබැවින්ම ඔහු (අල්ලාහ් වෙතට) කිසිවිටෙක නැවත හැරී නොයනු ඇතැයි සිතුවේය. (අල්-කුර්'ආනය 84:6-14)

ඉස්ලාමය අපට උගන්වන්නේ පරලොව දී ධාර්මිකයන් ඔවුන්ගේ පවුල්වල ධාර්මික සාමාජිකයන් හා ආදරණීයයන් සමග එක්වන බවයි;[19] අපගේ දෙමව්පියන්, සහෝදර සහෝදරියන්, දරුවන්, පාරාදීසයේ සිටින අපගේ මිතුරන් හමුවීම මොනතරම් සතුටක්ද? එහෙත් දුෂ්ටයන්ට එය සම්පූර්ණයෙන්ම තහනම් අවස්ථාවක් වනු ඇත; ඔවුන් කවදාවත් නොසිටින්නට කැමති වනු ඇත:

> සමීප දඬුවමක් පිළිබඳව සැබැවින්ම අපි නුඹලාට අවවාද කළෙමු; මිනිසා තම දෑත් පෙරටු කර ගත් දෑ දැක බලා ගන්නා දින "අහෝ! මා (මෙලොව) දූවිලි බවට පත් වූයෙම් නම්" යැයි ප්‍රතික්ෂේපකයා පවසනු ඇත. (අල්-කුර්'ආනය 78:40)



ඕමානයේ සුල්තාන් ඛබූස් මහ දේවස්ථානයේ අතුරා ඇති බුමුතුරුණු

# වෙනත් ආගම් පිළිබඳ ඉස්ලාමීය දැක්ම

මිනිසුන් නිර්මාණය කර ඇත්තේ ස්වාභාවිකවම මැවුම්කරුවා පිළිගැනීම සඳහා වූ නැඹුරුවක් හා සහජ මූලික සදාචාරාත්මක සාරධර්ම (අරාබි බසින් ෆිත්රා) සමගිනි. මිනිස් සංහතියේ මෙම ස්වාභාවික නැඹුරුව අවදි කිරීම සඳහා දෙවියන් වහන්සේ සියලු ජාතීන් වෙනුවෙන් ශාස්තෘවරුන් රැසක් යවා ඇත. නීති-රීති සහ නමස්කාර ක්‍රම වෙනස් වුවද, මෙම සියලු ශාස්තෘවරුන් සඳහා දෙවියන් වහන්සේගේ පණිවුඩය සෑම විටම මූලික විශ්වාසය - එනම්, දිව්‍යමය ඒකීයභාවය, පරලොව හා ධාර්මිකත්වය පිළිබඳ විශ්වාසයට අනුකූල වේ.[20] අල්ලාහ් අල්-කුර්'ආනයේ 42:13 හි මෙසේ පවසයි;

> නුඹට දහමින් කවර දෙයක් පිළිබඳව ඔහු (අල්ලාහ්) උපදෙස් දුන්නේ ද, එයම නුඹලාට ද ආගමික පිළිවෙත බවට ඔහු පත් කළේය. තවද (එම පිළිවෙත අල්ලාහ් වන) අප නුඹ වෙත වහී පහළ කළ දෑ හා ඉබ්රාහීම්ට ද මූසාට ද ඊසාට ද උපදෙස් දුන් දෑම ය. (එනම්) නුඹලා දහම ස්ථාපිත කරවු. එහි නුඹලා භේදභින්න නොවවු යන්නයි. ආදේශ තබන්නන්ට නුඹ කවර දෙයක් වෙත කැඳවන්නෙහි ද එය ඔවුන් කෙරෙහි අසීරුතාවක් විය. අල්ලාහ් අභිමත කළ අයව තමන් වෙත තෝරා ගන්නේය. තවද කවරෙකු (යහමඟ පතා) යොමු වන්නේ ද ඔහුට (අල්ලාහ්) මඟ පෙන්වන්නේය.

මුල් පණිවුඩ වලින් ක්‍රමයෙන් බැහැරවීම හේතුවෙන් ආගම හා ආගමේ විවිධත්වය කාලයත් සමග මතුවී තිබේ. අල්-කුර්'ආනය හරහා අල්ලාහ් මනුෂ්‍යත්වයට ආරාධනා කරන්නේ මිනිස් ඉතිහාසයේ පසුකාලීන ශාස්තෘවරුන්ගේ මුතුන් මිත්තෙකු වූ ද, සැබෑ ඒකදේවවාදී විශ්වාසිකයෙකු වූ ඒබ්‍රහම්ගේ මූලික ඇදහීම වෙත ආපසු යන ලෙසයි. එබැවින් ඉස්ලාමීය දෘෂ්ටි කෝණයෙන් බලන කල, සියලු ආගම් එකිනෙකට වෙනස් වර්ග දෙකකට අයත් වේ.

## 1. ඒකදේවවාදී ආගම්

යුදෙව් ධර්මය, ක්‍රිස්තියානි ධර්මය සහ ඉස්ලාම් යනු ඒබ්‍රහම් නබිතුමාගේ ඒකදේවවාදී සම්ප්‍රදායන් බෙදාගන්නා ආගම් වේ. මෙම ආගම් තුනම ඔවුන්ගේ නිර්මල ස්වරූපයෙන් විශ්වාසයේ සහ ආගමේ එකම මූලික මූලධර්ම සහිතව පවතී.

අල්-කුර්'ආනයේ බොහෝ වැකිවල යුදෙව්වන් හා කිතුණුවන් "ග්‍රන්ථ ලත් ජනයා" ලෙස හැඳින්වේ.[21] මෙයින් අදහස් කරන්නේ ඔවුන් ශුද්ධ දිව්‍ය ලියවිලි වන ටෝරාව සහ එවැන්ජල් (සුවිශේෂය) සමග සම්බන්ධ වූ අය බවයි. කෙසේ වෙතත්, වර්තමාන ස්වරූපයෙන් ඇති මෙම ශුද්ධ ලියවිලි ඔවුන්ගේ ශාස්තෘවරුන් වන මෝසෙස්ගේ සහ ජේසුස්ගේ (ඔවුන්ට සාමය ලැබේවා!) මුල් පණිවුඩ නොවේ.[22] එහි ප්‍රතිඵලයක් වශයෙන් යුදෙව් ආගම හා ක්‍රිස්තියානි ධර්මය මෝසෙස්ගේ සහ ජේසුස්ගේ (ඔවුන්ට සාමය ලැබේවා!) සැබෑ ඉගැන්වීම් හා නොගැලපෙන ආගම් ලෙස ඉස්ලාමය විසින් සලකයි.

අල්-කුර්'ආනය එළිදරව් කරනු ලැබුවේ මෝසෙස්ගේ සහ ජේසුස්ගේ (ඔවුන්ට සාමය උදා වේවා) පණිවුඩ සනාථ කිරීමට හා සම්පූර්ණ කිරීමට පමණක් නොව, ඔවුන්ගේ පණිවිඩවල ඉතිරිව ඇති අපගමන නිවැරදි කිරීමට ද ය.[23] මේ හේතුව නිසා, ඉස්ලාමීය දෘෂ්ටි කෝණයෙන්, මෝසෙස්ගේ සහ ජේසුස්ගේ (ඔවුන්ට සාමය ලැබේවා!) පණිවිඩ අනුගමනය කරන සැබෑ අනුගාමිකයන් අල්-කුර්'ආනය අනුගමනය කරන අය වේ.

## 2. වෙනත් ආගම්

යුදෙව් ආගම හා ක්‍රිස්තියානි ධර්මය හැර වෙනත් ආගම් සම්බන්ධයෙන්, උදා. හින්දු ධර්මය, බුද්ධාගම සහ වෙනත්, ඒවා සාම්ප්‍රදායික අනාවැකිමය පණිවුඩවලින් ඈත් වූ ඒවා බව ඉස්ලාම් දහම සලකන අතර, ඒ අනුව ඒවා ඒබ්‍රහමික සම්ප්‍රදායන් හා සම්බන්ධ නොවන ආගම් ලෙස සලකයි. මෙම ආගම්වලින් සමහරක් අදේවවාදයට නැඹුරු වන අතර, තවත් සමහරු එකම සැබෑ දෙවියෙකු වන අල්ලාහ්ට නමස්කාර කිරීමෙන් බැහැරව වෙනත් දෙවිවරුන්ව ඔහු සමග ආදේශ කරති. එකම සත්‍ය දෙවියා සමග වෙනත් දෙවිවරුන් ආදේශ කිරීම, දිව්‍යමය ඒකීයභාවයේ මූලධර්ම සමග පටහැනි වේ. (3 වන කොටස බලන්න).

කෙසේ වෙතත්, මේ සියලු වෙනස්කම් තිබියදීත්, ඉස්ලාමය සියලු විශ්වාසයන්ට මෙන්ම මෙම විශ්වාසයන් අනුගමනය කරන පුද්ගලයින්ටද ගරු කරයි, ඒ අල්ලාහ් මනුෂ්‍ය වර්ගයා මැවූ අතර විශ්වාසය පිළිබඳ කාරණාවලදී අපට තෝරා ගැනීමේ නිදහස ලබා දී ඇති නිසා ය. ඔහු අල්-කුර්'ආනයේ 10:99 හි ඔහු මෙසේ පවසයි;

> එය ඔබගේ ස්වාමීන්ගේ කැමැත්ත නම්, ඔවුන් සියල්ලන්ම විශ්වාස කරනු ඇත, මිහිපිට සිටින සියල්ලන්! එසේනම් ඔබ

විශ්වාස කිරීමට මිනිස් සංහතියට බල කරනවාද?

මෙය තවත් වැකියක, 2: 256: හි යළි අවධාරණය කෙරේ.

(ඉස්ලාම්) දහමෙහි බල කිරීමක් නැත. සැබැවින්ම ඍජු මග සදොස්භාවයෙන් වෙන්ව පැහැදිලි විය.

මේ අනුව, මනුෂ්‍ය වර්ගයා මැවීමේ අල්ලාහ්ගේ සැලසුමට විශ්වාසයේ විවිධත්වය ද අයත් වේ.[24] මෙම පිළිගැනීමත් සමග, ඉතිහාසය පුරාම මුස්ලිම්වරු සාමය, ප්‍රේමය, හොඳහිත හා සමගිය සමගින් වෙනත් ආගම්වල ජනයා සමග එකට ජීවත් වී ඇත. ඉස්ලාමය මානව ගරුත්වය ආරක්ෂා කරන අතර, මානව වර්ගයාගේ සමානාත්මතාවය සහ විශ්වාසය සම්බන්ධ කාරණාවල දී අභිමතයේ නිදහස මත පදනම් වූ සදාචාරාත්මක සාරධර්ම ක්‍රියාත්මක කිරීම සැබවින්ම සැලකිය යුතු කරුණකි.



අල්ලාහ්ට නමස්කාර කිරීම සඳහා මක්කාව වෙත වාර්ෂිකව වන්දනා කිරීම පිණිස සියලු ජාතීන්ට අයත් මිලියන තුනකට අධික ජනතාවක් එක් ස්ථානයකට ඇදී එයි. ඉන් ආගමේ සමගිය හා මනුෂ්‍යත්වයේ එකමුතුව එමගින් ප්‍රායෝගිකව නිරූපණය කරමින්, ඒවා නැවත ශක්තිමත්ව ස්ථාපනය කරයි.

# ඉස්ලාමය තුළ ජේසුතුමා

ඉස්ලාමයේ විශ්වාසයන්ගේ එක් මූලධර්මයක් නම් අල්ලාහ්ගේ සියලු පණිවිඩකරුවන් විශ්වාස කොට පිළිගැනීමයි. මුස්ලිම්වරු විශ්වාස කරන්නේ ජේසුස් (ඔහුට සමාදානය ලැබේවා) අල්ලාහ්ගේ ශ්‍රේෂ්ඨතම පණිවිඩකරුවෙකු බවය.

බයිබලයෙන් පිළිබිඹු වන පරිදි, ජේසුස්ගේ ජීවිතය හා ඉගැන්වීම් පිළිබඳව වාර්තා කර ඇත්තේ ඔහුගේ පිටත් වීමෙන් දශක ගණනකට පසුව බැවින් ඒවායෙන් බොහොමයක් අභිරහසක්ව පැවතුනි. අල්-කුර්ආනය ජේසුස්ගේ නම විසිපස් වතාවක් සඳහන් කර ඇත්තේ ඔහුගේ පෞරුෂත්වය හා ඉගැන්වීම් වටා ඇති අභිරහස සහ මිථ්‍යා විශ්වාසයන් පැහැදිලි කිරීමටත්, ඔහු සහ ඔහුගේ මව මත පවරා ඇති අසත්‍ය ප්‍රකාශවලින් ඔවුන්ව මිදීමටත්, ඔහුට සහ ඔහුගේ මවට සත්‍යවාදී සහ අල්ලාහ්ගේ භක්තිමත් සේවකයින් යැයි ගෞරව කිරීමටත් (අල්ලාහ් ඔවුන් ගැන සතුටු වේවා) ය. මේ අනුව අල්-කුර්ආනය අපට උගන්වන්නේ:

- ජේසුස් (ඔහුට සාමය උදා වේවා) ඉපදුණේ ඔහුගේ මව වූ කන්‍යා මරියාගේ ආශ්චර්යමත් පිළිසිඳ ගැනීමෙන් පසුවය. ඒ අනුව, ජේසුස්ට (ඔහුට සමාදානය වේවා) පියෙක් සිටියේ නැති මේ නිසා පියවරුන්ගේ පෙළපත් නාමයක් නොතිබුණද, ඔහුට උතුම් මාතෘ පෙළපතක් තිබුණිණි. ඒ මරියා ශාස්තෘවරුන්ගේ පෙළපතකින් පැවත ආ නිසාය. කෙසේ වෙතත්, ඔහුගේ ආශ්චර්යමත් පිළිසිඳ ගැනීමෙන් පරිබාහිරව, ඔහු සාමාන්‍ය මනුෂ්‍යයෙකු වූ අතර, අල්-කුර්ආනය අපට දන්වා ඇති පරිදි, අල්ලාහ් විසින් ශාස්තෘවරයෙකු ලෙස පත් කරන ලද මිනිසෙකුට වඩා ඔහු කිසිවක් අතිරික්ත ලෙස කියා නැත.[25] නිදසුනක් ලෙස, අල් කුර්ආනයේ 5:116-117 දී විනිශ්චය දිනයේ දර්ශනයක් අල්ලාහ් විස්තර කරයි:

> "අහෝ මර්යම්ගේ පුත් ඊසා! "අල්ලාහ් හැර මා හා මාගේ මව දෙවිවරුන් වශයෙන් නුඹලා ගනිවු" යැයි නුඹ ජනයාට පැවසුවේදැ?"යි අල්ලාහ් (විනිශ්චය දින ඊසාට) පවසන අවස්ථාව (නුඹ සිහිපත් කරවු.) "ඔබ අති පිවිතුරුය. මා හට අයිතියක් නොමැති දැයක් මා පැවසීමට මට (සුදුසු) නොවීය. මම එය පවසා සිටියේ නම් එය සැබැවින්ම ඔබ දන්නෙහිය. මාගේ සිතෙහි ඇති දෑ ඔබ දන්නෙහිය. තවද ඔබ තුළ ඇති දෑ මම නොදනිමි. සැබැවින්ම ඔබමය ගුප්ත දෑ (පිළිබඳව) මැනවින් දන්නා" යැයි ඔහු (ඊසා) පවසනු ඇත. "මාගේ පරමාධිපති හා නුඹලාගේ පරමාධිපති වන අල්ලාහ්ට නුඹලා

නමදිවු යනුවෙන් ඔබ මා හට අණ කළ දෑ මිස (අන් කිසිවක්) ඔවුනට මම නොපැවසුවෙමි. තවද ඔවුන් අතර මා සිටි තාක්කල් මම ඔවුන් කෙරෙහි සාක්ෂිකරුවෙකු වූයෙමි. (නමුත්) ඔබ මා (අහස දෙසට ඔසවා) අත්පත් කළ කල්හි ඔබමය ඔවුන් කෙරෙහි නිරීක්ෂකයෙකුව සිටියේ. ඔබ සියලු දෑ කෙරෙහි සාක්ෂි දරන්නාය.

ජේසුස් (ඔහුට සමාදානය වේවා) නිහතමානීව දෙවියන්ට තම වහල්භාවය තහවුරු කළ අතර, කිසි විටෙකත් දේවත්වය ප්‍රකාශ නොකළ බවට බයිබලයේම ඕනෑ තරම් සාක්ෂි තිබේ.[26]

- ඔහු මෙසියස් / ගැලවුම්කාරයා (ක්‍රිස්තුස්) විය, එයින් අදහස් කරන්නේ අල්ලාහ් විසින් ඔහුව ශාස්තෘවරයෙකු ලෙස අභිෂේක කරනු ලැබූ හෝ පත් කරන ලද බවය.[27]

- ඔහු අල්ලාහ්ගේ අවසරය ඇතුව බොහෝ ප්‍රාතිහාර්යයන් සිදුකළේය. පළමු ප්‍රාතිහාර්යය නම්, කන්‍යාවක්ව බිළිඳෙකුට උපත ලබා දුන් හේතුවෙන් අශෝභන චෝදනාවලට මුහුණ දුන් තම මව වන මරියා ආරක්ෂා කිරීම සඳහා ඔහු ළදරු වියේදීම කතා කිරීමයි. අල්ලාහ්ගේ අවසරය ඇතිව මළවුන්ව නැඟිටුවීම, අන්ධයන් හා ලාදුරු රෝගීන් සුව කිරීම වැනි තවත් බොහෝ ප්‍රාතිහාර්යයන් ඔහු ජීවිතයේ පසුකාලීනව සිදු කළේය.[28]

- ඔහුව එවන ලද්දේ ශුභාරංචිය හෙවත් ධර්ම දූතක බව ද සමගිනි (අරාබි බසින් අල්-ඉන්ජීල්).[29] උදාහරණයක් වශයෙන්, කුර්ආනයේ 5:46 හි අල්ලාහ් මෙසේ පවසයි.

  මර්යම්ගේ පුත් ඊසාව ඔහුට පෙර තිබූ තව්රාතයෙන් වූ දෑ සත්‍යය කරවන්නක් ලෙස (ඔහුට පෙර වූ නබිවරුන් වන) ඔවුන්ගේ පියසටහන් ඔස්සේ අපි අනුපිළිවළින් යැව්වෙමු. තවද යහමග හා ආලෝකය ඇත්තා වූ ඉන්ජීලය අපි ඔහුට දුන්නෙමු. තවද (ඉන්ජීලය) එයට පෙර තිබූ තව්රාතයෙන් වූ දෑ සත්‍යය කරවන්නක් ලෙස ද බිය භක්තිකයින්ට මග පෙන්වීමක් ලෙස ද උපදෙසක් ලෙස ද වේ.

- ඔහුව එවන ලද්දේ ඊශ්‍රායෙල් දරුවන් වෙනුවෙන් මිස වෙන කිසිම ජාතියකට නොවේ. කුර්ආනයේ 3:49 හි අල්ලාහ් මෙසේ පවසයි.

  "ඊශ්‍රායෙල් දරුවන් වෙනුවෙන් පණිවිඩකරුවෙකු ලෙස (ජේසුස්ව පත්කරන්න)...."

ජේසුස් වහන්සේට සාමය ලැබුණේ ඊශ්‍රායෙලිතයන්ට පමණක් බව යන කාරණය වර්තමානයේ පවා බයිබලයේ විවිධ අනුවාදවලින් පිළිබිඹු වේ.[30]

- ඔහුව ඝාතනය කළේ හෝ කුරුසයට තබා ඇණ ගැසුවේ නැත. කුර්ආනයේ 4:157-158 හි අල්ලාහ් මෙසේ පවසයි.

> තවද "සැබැවින්ම අපි අල්ලාහ්ගේ රසූල්වරයා වන මර්යම්ගේ පුත් ඊසාව ඝාතනය කළෙමු" යැයි ඔවුන් කළ ප්‍රකාශය හේතුවෙන් ද (ඔවුන්ගේ හදවත් මත මුද්‍රා තැබුවේ) ය. (එනමුත්) ඔවුහු ඔහුව (ඊසාව) ඝාතනය කළේ ද නැත. කුරුසියේ (තබා ඇණ) ගැසුවේ ද නැත. නමුත් ඔවුනට ඔහු (මෙන් වෙනත් කෙනෙකු)ව සමාන කර පෙන්වනු ලැබීය. සැබැවින්ම ඔහු පිළිබඳව මතභේද ඇති කර ගත්තවුන් ඒ පිළිබඳව සැකයෙහි සිටිති. අනුමානය පිළිපැදීම මිස ඒ පිළිබඳව කිසිදු දැනුමක් ඔවුනට නැත. ස්ථිර වශයෙන්ම ඔවුහු ඔහුව නොමැරුවෝය. එනමුත් අල්ලාහ් ඔහුව තමන් වෙත ඔසවා ගත්තේය. අල්ලාහ් අති බලසම්පන්න සර්ව ප්‍රඥාවන්ත විය.

ජේසුස්ව (ඔහුට සමාදානය ලැබේවා) කුරුසියේ තබා ඇණ ගැසීමට ඔහුගේ සතුරන් උත්සාහ කළ ද, අල්ලාහ් ඔහුගේ ශාස්තෘවරයාව අපකීර්තියට පත්කිරීමට ඉඩ නොහළේය: ඔහු ඔහුගේ ශාස්තෘවරයාව ආරක්ෂා කර, බේරාගත්තේය.



ජෙරුසලමේ අල්-අක්සා දේවස්ථානය, ඉස්ලාමයේ තුන්වන ශුද්ධ වූ දේවස්ථානය. අල්-කුර්ආනයේ (17:1 සහ 53:13-18) සඳහන් කර ඇති පරිදි මුහම්මද් නබිතුමාණන් (අල්ලාහ්ගේ සමාදානය සහ ආශිර්වාදය ඔහුට හිමි වේවා) ක්‍රි.ව. 621 දී මෙම දේවස්ථානයෙන් අහසට නැග්ගේය.

## හැම ආගමක්ම නිවැරදියි නේද, එසේ නම් ඇයි ඉස්ලාමයම?

මිනිසුන් අතර හොඳ හිත, සමගිය හා ප්‍රේමය ප්‍රවර්ධනය කරන ඕනෑම ආගමක් අත්‍යවශ්‍යයෙන්ම දෙවියන් වහන්සේට හා දේවභක්තියට මඟ පෙන්වන බැවින් එවැනි ඕනෑම ආගමක් පිළිගත හැකි බවට නොමඟ ගිය විශ්වාසයක් ඇත. වෙනත් වචන වලින් කිවහොත්, සියලු ආගම් අත්‍යවශ්‍යයෙන්ම යහපත් වන අතර / හෝ සමාන වේ, එබැවින් යමෙකු කිසියම් විශේෂිත ආගමක් අනුගමනය කිරීම අවශ්‍ය නොවේ. වැදගත් හේතු දෙකක් නිසා මෙම චින්තනය වැරදි සහ දෝෂ සහිතය.

පළමුව, ආගම යනු මැවුම්කරු අල්ලාහ් කෙරෙහි ඇති අපගේ භක්තියයි. එය ඔහුගේ කැමැත්තට අනුව අප ඔහුට සම්බන්ධ වන ආකාරය, අප ඔහුට නමස්කාර කරන ආකාරය සහ මේ පොළොව මත අපගේ ජීවිත ගත කරන ආකාරය යි. මේ සියලු ප්‍රශ්න නැගිය යුත්තේ මැවුම්කරු ය. එබැවින් සැබෑ හා නිවැරදි ආගම මැවුම්කරු විසින් නියම කරන ලද ආගම විය යුතුය.

දෙවනුව, අද පවතින සියලුම ආගම් මැවුම්කරුගේ සැබෑ ආගම් යැයි කීම නිවැරදි විය නොහැක, මන්ද විවිධ ආගම්වල ප්‍රධාන මූලධර්මවල මෙන්ම ප්‍රායෝගිකව ද ප්‍රතිවිරෝධතා අද කාලයේ දැකිය හැකි බැවිනි. උදාහරණ: සෑම ආගමක්ම, ඔවුන්ගේ අනුගාමිකයන් විසින් අනුගමනය කරන පරිදි, මැවුම්කරුගේ පරම ඒකීයභාවය (ඒකදේවවාදය) යන සංකල්පයට එකඟ නොවේ. දෙවනුව, මෝක්ෂය පිළිබඳ මූලධර්ම මත ආගම් අතර ප්‍රධාන වෙනස්කම් ඇති අතර, තෙවනුව, එක් එක් ආගමට අනුව නීත්‍යානුකූල දේ සහ නීති විරෝධී දේ පිළිබඳ ආගම් අතර වෙනස්කම් තිබේ.

මැවුම්කරු නිසැකවම තමාටම පටහැනි නොවේ. එබැවින් ඔහුගේ ආගම සමස්ත මනුෂ්‍ය වර්ගයාටම අනුකූල විය යුතුය - එහි මූලික විශ්වාසයන් හා භාවිතයන්ට අනුකූල විය යුතුය. දැනුමෙන් හා තර්කානුකූලව සත්‍යය සොයා යාම තනි පුද්ගලයා සතු වගකීමකි. සෑම ආගමක්ම අත්‍යවශ්‍යයෙන්ම යහපත් බවත්, එබැවින් ඒ සියල්ලම මැවුම්කරුට පිළිගත හැකි බවත් කිසිවෙකු රැවටිය යුතු නැත. ඔහුට පිළිගත හැකි එකම ආගම ඔහුගේ ආගමයි.

ආගමේ මූලාරම්භය ගැන ඉස්ලාමය කිසිවක් නොකියයි; එය මානව වර්ගයාගේ පෙර පරම්පරාවන්ට හෙළිදරව් කරන ලද ආගමම වේ. ශාස්තෘවරුන්ගේ මුල් පණිවිඩවලින් බැහැරවීම හෝ අපගමනය වීම හේතුවෙන් මානව ඉතිහාසය තුළ ආගම්වල විවිධත්වය මතුවිය. අවසාන පණිවිඩකරු මුහම්මද් සහ අවසාන පණිවිඩය වන කුර්ආනය පැමිණියේ මුල් පණිවිඩය දෙසට මනුෂ්‍ය

වර්ගයාට මඟපෙන්වීම සඳහා ය. මේ අනුව, මැවුම්කරුට පිළිගත හැකි එකම ආගම මෙම අවසාන පණිවිඩයට අනුකූල වන ඉස්ලාමය හෙවත් ඔහුගේ කැමැත්තට යටත් වීමයි. මේ අනුව අල්ලාහ් අල්-කුර්'ආනයේ 3:85 හි මෙසේ පවසයි;

> ඉස්ලාම් (කැමැත්තෙන් යුතුව, අවංකව සහ සාමයෙන් යුතුව දෙවියන්ගේ කැමැත්තට අවනත වීම) නොවන (අන්) දහමක් කවරෙකු සොයන්නේද එය ඔහුගෙන් පිළිගනු නොලබන්නේමය. තවද ඔහු මතු ලොවෙහි අලාභවන්තයින්ගෙන් (කෙනෙකු) වන්නේය.

ඉස්ලාමය යනු අවසාන පණිවිඩකරුවා වූ මුහම්මද් තුමාට පෙර ආබ්‍රහම්, මෝසෙස් සහ ජේසුස් ඇතුළු සියලු පණිවිඩකරුවන්ගේ ආගමයි (ඔවුන් සියල්ලන්ටම සාමය උදා වේවා). මන්ද, ඔවුන් මැවුම්කරුට යටත් වූ අතර ඔහුගේ කැමැත්තට සම්පූර්ණයෙන්ම යටහත්පහත් වූ බැවිනි. ඉස්ලාමය ද ඔවුන්ගේ ශාස්තෘවරුන්ගේ සැබෑ ඉගැන්වීම් පිළිපැදීමට පෙර සිටි ශාස්තෘවරුන්ගේ අවංක අනුගාමිකයන්ගේ ආගම විය.



# අදේවවාදය (Agnosticism) සහ අඥෙයවාදය (Atheism) පිළිබඳ අනුශාසනාව

අදේවවාදය යනු උත්තරීතර පුද්ගලභාවය (දෙවියන්) ප්‍රතික්ෂේප කිරීම වන අතර, මින් අදහස් කරන්නේ පරලොව ජීවිතය ප්‍රතික්ෂේප කිරීමයි. අඥෙයවාදියාට උත්තරීතර පුද්ගලභාවයක පැවැත්ම පිළිබඳව සැකයක් පවතී. අදේවවාදීන් සහ අඥෙයවාදීන් යන දෙදෙනාම ඔවුන්ගේ ප්‍රතික්ෂේප කිරීම හෝ සැකය විවිධ හේතු මත පදනම් කරති. අතීතයේ දී හේතු වූයේ දෙවියන් වහන්සේගේ පැමිණ සිටීම අපට භෞතිකව දැකීමට හෝ දැනීමට ඇති නොහැකියාව හෝ දුක් විඳීම පිළිබඳ මිනිස් අත්දැකීම් ය; දෙවියන් සිටී නම් අපි දුක් විඳින්නේ ඇයි යන මතවාදය ඔවුන් විමසති. නූතන කාලවල දී ඔවුන් ඉදිරිපත් කරන හේතු වඩාත් සංකීර්ණ වේ; දෙවියන්ගේ පැවැත්ම විද්‍යාත්මකව ඔප්පු කළ නොහැක්කේ ඇයි? එසේම, මැවීම පිළිබඳව විමසීමේ දී බොහෝ සංසිද්ධීන් විද්‍යාත්මකව අපට පැහැදිලි කළ හැකි බැවින් දෙවියන්ගේ පැවැත්මට කිසිදු පදනමක් නොමැත.

ඉස්ලාමය මෙම ප්‍රතික්ෂේප කිරීමට හෝ සංශයවාදයට ආමන්ත්‍රණය කරන්නේ දෙවියන්ගේ පැවැත්ම පිළිබඳ මිනිස් හෘදසාක්ෂිය, බුද්ධිය සහ හේතුදැක්වීම පදනම් කරගනිමිනි. මැවුම්කරුගේ ස්වභාවය හා මැවීම එකිනෙකට අසීමිත ලෙස වෙනස් වන අතර, දෙවියන් දැකීමේ හැකියාවක් එවැනි මිනිසුන්ට නැත. තවද, අපට දැකිය හැකි භෞතික ස්වරූපයක් දෙවියන්ට තිබේ නම්, ඔහු අවකාශය, කාලය සහ පදාර්ථය තුළ සීමිත හෝ සීමා කරනු ලැබේ. මෙය විකාරසහගත සිතිවිල්ලකි, මන්ද අවකාශය, කාලය සහ පදාර්ථය යන දේවල් නිර්මිත දේ නිසා, ඒවාට මැවුම්කරුවා පාලනය කිරීමේ හැකියාවක් නොතිබීමයි. ඒ වෙනුවට අල්-කුර්'ආනය මැවීම පිළිබඳ බුද්ධිමය විමසුමකට මිනිසුන්ට ආරාධනා කරයි, එවිට දෙවියන්ගේ මැවීම තුළින් ඔවුන්ට දෙවියන්ව තේරුම් ගත හැකිය. දෙවියන්ගේ පැවැත්ම පිළිබඳ සාක්ෂි අල්-කුර්'ආනයේ සංඥා ලෙස හැඳින්වේ, (අරාබි බසින් ආයාහ්) අල්-කුර්'ආනයේ මෙවැනි සංඥා සියගණනක් ඇත. 41 වන පරිච්ඡේදයේ 53 වන වැකියේ අල්ලාහ් මෙසේ පවසයි.

> සැබැවින්ම මෙය (අල්-කුර්'ආනය) සත්‍යය යන්නෙන් ඔවුනට පැහැදිලි වන තෙක් (මුළු) විශ්වයෙහි ද, ඔවුන් තුළ ද, අපි අපගේ සංඥාවන් ඔවුනට පෙන්වන්නෙමු. සැබැවින්ම නුඹගේ පරමාධිපති සියලු දෑ කෙරෙහි සාක්ෂි දරන්නාය යන්න (ඔවුනට) ප්‍රමාණවත් නොවූයේ ද?

මේ අනුව, මෙම පොරොන්දුව සමග දෙවියන් වහන්සේගේ මැවීම තුළින් දෙවියන් වහන්සේගේ පැවැත්ම පිළිබඳ බොහෝ සාක්ෂි ගැන මෙනෙහි කිරීමට අල්-කුර්ආනය මනුෂ්‍ය වර්ගයාට ආරාධනා කරයි. උදාහරණයක් ලෙස අල්-කුර්ආනයේ 3:190 වැකියෙහි අල්ලාහ් පවසයි;

> අහස් හා මිහිතලය මැවීමෙහි ද, රාත්‍රිය හා දහවලෙහි පරස්පරානු ගමනෙහි ද නුවණැත්තන්ට සංඥාවන් ඇත.

ඇත්ත වශයෙන්ම, අහස සහ පෘථිවියේ නිර්මාණය පිළිබඳව විද්‍යාඥයින් විශ්මය ජනක කරුණු සොයාගෙන ඇත; උදා. (a) විශ්වයට ආරම්භයක් තිබුණිණි එනම් එය ආරම්භ වූයේ කිසිවක් නැති තැන පටන් ය. (b) විශ්වය පරිණාමය වූයේ නිරවද්‍ය හා අන්තර් සම්බන්ධිත භෞතික නීති හා ක්‍රියාවලීන් අනුව ය. (c) පෘථිවිය සහ සූර්යයා අතර දුර, පෘථිවි ගුරුත්වාකර්ෂණ ඇදීම, වායුගෝලීය සංයුතිය, ජලයේ පැවැත්ම යනාදී පරාමිතීන් 200කටත් වැඩි සංඛ්‍යාවක් පෘථිවිය මත ජීවය පවත්වාගෙන යාම සඳහා බලපායි.

තවත් වැකියක අල්ලාහ් මෙසේ පවසයි;

> අහසින් (වැසි) ජලය පහළ කළේ ඔහුය. එයින් නුඹලාට පානය (කිරීම) ද, එයින් (වැඩෙන) ගහකොළ ද ඇත. නුඹලා (නුඹලාගේ සතුන්ට) එයින් (එම ගහකොළ වලින්) ආහාර සපයන්නෙහුය. එම( වැසි ජලය) මගින් ඔහු වගාවන් ද, ඔලිව් ද, රටඉඳි ද, මිදි ද, සියලු ඵලදාවන්වලින් ද නුඹලා වෙනුවෙන් ඔහු හටගන්වන්නේය. සැබැවින්ම එහි ගැඹුරින් සිතා බලන පිරිසකට සංඥාවක් ඇත. (අල්-කුර්'ආන් 16:10-11)

මෙම වැකියේ දෙවියන් වහන්සේගේ පැවැත්ම පිළිබඳ බොහෝ සලකුණු සඳහන් වේ. වර්ෂාව ඇතිවීම සම්බන්ධයෙන් මෙම වැකියෙහි අඩංගු අංගය සලකා බැලූ කල: පෘථිවියෙන් තෙතමනය වාෂ්ප වීමට හේතු වන කරුණු, වාෂ්ප අහසට නැඟීම, වාෂ්ප ජල බිඳිති වලට ඝනීභවනය වීම, ජල බිඳිති වලාකුළු බවට පත්වීම, ජලය ටොන් දහස් ගණනක් පිරී ඇති වලාකුළුවල චලනය සහ ජල බිඳිති වැස්ස ලෙස වැටීම ආදී මෙම සියලු ක්‍රියාදාමයන් පාලනය වන්නේ නිරවද්‍ය භෞතික නීති සහ පරාමිතීන් මගිනි. මැවීම් හා සම්බන්ධ මෙවැනි සංඥා දහස් ගණනක් ගැන මෙනෙහි කරන ලෙස අල්-කුර්'ආනය අපට ආරාධනා කරයි. බුද්ධිමය චින්තනයක් ඇති සාධාරණ මිනිසෙකු මේ සියල්ල මගින් යොමු කෙරෙන්නේ උත්තරීතර නිර්මාපකයෙකු සහ මැවුම්කරුවෙකු වන දෙවියන් වෙතට ය. මෙම බුද්ධිමත් නිර්මාණය,

සංකීර්ණත්වය සහ මැවීම්වල නිරවද්‍යතාව සහ එහි සියලු ගැඹුරු ගතිකයන් අහඹු සිදුවීමක ප්‍රතිඵලයක්යැ'යි උපකල්පනය කිරීම සාධාරණ නොවේ. ඇත්ත වශයෙන්ම, බොහෝ ශේක්ඨ නූතන විද්‍යාඥයන් මෙම තාර්කික නිගමනයට පැමිණ ඇති බව විමසා බැලූ කල පැහැදිලි වනු ඇත.[31]

මැවුම්කරුවා හඳුනා ගැනීමටත්, ඔහුට යටත් වීමටත් ස්වභාවික නැඹුරුවක් මිනිස් වර්ගයාට ඇති බව අල්-කුර්ආනය අපට දැනුම් දෙයි (මෙය අරාබි බසින් ෆිත්රා ලෙස හැඳින්වේ).[32] මීට සාක්ෂිය නම්, අප බරපතල අර්බුදයකට මුහුණ දෙන විට සහ කිසිම මිනිසෙකුට අපගේ උපකාරයට පැමිණිය නොහැකි බව තේරුම් ගත් විට අපි ස්වයංක්‍රීයව මෙන් උපකාර ඉල්ලා දෙවියන් වෙත හැරීමයි. අපගේ මැවුම්කරු විසින් ශාස්තෘවරුන් පත්කර එවා ඇති අතර, ඔහුව හඳුනාගැනීම සඳහා හෘදසාක්ෂිය අවදි කිරීම පිණිස මනුෂ්‍ය වර්ගයා වෙනුවෙන් ශුද්ධ වූ ආගමික ග්‍රන්ථ ද පහළ කර ඇති කෙසේ වෙතත්, දෙවියන් වහන්සේ අපට අභිමත දෙයක් කිරීමේ නිදහස ලබා දී ඇති හෙයින්, පිළිබඳව සවිඥානක වීමේ ස්වභාවික නැඹුරුව යටපත් කිරීමට ද අපට හැකියාව තිබේ. නමුත් දෙවියන් වහන්සේ අල්-කුරීආනයෙහි අපට පවසන්නේ ඔහුව විශ්වාස කිරීම සඳහා වූ අභ්‍යන්තර කැඳවීමට ප්‍රතිචාර දක්වන අයට මඟ පෙන්වන බවත්, ඔහුව විශ්වාස කිරීමට එරෙහිව ඔවුන්ගේ හෘදසාක්ෂිය යටපත් කිරීමට තෝරාගත් අයව ඔහු විසින් නොමඟ යවන බවත්, අපව මැවීම පිළිබඳව දෙවියන්ගේ සැලසුම මෙය බවත් ය.[33]

අල්-කුර්'ආනය මිනිස් සංහතියට අවසාන වශයෙන් එවන ලද එළිදරව්ව වන අතර එය දෙවියන්ගේ පැවැත්මේ ලකුණකි. 4 වන පරිච්ඡේදයේ 82 වන වැකියේ මෙසේ සඳහන් වේ;

> අල්-කුර්'ආනය ඔවුන් පරිශීලනය නොකරන්නෙහු ද? එය අල්ලාහ්ගෙන් තොර වෙනත් කෙනෙකුගෙන් වී නම් එහි ඔවුන් බොහෝ පරස්පරයන් දකිනු ඇත.

අල්-කුර්ආනය පිළිබඳ විෂය මූලික හා විවෘත අධ්‍යයනයකින් පැහැදිලිවම පෙනී යන්නේ එය මිනිසෙකු විසින් ලිවීමට නොහැකි ආකාරයේ රචනයක් බව ය (7 වන කොටස බලන්න). අල්-කුර්ආනය දෙවියන්ගේ පැවැත්ම පිළිබඳ ප්‍රබල සාක්ෂියකි.

දෙවියන් වහන්සේ අපව මැව්වේ සදාකාලික දිව්‍යමය අරමුණක් සඳහා වන අතර, ඔහුගේ අනෙකුත් මැවීම්වලට වඩා අපට අනුග්‍රහය දැක්වීය.[34] මේ ලෝකයේ අපගේ ජීවිතය අස්ථිර වන අතර, අපගේ සදාකාලික වාසස්ථානය

වන පරලොව සඳහා අපව සූදානම් කිරීම මෙහි අදහස් කෙරේ. මෙසේ සූදානම් වීමේ දී මැවුම්කරුවා කෙරෙහි අපගේ විශ්වාසය, සමෘද්ධිය මෙන්ම විපත්ති හරහා ද පරීක්ෂා කරනු ලැබේ. තවද, අපගේ අභිමතය ක්‍රියාත්මක කරන්නේ කෙසේද යන්න පිළිබඳව ද අපව පරීක්ෂාවට ලක් කරනු ඇති අතර, එම පරීක්ෂණයේ දී හොඳ සහ නරක යන දෙකම අපගේ ජීවිත ස්පර්ශ කරනු ඇත; දෙවියන් වහන්සේ නොව නපුර සිදු කරන්නේ මිනිසා ය. කෙසේ වෙතත්, නපුර හා දුක් වේදනා අපගේ විශ්වාසය පරීක්ෂණයට ලක්කරනවා පමණක් නොව, ඒවා මිනිසාට අනතුරු ඇඟවීමක් සහ වැළැක්වීමක් ලෙසින් ද ක්‍රියා කිරීම මෙහි ඇති ධනාත්මක පැත්තයි. අපගේ අභ්‍යන්තර හෘදසාක්ෂිය තුළ ධනාත්මක මෙනෙහි කිරීම සහ උසස් අරමුණක් සඳහා වූ ගවේෂණය අවදි වීම බොහෝ විට සිදුවන්නේ විපත්තියේ දී ය.



සූර්යග්‍රහණයඃ මෙම දර්ශනීය සංසිද්ධිය සිදුවන්නේ සූර්යයා පෘථිවියේ සිට සඳට ඇති දුර මෙන් හාරසිය ගුණයක් දුරින් සහ සූර්යයා සඳට වඩා හාරසිය ගුණයක් විශාල වන බැවිනි. මෙලෙස නිරවද්‍ය අනුපාතයන්ට අනුකූලව ඇති වන මෙම සුන්දර දර්ශනයේ නිර්මාණකරු ද අපේ මැවුම්කරු ම හැර අන් කවරෙක් විය හැකි ද?

# ඉස්ලාමයේ කාන්තාවන්ගේ තත්ත්වය

ඉස්ලාමය පුරුෂයන් හා ස්ත්‍රීන් යන දෙවර්ගයම සමාන මනුෂ්‍යයන් ලෙස මැවුම්කරු ඉදිරියේ ස්ථිරව ස්ථානගත කරයි. ස්ත්‍රීන් හා පුරුෂයන් ජීව විද්‍යාත්මකව වෙනස් වන අතර, පවුල හා සමාජය තුළ වෙනස් නමුත් අන්‍යෝන්‍ය වශයෙන් රඳා පවතින භූමිකාවන් ඇත. කෙසේ වෙතත්, ඔවුන් එකෙක් අනෙකාට වඩා උසස් නොවේ. පහත සඳහන් අල්-කුර්ආනයේ (4:1) වැකිය මෙම මූලධර්මය මනාව සාරාංශ කරයි:

> ජනයිනි, එකම ආත්මයකින් (ආදම්ගෙන්) නුඹලාව මවා, එයින් එහි කලත්‍රයා (සහකාරිය වන හව්වා) ද මවා, එම දෙදෙනා තුළින් බොහෝ පුරුෂයින් හා ස්ත්‍රීන් (මවා) ව්‍යාප්ත කළ නුඹලාගේ පරමාධිපතිට නුඹලා බිය භක්තිමත් වවු. තවද කවරෙකුගේ නාමයෙන් නුඹලා එකිනෙකා (උරුමයන්) ඉල්ලා සිටිනුයේ ද, එම අල්ලාහ්ට ද, උපතින් වූ ඥාති සබඳතාව ද (බිඳී යාම පිළිබඳව) නුඹලා බිය භක්තිමත් වවු. සැබැවින්ම අල්ලාහ් නුඹලා කෙරෙහි සර්ව නිරීක්ෂකය.



මෙම වැකියෙහි සඳහන් වන්නේ කාන්තාවන් පිරිමින්ට සමාන ස්වභාවයක් ඇති බවත්, දෙදෙනාටම අන්‍යෝන්‍ය අයිතිවාසිකම් ඇති බවත්, අල්ලාහ් කාන්තාවන්ට, විශේෂයෙන් අපේ මව්වරුන්ට විශේෂ ගෞරවයක් හා ප්‍රණාමයක් ලබාදීමට නියෝග කරන බවත් ය.

මෙම උදාර මූලධර්මයට අනුකූලව, 7 වන සියවසේ ඉස්ලාමයේ පැමිණීමත් සමග, ඉස්ලාමය ස්ත්‍රීන් පුරුෂයින්ගේ සේවකයන්ගේ තත්ත්වයෙන් නිදහස් කරගෙන, පිරිමින් සමග අධ්‍යාත්මික, සමාජීය හා ආර්ථික සමානාත්මතාවක් ඇති අය බවට තත්ත්වයෙන් උසස් කළේය.[35] මේ අනුව ඉස්ලාමයෙන් කාන්තාවන්ට දේපළ අයිතිය, උරුමය ලැබීමේ අයිතිය, අධ්‍යාපනයට ඇති අයිතිය, තමන්ගේ ජීවනෝපාය උපයා ගැනීමේ අයිතිය සහ පිරිමින් භුක්ති විඳින අනෙකුත් සියලු අයිතිවාසිකම් පිරිනමා ඇත.

සමහර මුස්ලිම් සමාජවල කාන්තාවන් අත්විඳින අසාධාරණයන් ඉස්ලාමය විසින් නියම කරනු නොලබන නමුත්, ඒවා ඇත්ත වශයෙන්ම ඉස්ලාමයට එරෙහිව සටන් කිරීමට පැමිණි සංස්කෘතික පිළිවෙත් වේ. නිදසුනක් වශයෙන්, බලහත්කාරයෙන් විවාහ කිරීම හෝ ගැහැණු ළමයින්ට අධ්‍යාපනය අහිමි කිරීම යන දෙකම සමහර මුස්ලිම් සමාජවල ක්‍රියාත්මක වන නමුත් ඉස්ලාමීය නීතිය යටතේ ඒවා නීති විරෝධී ය.

# ආගමික අන්තවාදය සහ ප්‍රචණ්ඩත්වය

ආගමික අන්තවාදය සහ ප්‍රචණ්ඩත්වය යනු ලෝකයේ සියලුම ආගම්වල පවතින සංසිද්ධියක් වන අතර ඒවා ආගම් තරම්ම පැරණි ය. සෑම ආගමකම සෑම විටම සමහර අය ඔවුන්ගේ විශ්වාසයන් පිළිබඳ අන්තවාදී හා බොහෝ විට විකෘති අදහස් දරනු ඇත. බොහෝ යුද්ධ සිදු වන අතර බොහෝ අය එවැනි අපරාධ සිදු කරනු ලබන්නේ ඔවුන්ගේ අන්ත ආගමික මතවාද සහ මනස රැඩිකල්කරණය කිරීම හේතුවෙනි. මෙම මානව ප්‍රචණ්ඩතාව වළක්වාගැනීම සඳහා ඉස්ලාමය මඟින් විශ්වාසය පාලනය කෙරෙන අතර, අභිමතයේ නිදහස, මානව ගරුත්වය ආරක්ෂා කිරීම, සියලු විශ්වාසයන්ට ගරු කිරීම, ජීවිතයේ පරිශුද්ධභාවය, යුක්තිය සහ සියලු මනුෂ්‍ය වර්ගයාට සාධාරණත්වය යන මූලධර්ම මත මානව ස්වභාවය ගොඩනංවයි.

අභිමතයේ නිදහස සහ සියලුම ආගම්වලට ගරුකිරීම

අල්ලාහ් මිනිසුන්ව මැව්වේ විශ්වාසය සම්බන්ධ කාරණාවල දී හෘදසාක්ෂියේ සහ අභිමතයේ නිදහස තිබෙන පරිදි වන අතර, එබැවින් ඕනෑම ආගමක් හා සම්බන්ධ විශ්වාසයක් කිසිවෙකු කෙරෙහි පැනවිය නොහැක. ඉහත 10වන කොටසෙහි දැනටමත් උපුටා දක්වා ඇති අල්-කුර්ආන පැදි 2:256 සහ 10:99 ට අමතරව, 11:118-119 හි අල්ලාහ් මෙසේ පවසයි.

> නුඹගේ පරමාධිපති අභිමත කළේ නම් ජනයින්ව එකම ප්‍රජාවක් බවට ඔහු පත් කරන්නට තිබුණි. නුඹගේ පරමාධිපති දයාව පෙන් වූ අය හැර අන් අය (දහමෙහි) මතභේද ඇත්තන්වම සිටියෝය. තවද මේ වෙනුවෙන්මය ඔවුන්ව ඔහු මැව්වේ. තවද "සැබැවින්ම (පාපතර) මිනිසුන් හා ජින්වරුන් සියල්ලන්ගෙන් මම නිරය පුරවන්නෙමි" යන නුඹගේ පරමාධිපතිගේ වදන සම්පූර්ණ(යෙන් නියම) විය.

අපව මැවීම සඳහා වන දෙවියන්ගේ සැලසුම් තුළ ඇදහීම්වල විවිධත්වය ද අන්තර්ගත වන අතර, ඉන් ඇඟවෙන්නේ සියලුම ජනතාව සමග සහජීවනයෙන් සහ එකිනෙකා ඉවසමින් ජීවත් විය යුතු බවයි.

ජීවිතයේ පාරිශුද්ධ බව

ඉස්ලාමය අහිංසකයන් ඝාතනය කිරීම හෙළා දකින අතර, අහිංසකයන්ට සිදුවන වෙනත් ආකාරයේ හිංසනයන් හෝ අසාධාරණයන් ද හෙළා දකී. අයුක්තිසහගත ලෙස පුද්ගලයෙකු ඝාතනය කිරීම ඉස්ලාමයට අනුව බරපතල පාපයකි. අල්ලාහ් මෙසේ පවසයි:

> "කවරෙකු ආත්මයක් ඝාතනය කිරීමකට මිස හෝ මිහිතලයෙහි ඇති වන කලහකාරකමක් වැළැක්වීමකට මිස අයුක්ති සහගතව

> තවත් ආත්මයක් ඝාතනය කරන්නේ ද, ඔහු මිනිසුන් සියල්ල ඝාතනය කළ කෙනෙකු මෙන් වන්නේයි යනුවෙන් ද, කවරෙකු ආත්මය ඝාතනය නොකර ජීවත් කරවන්නේ ද, ඔහු මිනිසුන් සියල්ල ආරක්ෂා කර ජීවත් කරවන්නෙකු මෙන් වන්නේය" (කුර්ආන් 5:32)

ඉස්ලාමය යුද්ධයට අවසර දෙන්නේ ආත්මාරක්ෂාව සහ ඕනෑම ආකාරයක ආක්‍රමණයකට හෝ පීඩාවකට එරෙහිව පමණි.[36] කෙසේ වුවත්, එවැනි යුද්ධයක් ප්‍රකාශ කළ යුත්තේ අදාළ ආක්‍රමණකාරී කණ්ඩායමට එරෙහිව විනා අහිංසක සිවිල් වැසියන්ගේ ජීවිත හා/හෝ දේපළ මත නොවේ. තවද, යුද්ධයක් ප්‍රකාශ කළ යුත්තේ මිනිසුන්ගේ කරනු ලබන්නේ තනි පුද්ගලයන් විසින් හෝ කණ්ඩායම් විසින් නොව, නීත්‍යානුකූල රාජ්‍යයක් විසිනි. ඉස්ලාමයේ යුද්ධය සම්බන්ධ නීති-රීති ඉතා දැඩි වන අතර, සිරකරුවන්, අහිංසකයන් සහ දේපළ විෂයෙහි කටයුතු කරන්නේ කෙසේද යන්න ගැන ඉන් අවධානය යොමු කෙරේ.[37]

යුක්තිය හා සාධාරණත්වය

යුක්තිය හා සාධාරණත්වය නොමැතිකම මඟින් අන්තවාදී හා ප්‍රචණ්ඩ මතවාදයන් ඇති වේ. ඉස්ලාමය සිය විශ්වාසයෙන් පරිබාහිර වූ පුද්ගලයන්ට ද ඇතුළුව, සියලු මිනිසුන්ට යුක්තිය සහ සාධාරණත්වය ලබාදෙන මෙන් අණ කරයි. කුර්' ආනයේ 60:8 වැකිය හරහා අල්ලාහ් මෙසේ පවසයි.

> ආගම යන කරුණ මත ඔබට විරුද්ධව සටන් නොකළ, ඔබගේ නිවෙස්වලින් ඔබව පන්නා නොදැමූ අයට ඔබ කරුණාවන්තව හා සාධාරණ ලෙස සැලකීම අල්ලාහ් තහනම් නොකරයි. නියත වශයෙන්ම අල්ලාහ් සාධාරණ අයට ප්‍රේම කරයි.

මෙම මූලධර්ම සමග සසඳා බලන කල, ඉස්ලාමය තුළ අන්තවාදය සහ ප්‍රචණ්ඩත්වය ඇති විය හැක්කේ ඉස්ලාමීය මූලධර්ම පිළිබඳ නොදැනීම, ආගම කෙරෙහි අධික උද්වේගයක් තිබීම හෝ ආගම නොවන වෙනත් පෙළඹවීම් නිසා පමණි. අද අප ලෝකයේ දකින ප්‍රචණ්ඩත්වය මූලික වශයෙන් දේශපාලනික වශයෙන් අභිප්‍රේරණය වූ ඒවා අතර ආගම හෝ ආගමේ නිකායන් සමග කිසිදු සම්බන්ධයක් නැත, නමුත් ආගමේ නම භාවිතා කරනුයේ යටින් පවතින චේතනා වසං කිරීමට සහ මහජන සහයෝගය ලබා ගැනීමට ය. මෙම ගැටුම් හා ප්‍රචණ්ඩත්වයට යටින් පවතින්නේ බල අරගලය, ආධිපත්‍යය, ධනය, කෑදරකම, පළිගැනීම සහ විදේශ මිලිටරි මැදිහත්වීම්වල ප්‍රතිවිපාක ය. ආගමක් ලෙස ඉස්ලාමය, ආගමේ නාමයෙන් අද ලෝකයේ සිදුවෙමින් පවතින යුද්ධ සහ වෙනත් ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්ගෙන් අහිංසක ය.

# ඉස්ලාමීය ජිහාදය

'ජිහාද්' යනු අරාබි වචනයක් වන අතර එහි තේරුම යමක් සාක්ෂාත් කර ගැනීම සඳහා 'අරගල කිරීම හෝ උත්සාහ කිරීම' යන්නයි. ඉස්ලාමීය සන්දර්භය තුළ එහි අර්ථය 'අල්ලාහ්ගේ මාර්ගයෙහි අරගල කිරීම', එනම් අපගේ අධිපතියාට සේවය කිරීම සඳහා උත්සාහ දැරීම ය. අල්-කුර්ආනයේ බොහෝ වැකි මගින් අල්ලාහ්ගේ මාර්ගයෙහි අරගල කිරීමට උත්සාහ කරන ලෙස විශ්වාසිකයන්ගෙන් ඉල්ලා සිටී. උදාහරණයක් ලෙස කුර්'ආනයේ 5:35 දී මෙසේ සඳහන් වේ;

> විශ්වාස කළවුනි, අල්ලාහ් වෙනුවෙන් ඔබේ යුතුකම් ඉටු කරවු. තවද ඔහු වෙත (සමීප වන්නා) වූ සාධනීය මාර්ගය සොයවු. තවද ඔහුගේ මාර්ගයේ ප්‍රයත්නය (එනම් ජිහාද්) කරවු. (මේ සියල්ල) නුඹලා ජය ලබාගනු පිණිසය.

එබැවින් අල්ලාහ්ගේ සතුට හා අනුමැතිය ලබා ගැනීමේ අදහසින් විශ්වාසවන්තයෙකු කරන සෑම ක්‍රියාවක්ම ජිහාද් ගණයට වැටේ. දේව නැමදුම, පුණ්‍ය කටයුතු, අපේ ආශාවන් පාලනය කිරීම, දැනුම ලුහුබැඳීම, ජීවනෝපාය සකසා ගැනීම, අපේ පවුල් රැකබලාගැනීම, යහපත් දේ ට අණ දීම සහ නපුරක් කිරීමෙන් වැළකීම යනාදිය මෙයට ඇතුළත් ය.

ඉතිහාස පොත්වල මෙන්ම නූතන මාධ්‍යවල ද ජිහාද් යන වචනය බොහෝ විට සඳහන් වන්නේ සටන් කිරීම හෝ ප්‍රචණ්ඩත්වය සම්බන්ධ කරමිනි. අරාබි බසින් සටන් කිරීම යනු කිතාල් මිස ජිහාද් නොවන නිසා මෙය වැරදිය. ඉස්ලාමය ජිහාදයේ නාමයෙන් කඩුවෙන් පැතිරවූ බවට චෝදනා කෙරේ. ඉතිහාස පොත්වල මෙතෙක් පුනරාවර්තනය වූ අතිශය අපූරු ප්‍රබන්ධය මෙයයි: ඉස්ලාමය ලොව පුරා ව්‍යාප්ත වී ඇත්තේ කඩුවෙන් නොව එහි උත්කෘෂ්ට මූලධර්ම හා සාරධර්ම මගිනි; ඉස්ලාමීය කුරුස යුද්ධයක් හෝ සටනක් මෙතෙක් සිදු වී නැත. 'ශුද්ධ යුද්ධය' යන වචනය ඉස්ලාමීය පාරිභාෂිතවල නොමැත. 1095 දී දෙවන අර්බන් පාප්තුමා යුරෝපයේ සියලුම කිතුණුවන්ගෙන් ශුද්ධ භූමිය නැවත ලබා ගැනීම සඳහා මුස්ලිම්වරුන්ට එරෙහිව "ශුද්ධ යුද්ධයකට" එක්වන ලෙස ඉල්ලා සිටීම දක්වා එහි ඉතිහාසය දිවෙයි. කෙසේ වෙතත්, මුල් ඉස්ලාමීය ඉතිහාසයේ මුස්ලිම්වරු යුද්ධවල නිරත වූ නමුත් එම යුද්ධ සිදුවූයේ ආක්‍රමණ මැඩපැවැත්වීමට හෝ අධිපතිවාදී පාලකයන් ඉවත් කිරීමට සහ විශ්වාසය පිළිබඳ කාරණාවලදී හෘද සාක්ෂියේ නිදහස සහ අභිමතයට ඉඩ දීම සඳහාය; ඒවා ඇත්ත වශයෙන්ම විමුක්තිකාමී යුද්ධ මිස ඉස්ලාම් ආගමට මිනිසුන් හරවාගැනීම සඳහා වූ යුද්ධ නොවේ. එක් උදාහරණයක් පමණක් කිවහොත්, මුස්ලිම්වරු වසර සියග ණනක් තිස්සේ ඉන්දියාව පාලනය කළ අතර, කිසි විටෙකත් ඉස්ලාමයට මිනිසුන් බලෙන් හැරවීමේ ව්‍යාපාරයක් නොතිබුණි; අද දක්වා ඉන්දියාව අති

බහුතර හින්දු  රටක් ලෙස පවතී.

ඉස්ලාමීය අන්තවාදී හෝ සටන්කාමී කණ්ඩායම් සහ ඔවුන්ගේ මතවාද විස්තර කිරීම සඳහා 'ජිහාද්වාදී' සහ 'ජිහාද්වාදය' යන වචන මාධ්‍යවල භාවිතා වන නවීන වචන වේ. මෙම යෙදුම් නූතන නිපැයුමක් වන අතර, ඒ සඳහා ඉස්ලාමයේ ඓතිහාසික මූලයන් හෝ අර්ථයක් නොමැත.

ඉස්ලාමය කිසිදු ප්‍රචණ්ඩ ක්‍රියාවක් අනුමත නොකරයි. ආත්මාරක්ෂාව සහ ආක්‍රමණ මැඩපැවැත්වීම සඳහා පමණක් සටන් කිරීමට මුස්ලිම්වරුන්ට අවසර ඇත. මෙම තත්ත්වය තුළ යමෙක් සටන් කරන්නේ නම්, එය ජිහාද් ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ යමෙකු ආත්මාරක්ෂාව සඳහා හෝ ආක්‍රමණ වළක්වාලීමට උත්සාහ කරන බැවිනි. අල්ලාහ් අල්-කුර්ආනයේ 2:193 හි මෙසේ පවසයි;

> තවදුරටත් ඉස්ලාමයට එරෙහිව සිදුකරනු ලබන ෆිත්නාහ්ව (ප්‍රචණ්ඩත්වය) නොමැති තත්ත්වයක් එළඹෙන තුරු සහ දීන් (අල්ලාහ් විසින් පිරිනමන ලද ජීවන මාර්ගය) අල්ලාහ් වෙනුවෙන්ම පවතින තුරු ද, නුඹලා ඔවුන් සමග සටන් කරනු. ඔවුන් එයින් වැළකුණහොත් අපරාධකරුවන් හැර කෙරෙහි විනා අන් අය කෙරෙහි සතුරුකමක් නොමැත.



සුල්තාන් අහමඩ් දේවස්ථානය තුර්කියේ ඉස්තාන්බුල් හි පිහිටි ඓතිහාසික මුස්ලිම් දේවස්ථානයකි. යාඥාව සඳහා වූ ඇමතුමෙන් පසුවද තවමත් පිරිමින් මෙහි තද රතු බුමුතුරුණු මත දණගසා සිටිති. නිල් දේවස්ථානය ලෙස ප්‍රකට මෙය 1609 සිට 1616 දක්වා කාලය තුළ ඉදිකරන ලද්දේ පළමුවැනි අහමද්ගේ පාලන සමයේ දී ය. එහි දේවස්ථාන සංකීර්ණය තුළ පළමුවැනි  අහමද්ගේ සොහොන, මද්රසාවක් සහ ගිමන් හැරීමේ ශාලාවක් ඇත.

# ඉස්ලාමීය ෂරී'ආව

ෂරී'ආව යනු දිව්‍ය කැමැත්තට අනුකූල වන පරිදි මුළු මිනිස් ජීවිතයම නියාමනය කරන සවිස්තරාත්මක චර්යාධර්ම පද්ධතියකි. එය මූලික විශ්වාසයන් (ඇදහීම්), නමස්කාර ක්‍රම, ආචාර ධර්ම, සමාජ ආර්ථික මූලධර්ම සහ දණ්ඩ නීති සංග්‍රහය ඇතුළත් වේ. 'ෂරී'ආ' යන වචනයේ තේරුම 'පැහැදිලි මාවත' හෝ 'මාර්ගය' වන අතර ඉස්ලාමීය සන්දර්භය තුළ එයින් අදහස් කරන්නේ මෝක්ෂය හා සදාකාලික සාර්ථකත්වය සඳහා වන මාර්ගයයි. මුස්ලිම්වරයෙකු වීම යනු ෂරී'ආ අනුව ජීවත් වීමයි, මන්ද එය දිව්‍යමය ජීවන මාර්ගය වන බැවිනි.

ඉස්ලාමීය ෂරී'ආ හි මූලික මූලධර්ම අල්-කුර්ආනය සහ නබිතුමාගේ සම්ප්‍රදායන්ගෙන් උපුටා ගන්නා ලද්දකි. ආගමික විද්වතුන්ගේ අදහස් සම්මුතිය (අරාබි බසින් ඉජ්මා) හරහා මූලධර්මවල නිශ්චිත යෙදුම මෙන්ම උද්ගත වන තත්ත්වයන්ට විසඳුම් සෙවීම සඳහා නෛතික හා ආගමික තීන්දු අපෝහනය කිරීම මඟින් ෂරී'ආව තවදුරටත් අර්ථ දක්වයි.

මනුෂ්‍ය විනිශ්චයට පමණක් සමස්ත මනුෂ්‍ය වර්ගයා සඳහාම සත්‍ය වශයෙන්ම සාධාරණ හා යුක්තියුක්ත චර්යා රටාවක් ස්ථාපිත කළ නොහැකිය. මෙයට හේතුව අහංකාරය, අගතිය, මුරණ්ඩුව, ආශාවන්, ආත්මාර්ථය, චිත්තවේග,



මහාධිකරණය, මස්කට්, ඕමානය

දූරදක්නා නුවණක් නොමැති වීම සහ අනෙකුත් සියලුම මිනිස් දුර්වලතා මනුෂ්‍ය විනිශ්චය කෙරෙහි සෘණාත්මක ලෙස බලපාන බැවිනි. අපට මඟපෙන්වීමට සහ සැබවින්ම සාධාරණ හා යුක්තියුක්ත මිනිස් හැසිරීමක් අපට ලබා දීමට අපගේ මැවුම්කරු අවශ්‍ය වන අතර මෙය ඉස්ලාමීය ෂරී'ආව යනු මෙයයි. එය මිනිස් ජීවිතය, ගෞරවය, මනස, විශ්වාසය, පවුල සහ දේපළ ආරක්ෂා කිරීම අරමුණු කරගත් නිරපේක්ෂ චර්යාධර්ම පද්ධතියයි.

බොහෝ විට ඉස්ලාමීය විරෝධී භාෂණවල, ලිවීම්වල, කථාවල කාන්තාවන් යටත් කිරීම, ළමා විවාහ, නිදහස සීමා කිරීම යනාදිය අනුමත කරන ඉස්ලාමීය නීතිය ලෙස ෂරී'ආවට ලේබල් අලවනු දැකිය හැක. මේ ආකාරයේ වාචාලකම් එළියට එන්නේ ෂරී'ආහි ඇති සැබෑ දේ නොදැන සිටීමෙනි; ඇත්ත වශයෙන්ම ෂරී'ආව යනුඃ ෂරී'ආව වගකිවයුතු යැයි වැරදියට චෝදනා එල්ල වන නපුරට පමණක් නොව, මනුෂ්‍යත්වය විසින් අත්විඳින සියලු නපුරුකම්වලට ද විසඳුම් සහ වැළැක්වීමක් ලබා දෙන චර්යාධර්ම පද්ධතිය ෂරී'ආව යි. නිදසුනක් වශයෙන්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, දෙමව්පියන්ගේ සහ පවුලේ දරුවන්ගේ අයිතිවාසිකම්, දුප්පතුන්ගේ සහ අඟහිඟකම් ඇති අයගේ අයිතිවාසිකම්, යුද්ධයේ හැසිරීම සහ යුද වහලුන්ට මානුෂිකව සැලකීම පිළිබඳ නීති සහ මාර්ගෝපදේශ, සාධාරණ වෙළඳ මූලධර්ම, ආගමික ඉවසීම, සමාජ ආචාරධර්ම, රාජ්‍ය පාලනය යනාදිය ඉස්ලාමය තුළ නියම කර ඇත්තේ ෂරී'ආවෙනි.

පහත දැක්වෙන්නේ අල්-කුර්ආනයේ වාක්‍ය පිළිබඳ උදාහරණයකි. වාණිජ්‍යය පිළිබඳ සාධාරණ හා යුක්තියුක්ත චර්යාධර්ම පද්ධතියක් ඉස්ලාමීය ෂරී'ආව මඟින් ව්‍යුත්පන්න කර ඇත. (අල්-කුර්'ආනය 26:181-183).

أَوْفُوا۟ ٱلْكَيْلَ وَلَا تَكُونُوا۟ مِنَ ٱلْمُخْسِرِينَ ۝

وَزِنُوا۟ بِٱلْقِسْطَاسِ ٱلْمُسْتَقِيمِ ۝

وَلَا تَبْخَسُوا۟ ٱلنَّاسَ أَشْيَآءَهُمْ وَلَا تَعْثَوْا۟ فِى ٱلْأَرْضِ مُفْسِدِينَ ۝

නුඹලා (යමක් මැන දෙන විට) මිනුම් සම්පූර්ණ කරවු. තවද නුඹලා (එහි අඩුපාඩුකම් කර අන් අයට) අලාභ කරන්නන් අතුරින් නොවවු. තවද නුඹලා ඍජු තුලාවකින් කිරනු. තවද නුඹලා ජනයාට ඔවුන්ගේ භාණ්ඩ (නියමිත ප්‍රමාණයට වඩා) අඩු නොකරවු. තවද නුඹලා මිහිතලයෙහි කලහකාරකම් පතුරුවමින් සීමාව ඉක්මවා නොයවු.

# ඉස්ලාමයේ ඇති බෙදීම්

පාලනය පිළිබඳ යම් මතගැටුම්, විශේෂයෙන් තුන්වන නායකයාගේ කාලයේ (උත්මාන් ඉබ්න් අෆාන්, ක්‍රි.ව. 644-656) තිබුණද, නබිතුමාගේ කාලයේ සහ ඔහුගේ මරණයෙන් පසු මෙන්ම පළමු නායකයන් තිදෙනාගේ (හෝ කාලිෆ්වරුන්ගේ) කාලය තුළ, මුස්ලිම්වරු එකම තනි ප්‍රජාවක් වූහ. දේශපාලන විසම්මුතිය හා එහි ප්‍රතිඵලයක් ලෙස කැරැල්ලක් හටගත්තේ ඉදිරි නායකයා වූ අලි ඉබ්න් අබි තාලිබ්ගේ පාලන කාලය (ක්‍රි.ව. 656-661) තුළ ය. ඉන්පසු ඇති වූ ගැටුම හා යුද්ධය කොටස් තුනකට බෙදී ගියේය. අලි සමග සටන් කළ අය, අලි සහ ඔහුගේ විරුද්ධවාදීන් අතර බේරුම්කරණයට එකඟ වූ අය සහ මුලින් අලි සමග සිටි නමුත් අලිගේ විරුද්ධවාදීන් සමග බේරුම්කරණයට එකඟ නොවූ අය. එබැවින් ඓතිහාසික වශයෙන් මුස්ලිම් ප්‍රජාවේ බෙදීම් දේශපාලනික ස්වරූපයක් ගත්තේය. ඉස්ලාමීය ඉතිහාසයේ මේ මොහොතේ දී දේශපාලන අධිකාරිය නීති අධිකාරියෙන් වෙන්වීමට පටන් ගත්තේය. මේ කඳවුරු තුන තුළ ඒ වන විටත් භාවිතා කරමින් සිටි ෂරී'ආ තීරණය කිරීමේ මූලධර්ම හා සංකල්පවලට හැඩගැසුණු බොහෝ මුස්ලිම් විද්වතුන් බිහි විය. එකල බිහි වූ මහා මුස්ලිම් නීතිවේදීන් ලෙසඃ ජාබීර් බින් සයිඩ් (ක්‍රි.ව. 639-709), අබු හනීෆා (ක්‍රි.ව. 699-767), ජාෆර් සාදික් (ක්‍රි.ව. 702-765), මාලික් (ක්‍රි.ව. 711-795), ෂාෆී (767- ක්‍රි.ව. 820) සහ ඉබ්න් හන්බල් (ක්‍රි.ව. 780-855). කැපීපෙනෙන ආගමික හා නෛතික විශාරද බව නිසා ඉමාම් ලෙස හැඳින්වෙන මේ සෑම විශාරදයෙක්ම නීති සහ නෛතික තීන්දු අපෝහනය කළ හැකි ක්‍රමවේද වැඩිදියුණු කළ අතර, ඒ හරහා තමන්ටම කියා අනුගාමිකයන් කවයක් ඒකරාශී කරගත්හ. 10 වන ශතවර්ෂය වන විට, මෙම ශ්‍රේෂ්ඨ විද්වතුන් විසින් නියම කරන ලද මූලධර්ම මනාව නිර්වචනය කරන ලද "නීති විද්‍යා ගුරුකුල" දක්වා වර්ධනය වුණු අතර, එමගින් ඒ ඒ විද්වතුන්ගේ මතවාදය සඳහා සුවිශේෂී පක්ෂපාතීත්වයක් දක්වා තිබේ. මේ අනුව, ජාබීර් බින් සයිද්ගේ ගුරුකුලය ඉබාදි ලෙසත්, අබු හනීෆාගේ ගුරුකුලය හනෆි ලෙසත්, ජාෆර් සාදික්ගේ ගුරුකුලය ෂියා ලෙසත්, මාලික්ගේ ගුරුකුලය මාලිකි ලෙසත්, ෂාෆිගේ ගුරුකුලය ෂාෆි ලෙසත්, ඉබ්න් හන්බල්ගේ ගුරුකුලය හන්බාලි ලෙසත් ප්‍රසිද්ධියට පත්විය් නමුත් මේ කිසිවෙක් විශේෂිත ගුරුකුල කිසිවක් ආරම්භ නොකළහ. ඊළඟ ශතවර්ෂ තුන තුළ, සාමාන්‍ය මුස්ලිම්වරු ද යම් පාසලකට අනුගත වූහ. ඔවුන්ට උද්ගත වූ ගැටලු සඳහා තමන් අදාළ වන ගුරුකුලයේ මතයට පක්ෂපාතී වීමට ඔවුන් උත්සුක වූහ.

විවිධ නීති විද්‍යා ගුරුකුල ආරම්භ කෙරුණ ද, සියවස් දහහතරකට පෙර එළිදරව් වූ දා සිට නොවෙනස්ව පවතින කුර්'ආනය සහ මුහම්මද් නබිතුමාගේ (ඔහුට අල්ලාහ්ගේ සාමය සහ ආශිර්වාදය ලැබේවා!) සම්ප්‍රදායන් නිසා මුස්ලිම්වරු ඒකාත්මික ව සිටිති. ලොව පුරා සිටින මුස්ලිම්වරුන්ගේ විශ්වාසයේ හා ආගමේ මූලධර්ම එකිනෙකාගෙන් වෙනස් නොවන අතර, ඔවුහු යාඥාවන්, වන්දනාව සහ නැමදුම් කටයුතු වැනි ආගමික චාරිත්‍ර එක්සත්ව ඉටු කරති.

නිකාය හෝ ගුරුකුල වශයෙන් ආගමේ බෙදීම් ඇතිකිරීම ඉස්ලාමය තහනම් කර ඇති අල්-කුර්'ආනයේ 3:103හි අල්ලාහ් මෙසේ පවසයි.

> තවද නුඹලා සියල්ල අල්ලාහ් (විසින් ඔබ වෙත දිගහරින ලද) කඹය (අල්-කුර්ආනය) තදින් ග්‍රහණය කර ගනිවු. තවද නුඹලා වෙන්ව නොයවු.

මෙම ආඥාවේ හරයට අනුකූලව, සියලුම මුස්ලිම් ගුරුකුල සියවස් ගණනාවක් එකමුතුව, එකම ප්‍රජාවක් ලෙස ජීවත් විය. ඉතිහාසයේ අප දැක ඇති හා මෑත කාලයේ පුපුරා ගිය අවාසනාවන්ත මුස්ලිම් ගැටුම්වලට ආගම සමග කිසිදු සම්බන්ධයක් නැත, ඒවා තනිකරම භූ-දේශපාලන අරගල හා සම්බන්ධ කාරණා ය.



පැරණි දමස්කස් නගරයේ පිහිටා ඇති උමයියාද් දේවස්ථානය දමස්කස්හි මහා දේවස්ථානය ලෙසද හැඳින්වේ. එය ලොව විශාලතම හා පැරණිතම මුස්ලිම් දේවස්ථානයකි. සමහර මුස්ලිම්වරුන් විසින් එය ඉස්ලාමයේ සිව්වන ශුද්ධ ස්ථානය ලෙස ද සලකයි.

# ඉස්ලාමයේ මූලික මානව හිමිකම්

අල්ලාහ්ගේ මැවීම් සම්බන්ධයෙන් මිනිසාට ගෞරවනීය හා අභිමානනීය ස්ථානයක් හිමි වේ. අල්-කුර්ආනයේ 17:70 හි අල්ලාහ් මෙසේ පවසයි:

> තවද සැබැවින්ම අපි ආදම්ගේ දරුවන්ව ගෞරවයට පත් කළෙමු. තවද, අප මැවූ බොහෝ ජීවින් අතුරෙන් ඔවුන් අතිවිශිෂ්ට කළෙමු.

මෙලෙස ලබාදුන් ගරුත්වයට කරන ගරු කිරීමක් හා එය ආරක්ෂා කිරීමක් ලෙස, ඉස්ලාමය විසින් තනි පුද්ගලයින්ගේ විශ්වාසය, ජාතිය හෝ තත්ත්වය නොසලකා සියලු මනුෂ්‍ය වර්ගයා සඳහා මූලික අයිතිවාසිකම් ස්ථාපිත කර ඇත. අල්-කුර්ආනයෙහි දක්වා ඇති පරිදි, ඉස්ලාමයේ ප්‍රධාන මූලික අයිතිවාසිකම් කිහිපයක් පහත දැක්වේ.

1. ආත්මයේ වටිනාකම සහ ජීවත් වීමේ අයිතිය. 15 වන කොටසේ උපුටාගෙන ඇති 5:32 වැකියට අමතරව අල්ලාහ් තවදුරටත් මෙසේ පවසයි.

   > ...තවද, දිළිඳුකම නිසා නුඹලා නුඹලාගේ දරුවන් නොමරනු. නොමරන මෙන් අල්ලාහ් තහනම් කළ ජීවය නීත්‍යානුකූල අයිතියකින් තොරව මිස නොමරනු: මේවා නුඹලාට නුඹලාගේ පරමාධිපති අණ කළ දෑ වේ, නුඹලා වටහාගනු පිණිස. (අල්-කුර්'ආනය 6:151)

2. ජීවිතයේ මූලික අවශ්‍යතා ලබාගැනීමේ අයිතිය. අනෙකුත් පුද්ගලයන්ට ඔවුන්ගේ මූලික අවශ්‍යතා ලැබෙන බවට තහවුරු කිරීම මුස්ලිම්වරුන්ගේ වගකීමකි.

   > තවද (ඔවුන් වෙතින්) යාචනය කරන්නාට ද, (යාචනයෙන්) වැළකෙන්නාට ද ඔවුන්ගේ සම්පත්හි උරුමයක් ඇත (කුර්ආන් 51:19).

   දුප්පතුන්ට උපකාර කිරීම සහ අගහිඟකම් ඇති අයව රැකබලා ගැනීම අනුග්‍රහයක් හෝ වරප්‍රසාදයක් නොව, දුප්පතුන්ගේ සහ අගහිඟකම් ඇති අයගේ අයිතියකි.

3. සියලුම ආකාරයේ නිදහසට ඇති අයිතිය.

   > එහෙත්, ඔහු බැවුම් සහිත මාවතෙහි ඉක්මන් වී නැති බැවුම් සහිත මාවත ඔබට පැහැදිලි කරන්නේ කුමක්ද? එය නම් එක්

වහලෙකු නිදහස් කිරීමයි. (අල්-කුර්ආනය 90:11-13)

වහල් බන්ධනයට බොහෝ පැතිකඩ ඇත. ශාරීරික හා ආර්ථික වහල්භාවය, බලහත්කාරයෙන් වැඩ ලබාගැනීම, ලිංගික සූරාකෑම සහ වෙනත් ආකාරයේ සූරාකෑම් ඒ අතර වේ.

මුහම්මද් නබිතුමා (ඔහුට සමාදානය ලැබේවා) මෙසේ පැවසීය:

> විනිශ්චය දිනයේදී මම පැමිණිලිකරුවෙකු වෙමින්, මම එරෙහි වන පුද්ගල කාණ්ඩ තුනක් ඇත. මේ තිදෙනාගෙන් එක් අයෙක් නිදහස් මිනිසෙකු වහල්භාවයට පත්කරන්නෙකි.

මේ අනුව ඉස්ලාමය 7 වන සියවස වන විට වහල්භාවය අහෝසි කළේය. බටහිර රටවල වහල්භාවය අහෝසි කරන ලද්දේ 19 වන ශතවර්ෂය තරම් ප්‍රමාදයකින් පසුව ය.[38]



චීනයේ ෂියාන්හි මහා දේවස්ථානය. ඉස්ලාමය චීනයට හඳුන්වා දෙනු ලැබුවේ 7 වන සියවස මුල් භාගයේදීය. අද චීනයේ මුස්ලිම් ජාතිකයින් මිලියන 20 කට අධික සංඛ්‍යාවක් සිටිති.

4. සියලු මනුෂ්‍යයන්ගේ සමානාත්මතාවය: සියලු මිනිසුන් එක හා සමාන යැයි සලකනු ලබන අතර, දෙවියන් ඉදිරියෙහි ඇති විශිෂ්ටත්වයේ එකම ප්‍රමිතිය වන්නේ පාරිශුද්ධ භාවය සහ උසස් සදාචාරයයි.

    ජනයිනි, සැබැවින්ම අපි නුඹලාව පිරිමියෙකු හා ස්ත්‍රියකගේ මැවූවෙමු. තවද නුඹලා එකිනෙකා හඳුනාගනු පිණිස ජාතීන් හා ගෝත්‍ර බවට පත් කළෙමු. සැබැවින්ම අල්ලාහ් අබියස නුඹලාගෙන් ඉතා ශ්‍රේෂ්ඨයා නුඹලාගෙන් ඉතා බිය භක්තිකයාය. සැබැවින්ම අල්ලාහ් සර්වඥය, අභිඥානවන්තය. (අල්-කුර්'ආන් 49:13)

5. සමාජයේ කෙනෙකුගේ තත්ත්වය නොසලකා සියලු සමාජ හා ආර්ථික කටයුතුවලදී යුක්තිය සහ සාධාරණත්වයට ඇති අයිතිය.

    විශ්වාස කළවුනි, නුඹලා යුක්තිය ඉටු කරන්නන් වවු. නුඹලාට එරෙහි වුව ද නැතහොත් දෙමාපියන්ට හා ඥාතීන්ට එරෙහි වුව ද (සත්‍යය නිර්දේශයන් සඳහා) අල්ලාහ් වෙනුවෙන් සාක්ෂි දරන්නන් වවු. ඔහු (විත්තිකරු) ධනවතෙකු වුව ද දිළින්දෙකු වුව ද (ඔහුට එරෙහිව සත්‍ය සාක්ෂි පැවසීමෙන් නොවැළකෙවු. මන්දයත්) අල්ලාහ් ඔවුන් දෙදෙනාට (රැකවරණය ලබා දීමට) සුදුසු වන්නේය. නුඹලා අයුක්ති සහගත වීමට මනෝ ඉච්ඡාව අනුගමනය නොකරවු. (නුඹ සාක්ෂි දීමේ දී සාක්ෂිය) වෙනස් කළේ නම් හෝ (සත්‍යය ස්ථාපිත කිරීමට) පිටුපාන්නේ නම් එවිට (අල්ලාහ් නුඹලාට දඬුවම් කරනු ඇත. මන්දයත්) අල්ලාහ් නුඹලා කරන දෑ පිළිබඳව අභිඥානවන්ත වන්නේය. (අල්-කුර්'ආන් 4:135)

6. පුද්ගලයාගේ ගෞරවය, අභිමානය සහ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම.

    විශ්වාස කළවුනි, එක් පිරිසක් තවත් පිරිසකට උපහාස නොකරවු. (උපහාසයට ලක් වූ) ඔවුන් (උපහාස කළ) මොවුන්ට වඩා යහපත් අය විය හැකිය. තවද කාන්තාවන් අන් කාන්තාවන්ට උපහාස නොකරවු. (උපහාසයට ලක් වූ) ඔවුන් (උපහාස කළ) මොවුන්ට වඩා යහපත් අය විය හැකිය. තවද නුඹලා නුඹලා අතරම අඩුපාඩු නොසොයවු. තවද නුඹලා එකිනෙකාට (පිළිකුල් සහගත) විකට නමින් නොඅමතවු. විශ්වාස කළායින් පසුව පාපතර නාම(යෙන් ඇමතීම) ඉතා නින්දා සහගතය. තවද කවරෙකු හෝ පශ්චාත්තාප නොකළේ ද ඔවුන්මය අපරාධකරුවෝ වන්නේ. (අල්-කුර්'ආන් 49:11)

    තවද, 49:12 වැකියෙහි අල්ලාහ් මෙසේ පවසයි:

විශ්වාස කළවුනි, බොහෝ (ඍණාත්මක) සිතුවිලි වලින් වැළකී සිටිවූ සැබැවින්ම ඇතැම් සිතුවිලි පාපී ය. තවද (අන් අයගේ වැරදි) රහසින් විපරම් නොකරවු. තවද නුඹලාගෙන් සමහරු තවත් සමහරුන් ගැන කේලාම් නොකියවු. නුඹලාගෙන් කෙනෙක් මියගිය තම සහෝදරයාගේ මස් කෑමට කැමති වන්නේ ද? එවිට නුඹලා එය පිළිකුල් කරන්නෙහුමය. තවද නුඹලා අල්ලාහ්ට බිය භක්තිමත් වවු. සැබැවින්ම අල්ලාහ් පශ්චාත්තාපය පිළිගන්නා ය, පරම කරුණාභරිත ය.

7. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ නිවැරදි සහ යුක්තිගරුක දේ වෙනුවෙන් පෙනීසිටීම.

විශ්වාසිකයින් ද, විශ්වාසික කාන්තාවන් ද, ඔවුන්ගෙන් එකිනෙකා අනෙකාගේ මිතුරන්ය. ඔවුහු යහපත අණ කරති. තවද අයහපත (ජනයින්ගෙන්) වළක්වති. සලාතය ස්ථාපිත කරති. 'සකාතය ද ලබා දෙති. තවද, අල්ලාහ්ට ද, ඔහුගේ රසූල්වරයාට ද අවනත වෙති. ඔවුන්ටමය අල්ලාහ් දයාව දක්වනුයේ. සැබැවින්ම අල්ලාහ් අති බලසම්පන්නය, සර්ව ප්‍රඥාවන්තය. (අල්-කුර්'ආන් 9:71)

තවද, 4:148 වැකියේ අල්ලාහ් මෙසේ පවසයි.

අසාධාරණයට ලක් වූවන් හැර (සෙසු අය) නපුර ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීම අල්ලාහ් ප්‍රිය නොකරයි. තවද අල්ලාහ් සර්ව ශ්‍රාවක සර්වඥ විය.

8. විශ්වාසයේ නිදහස සහ කෙනෙකුගේ විශ්වාසය පිළිපැදීමට ඇති නිදහස් සත්‍ය ආගම ඉස්ලාම් වෙත මනුෂ්‍ය වර්ගයාට ආරාධනා කිරීම ඔවුන්ගේ යුතුකම බව මුස්ලිම්වරු විශ්වාස කරති. කෙසේ වෙතත්, කිසිවෙකුට කිසිම විශ්වාසයක් පිළිගැනීමට බල කිරීමට කිසිවෙකුට අයිතියක් නැත, මන්ද විශ්වාසය යනු කෙනෙකුගේ ආත්මය තුළ හිතාමතාම ඇති කරගන්නා ස්වයං ඒත්තු ගැන්වීම සහ අවංකකමයි. අල්-කුර්'ආනයේ 2:256 හි අල්ලාහ් පවසයි;

(ඉස්ලාම්) දහමෙහි බල කිරීමක් නැත. සැබැවින්ම ඍජු මග සදොස්භාවයෙන් වෙන්ව පැහැදිලි විය.

ඉස්ලාමයේ ඇති මෙම විශ්වාසයේ නිදහස අල්-කුර්'ආනයෙහි තවත් බොහෝ වැකිවලින් පුනරුච්චාරණය කර ඇත.[39]

මෙම ඉස්ලාමීය සාරධර්ම මෙන්ම අල්-කුර්'ආනයෙහි සහ නබිතුමාගේ සම්ප්‍රදායන්හි නියම කර ඇති අනෙකුත් ඒවා ද විශ්වීය වන අතර, ඒවා මානව හිමිකම් හා ප්‍රජාතන්ත්‍රවාදයේ අත්‍යවශ්‍ය අංග වේ.

# ඉස්ලාමයේ සංස්කෘතික විවිධත්වය

මිනිසුන්ගේ සිරිත් විරිත්, ජාතිය, භාෂා, ඇඳුම් පැළඳුම්, ආහාර, කලාවන්, ජනප්‍රවාද සහ වෙනත් සංස්කෘතික ප්‍රකාශනවල ඇති විවිධත්වය ඉස්ලාමය පිළිගනී, ඒවා නීත්‍යානුකූල වනවා පමණක් නොව අල්ලාහ්ගේ වරප්‍රසාදයේ ලකුණක් ද වේ. කෙසේ වෙතත්, ඉස්ලාමයේ ඉගැන්වීම් හා මූලධර්මවලට පටහැනි සංස්කෘතික අංගයන් ඉස්ලාමය තරයේ ප්‍රතික්ෂේප කරයි. අල්ලාහ් මෙසේ පවසයි;

> තවද අහස් හා මිහිතලය මැවීම ද නුඹලාගේ දිවවල් (වලින් පිටවන භාෂාවන්) හා නුඹලාගේ වර්ණ වෙනස් වීම ද ඔහුගේ සංඥාවන් අතුරිනි. සැබැවින්ම මෙහි දැනුම ඇත්තන්ට සංඥාවන් ඇත. (අල්-කුර්ආන් 30:22)

තවත් වැකියක අල්ලාහ් මෙසේ පවසයි:

> ජනයිනි, සැබැවින්ම අපි නුඹලාව පිරිමියෙකු හා ස්ත්‍රියකගෙන් මැවුවෙමු. තවද නුඹලා එකිනෙකා හඳුනා ගනු පිණිස ජාතීන් හා ගෝත්‍ර බවට පත් කළෙමු. සැබැවින්ම අල්ලාහ් අබියස නුඹලාගෙන් ඉතා ශ්‍රේෂ්ඨයා නුඹලාගෙන් ඉතා බිය භක්තිකයාය. සැබැවින්ම අල්ලාහ් සර්වඥය, අභිඥානවන්තය. (අල්-කුර්ආන් 49:13)

ගෝලීයකරණය වූ නූතන ලෝකයේ, විවිධ වාර්ගික, ජනවාර්ගික හා සංස්කෘතික පසුබිම්වලින් පැමිණෙන මුස්ලිම්වරුන්ගේ දෘශ්‍යමාන වෙනස්කම් මිනිසුන් බොහෝ විට දකී. මුස්ලිම් ලෝකය තුළ පවතින සංස්කෘතික විවිධත්වය පිළිබඳ හැඟීමක් ඇති කිරීම සඳහා සංස්කෘතික හා ආගමික දේ මොනවාද යන්නත්, සහ ආගම හා සංස්කෘතිය අතර අන්තර් ක්‍රියාකාරිත්වය අතර වෙනස හඳුනාගැනීමත් වැදගත් වේ.

ඉස්ලාමය ලොව පුරා සංස්කෘතීන් තුළ නියෝජනය වන ආකාරයේ බොහෝ වෙනස්කම් තිබේ. විශ්වීය ආගමක් ලෙස ඉස්ලාමය ලෝකයේ සෑම අස්සක් මුල්ලක් නෑරම ව්‍යාප්ත වී තිබෙන බව කිසිවෙකුත් පුදුමයට ලක්විය යුතු කාරණයක් නොවේ. මෙම ව්‍යාප්තියට විවිධ සංස්කෘතීන් සම්බන්ධ වී ඇති අතර, ඒ සියල්ල ඉස්ලාමීය රාමුව තුළ ගම්‍ය වේ. එහි අර්ථය නම්, සත්කාරක රට කුමක් වුවත්, ඉස්ලාමයේ හරය - විශ්වාසයේ සහ පෞද්ගලික භාවිතයේ අත්‍යවශ්‍ය කරුණු - ක්‍රියාකාරීව ආගම අදහන සියලු මුස්ලිම්වරුන් සඳහා පොදු වේ.

නිදසුනක් වශයෙන්, සියලුම මුස්ලිම්වරු එකම දෙවියෙකු විශ්වාස කරති. ඔවුන් සියල්ලෝම සුරදූතයන් විශ්වාස කරති. ඔවුන් සියල්ලෝම එකම අල්-කුර්'ආනය කියවා මෙනෙහි කරති. ඔවුන් සියලු දෙනා මුහම්මද් නබිතුමා (ඔහුට සමාදානය වේවා) විශ්වාස කර, අනුගමනය කරති. ඔවුන් සියල්ලෝම මරණයෙන් පසු ජීවිතය සහ විනිශ්චය දිනයේ පෞද්ගලික වගවීම පිළිබඳව විශ්වාස කරති. ඔවුන් සියල්ලෝම දිව්‍යමය නිර්ණනය හා ඉරණම විශ්වාස කරති. ඉස්ලාමයේ කුළුණු පහේ කේන්ද්‍රීය භාවිතයන් ලොව පුරා සිටින සියලුම මුස්ලිම්වරුන්ට එක හා සමාන වේ. ඔබ ඕමානයේ හෝ ඉන්දුනීසියාවේ හෝ සෙනෙගල් හෝ චීනයේ වේවා, ඔබට ඇසෙනු ඇත්තේ එකම යාඥාවකි. රමළාන් මාසය තුළ ලොව පුරා සිටින මුස්ලිම්වරු එක්ව නිරාහාරව සිටින අතර, වාර්ෂික වන්දනා චාරිකා හෝ හජ් වන්දනාව සඳහා මක්කාවට එක්වෙති. එබැවින් ඉස්ලාමයේ සංස්කෘතික විවිධත්වය තුළ මූලික විශ්වාසය හා සිරිත් පිළිබඳව ප්‍රබල එකමුතුවක් ඇත.

අනිවාර්යයෙන්ම, සංස්කෘතිය රහිත රික්තයක් තුළ ආගම කිසි විටෙකත් නොපවතී. එය සැමවිටම සංස්කෘතික පසුබිමක් තුළ සිය ප්‍රකාශනය සොයාගනී. ඒ අතරම, බහුතරයකගේ සදාචාරාත්මක සාරධර්ම හා ආගමික ඉගැන්වීම් ගැන සඳහන් නොකර සංස්කෘතීන් කිසි විටෙකත් බිහි නොවේ හෝ පරිණාමය නොවේ. "එබැවින් ආගමික වශයෙන් මධ්‍යස්ථ සංස්කෘතීන් හෝ සංස්කෘතියෙන් තොර ආගම් නොමැත."[40] ඕනෑම වේලාවක හා ස්ථානයකදී මුස්ලිම්වරුන්ට (සහ මුස්ලිම් නොවන අයට) ඇති ලොකුම අභියෝගය නම්, ඉස්ලාමයේ කාලානුරූපී හා විශ්වීය ඉගැන්වීම් සහ මූලධර්මවලින් එම ඉගැන්වීම් හා මූලධර්ම මත තබා ඇති සංස්කෘතිකමය අර්ථකථන වෙන්කර හඳුනාගැනීමයි. කුර්'ආනයේ හෝ සුන්නාවේ විස්තර නොකෙරෙන තත්ත්වයන්ට මුස්ලිම්වරු අනිවාර්යයෙන්ම මුහුණ දෙනු ඇතැයි මුහම්මද් නබිතුමා (ඔහුට සමාදානය වේවා) පවා පිළිගත් අතර, අපේක්ෂා ද කළේය. බුද්ධිමත් නීති විශාරදයන්ගේ විවේචනාත්මක විශ්ලේෂණය සහ හා සංවේදී බුද්ධිය අවශ්‍ය වන ආකාරයේ නව සංස්කෘතික හා නෛතික තත්ත්වයන් සැමවිටම උද්ගත වනු හා පවතිනු ඇත. නියත වශයෙන්ම නබිතුමාගේ (ඔහුට සාමය ලැබේවා) කාලයේ අත්දැකීම්වලට වඩා ලෝකයේ විවිධ කලාපවල හා යුගවල නව ගැටළු ඇති වනු ඇත, එබැවින් සංස්කෘතික සූක්ෂ්මතාවන් අර්ථ නිරූපණය කිරීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම, මුස්ලිම්වරුන් සැමවිටම කර ඇති දේවල් වේ.

නිරීක්ෂකයින්, විශේෂයෙන් බටහිරින් පැමිණෙන අය, සාමාන්‍යයෙන් මුස්ලිම් සමාජයන් තක්සේරු කිරීමේදී ප්‍රවේශයන් දෙකක් ගනී. පළමු

ප්‍රවේශයේ දී මුස්ලිම්වරුන් තනි ඒකලිත හා වෙනස් නොවන ආයතනයක් ලෙස සැලකේ. විවිධ භූගෝලීය හා කාලවේලා වෙනස්කම් නොසලකා, සියලුම මුස්ලිම්වරුන් එක හා සමානයැ'යි ඔවුන් සිතති.[41] නූතන මුස්ලිම් ලෝකයේ දෘශ්‍යමාන සංස්කෘතික විවිධත්වය මෙම ප්‍රවේශය මගින් නොසලකා හරියි. දෙවන ප්‍රවේශය, පළමුවැන්නෙන් සැලකිය යුතු ලෙස වෙනස් වේ. ඉස්ලාමය එහි ශුද්ධ වූ ලියවිලිවලින් වෙන් කොට, ප්‍රධාන වශයෙන් මිනිසුන් - එහි අනුගාමිකයන් හරහා හඳුනාගැනේ. මුස්ලිම්වරු විවිධ ජාතීන්ට අයත් වන බැවින් තුර්කි ඉස්ලාම්, ලෙබනන් ඉස්ලාම්, ඕමානි ඉස්ලාම්, ඉන්දුනීසියානු ඉස්ලාම් වැනි විවිධ "ඉස්ලාම්" ඇත. මෙම මතයට අනුව, ඒකීය මතවාදයක් ඇති ඉස්ලාමීය ලෝකයක් නොමැති අතර, ලෝකයක් විවිධ වූ "ඉස්ලාමයන්" බොහෝ සේ ඇති ලෝකයක් ඇත. ඒවා පවත්වාගෙන යන තත්ත්වයන් තරමටම වූ "ඉස්ලාමයන්" ද පවතී.[42] මෙහිදී, ඉස්ලාමය ජාතික අනන්‍යතාවන් අනුව බිඳී යන තැනට සංස්කෘතික විවිධත්ව රේඛාව විහිදී තිබේ. වඩාත් නිවැරදි ප්‍රවේශයක් වනුයේ කාලය හා අවකාශය තුළ ඉස්ලාමයේ අනන්‍ය අත්දැකීම් ගැන කතා කිරීමයි. ඉස්ලාමය ආගමක් ලෙස කුර්ආනයේ ලිඛිත මූලාශ්‍ර සහ හදීස්වල සුන්නාහ්වේ (නබිතුමාගේ ප්‍රායෝගික උදාහරණ) ආරක්ෂා වී ඇත. ලිඛිත ආකාරයෙන් පවතින ඉස්ලාමය වෙනස් නොවනමුත්, මුස්ලිම්වරු රික්තකයක් තුළ ජීවත් නොවන බව ද මතකයේ තබාගත යුතු ය. ඔවුන් ජීවත් වන්නේ නිශ්චිත කාලයක සහ විශේෂ අවකාශයක ය. යම් නිශ්චිත ප්‍රදේශයක පවතින තත්ත්ව සහ අවස්ථා සහ ඒ කාලයේ උද්ගත වන ප්‍රශ්න සහ අභියෝග මුස්ලිම්වරුන්ට කුර්'ආනයෙන් සහ සුන්නාහ්වෙන් ආභාෂය සපයාගැනීම සඳහා වන සන්දර්භය සපයයි. මෙම අවස්ථාවෙහිදී, නොවෙනස් වන ලිඛිත ලියවිලිවලට නැවුම් අවබෝධයක් සහ තීක්ෂණ අර්ථ නිරූපණයක් ලබාදෙන ආකාරයේ අනන්‍ය ඉස්ලාමීය අත්දැකීම් නිපදවෙන සැපයුම් මාර්ගයක් "ලිඛිත ආකාරය" සහ "සන්දර්භය" යන දෙකම මගින් ලැබේ.[43]

පුද්ගල මට්ටමින්, මුස්ලිම්වරයෙකුගේ ඉස්ලාමය පිළිබඳ අත්දැකීම් රඳා පවතින්නේ එහි ඉගැන්වීම් පිළිබඳ ඔහුගේ දැනුම, අවබෝධයේ මට්ටම සහ එම ඉගැන්වීම් අභ්‍යන්තරකරණය කිරීම සහ එම ඉගැන්වීම් ඔහු කොතරම් දුරට පිළිපදින්නේ ද යන්න මතය. ඒ හා සමානව, සෑම මුස්ලිම් සමාජයක්ම ඉස්ලාමය අත්විඳින්නේ එහි කාලය හා භූගෝලීය සාධක මත පදනම්වය. එබැවින් මුස්ලිම්වරු එකම ආකාරයේ අච්චුවකට වැටෙන ආයතනයක් නොවන අතර, ඉස්ලාම් වර්ග කිහිපයක් ද නොපවතී. ඒ වෙනුවට, පුද්ගලයන් සහ මුස්ලිම් සමාජයන් ඉස්ලාමයේ නොයෙකුත් අනන්‍ය අත්දැකීම් අත්විඳිති. මෙම අත්දැකීම් නොවැළැක්විය හැකි අතර, ඒවා මුස්ලිම් ලෝකයේ අපට

දකින සංස්කෘතික විවිධත්වය පැහැදිලි කරයි. මෙම විවිධත්වය ඇත්ත වශයෙන්ම ඉස්ලාමය එහි ප්‍රධාන මූලධර්ම හා ඉගැන්වීම් පවත්වා ගෙන යන අතරම, විවිධ සංස්කෘතීන්ට ඇදහිය නොහැකි ලෙස අනුවර්තනය වීම පිළිබඳ ශක්තිමත් සාක්ෂියකි. මුස්ලිම්වරු මෙම සමබරතාවය දකින්නේ දෙවියන්ගේ අනුග්‍රහය සහ දයාව පිළිබඳ සාක්ෂියක් ලෙස ය. ඉස්ලාමය ඉතා සංස්කෘතික හිතකාමී වන අතර එය සෑම විටම සංස්කෘතියක් වැඩිදියුණු කිරීමට උත්සාහ කරයි. කණගාටුවට කරුණක් නම්, නොදැනුම්වත් බව නිසා හෝ ඓතිහාසික දැනුම්වත්භාවය නොමැති නිසා සමහර මුස්ලිම්වරු ඔවුන්ගේ ඉස්ලාමීය මූලයන් ඔවුන්ගේ සංස්කෘතික සම්මතයන් සමග සම්බන්ධ කිරීමට අමතක කිරීම හෝ අසමත් වීමයි. මෙය සිදු වූ විට, ඉස්ලාමයේ ආත්මයට හා ඉගැන්වීම්වලට පටහැනි සංස්කෘතික පුරුදු වර්ධනය වී, හානිකර හෝ විනාශකාරී සම්මුතියක් ඇත්ත වශයෙන්ම ඉස්ලාමීය යැයි හැඟීමක් ඇති කළ හැකිය.[44] සමහර මුස්ලිම් සමාජයන් තුළට වැරදි ලෙස සම්බන්ධ වී ඇති එවැනි නරක සංස්කෘතික භාවිතයන් බොහොමයක් ඉස්ලාමය හෝ එහි ඉගැන්වීම්වලට වැරදියට ආරෝපණය කර තිබේ. බලහත්කාරයෙන් විවාහ කිරීම, ළමා විවාහ, ගෞරවය වෙනුවෙන් කෙරෙන ඝාතන, පිරිමි දරුවන්ට වැඩි කැමැත්තක් දැක්වීම සහ ගැහැණු ලිංගික අවයව විකෘති කිරීම මෙම පිළිවෙත් අතර වේ. මෙම සියලු භාවිතයන් ඉස්ලාමීය නොවන නමුත්, ඒවා වැරදි වැටහීම් උග්‍ර කිරීමට සහ ඉස්ලාමය පිළිබඳ නිශේධනාත්මක ඒකාකෘති ශක්තිමත් කිරීමට උපකාරී වේ.



තායිලන්තයේ නෙකොන්-ශ්‍රී-තම්මරත් හි දේවස්ථාන අධ්‍යයන කවයක කුර්'ආනය පාරායනය කරමින් සිටින තරුණ මුස්ලිම් සිසුන්.

# ආගම වැදගත් වන්නේ ඇයි?

ආගම වැදගත් වන හේතු හයක් මෙසේ පෙන්වාදිය හැකː

1. අපගේ සාරධර්ම, හැසිරීම සහ ක්‍රියාවන් තීරණය වන්නේ අපගේ අභ්‍යන්තර හෘදසාක්ෂියේ සම්මතයක් ලෙස අප විශ්වාස කරන දේ අනුව ය. මෙම සම්මතය හැඩගස්වා ඇත්තේ අපට උරුම වන අපේ සංස්කෘතියෙනි. එම විශ්වාසය කුමක් වුවත්, සංස්කෘතික සම්මතය මෙම විශ්වාසයට බෙහෙවින් බලපායි. සංස්කෘතික සම්මතයක් නොමැතිව (හෝ මිනුම්දණ්ඩක්) අපගේ ජීවන දිශානතිය ව්‍යාකූල වනු ඇත. එමගින් සමාජය විසින් සම්මතයන් සහ වටිනාකම් යැයි ප්‍රත්‍යක්ෂ කරගත් දේ බිඳ වැටී, යා යුතු දිශානතිය පිළිබඳ නිවැරදි අදහසක් නොමැති වීමක්, හිස් බවක් ඇති කරන අතර, ඉන් පුද්ගලයාගේ මෙන්ම සමාජයේ ද අභ්‍යන්තර අපිළිවෙළක් නිර්මාණය කරයි. එමනිසා, ආරම්භයේ දී ම ආගම වැදගත් වන්නේ එය අපගේ සංස්කෘතික සම්මතය සහ ලෝක දෘෂ්ටිය නිර්වචනය කෙරෙන විශ්වාසය නිර්වචනය කරන බැවිනි. ඇත්ත වශයෙන්ම, ඉන් අපගේ පුද්ගලික මෙන්ම සමාජීය අවංක බව තහවුරු කරයි.

2. දෙවියන් පිළිබඳ දැනුමේ එකම ප්‍රභවය ආගමයිː ඔහු කවුද, ඔහුගේ ගුණාංග මොනවාද සහ ඔහුගේ ස්වභාවය කුමක්ද? මේ අනුව, ආගම වැදගත් වන්නේ, ආගම ප්‍රතික්ෂේප කිරීම දෙවියන් වහන්සේව ප්‍රතික්ෂේප කිරීමට සමාන වන බැවිනි.

3. මිනිස් සංජානනයෙන් ඔබ්බට ගිය නමුත් යථාර්ථවාදී දේවල් පිළිබඳ දැනුමේ එකම ප්‍රභවය ආගමයි. මිනිස් ආත්මයේ සදාකාලික ස්වභාවය, මරණයෙන් පසු ජීවිතය, දේවදූතයන් යනාදිය ගැන පවසන්නේ ආගමයි. මේ අනුව, ආගමක් නොමැති විට යමෙකු අපගේ භෞතික සංජානනයෙන් ඔබ්බට ගිය මෙම යථාර්ථයන් මුළුමනින්ම අමතක කරයි.

4. ජීවිතයේ අරමුණ ගැන ආගම අපට කියයිː මා මෙහි සිටින්නේ ඇයි? මම අවසානයේ යන්නේ කොහේද? මේ ජීවිතයේ මගේ තේරීම්වල ප්‍රතිවිපාක මොනවාද? ජීවිතයේ මෙම අරමුණු පිළිබඳ හැඟීමක් නොමැති නිසා බොහෝ අය බලාපොරොත්තු සුන් වී සිටිති.

5. ආගම ජීවන මාර්ගයක් ලෙස ද අර්ථ දැක්වේ; එය මානව අභිමානය පවත්වාගැනීම හා ආරක්ෂා කිරීම මෙන්ම, සුහද හා ප්‍රීතිමත් ජීවිතයක් සඳහා වූ තත්ත්ව නිර්මාණය කිරීම අරමුණු කරගත් ජීවන නීති සංග්‍රහයකි. එය අනුදකිමින් ජීවත් වීම සඳහා සදාචාරාත්මක ප්‍රමිතීන් සහ සාධාරණ

යුක්තිය පසිඳලීමේ පද්ධතියක් පිළිබඳව නිර්වචනය කරන්නේ ආගමයි. ආගම නොසලකා හැරීම, නපුර පිළිබඳ සමස්ත ලැයිස්තුවම දිගහැරීමට මඟ පාදනු ඇත; සූරාකෑම, අයුක්තිය, හිංසනය, කෑදරකම, වෙනස් කොට සැලකීම, දූෂණය ආදී වශයෙන් මේ ලැයිස්තුවේ නිමක් නොමැති අපේම සාමූහික යහපත සඳහා ආගම අවශ්‍යයි.

6. අවසාන කිරීමට ප්‍රථමයෙන්, ආගම වැදගත් වන්නේ එය අපගේ ඊළඟ ජීවිතයට සූදානම් විය හැකි ආකාරය ගැන පවසන බැවිනි. 9 වන කොටසේ තර්ක කර ඇති පරිදි, මරණයෙන් පසු ජීවිතය යථාර්ථයක් වන අතර, ඉදිරියේ ඇති දෙය රඳා පවතින්නේ අප මේ ජීවිතයේ ගන්නා තේරීම් මත ය. අපගේ මැවුම්කරු අපෙන් අපේක්ෂා කරන්නේ කුමක්ද, අපගේ ජීවිත ගත කළ යුතු ආකාරය සහ පරලොව අපගේ ක්‍රියාවන්ගේ ප්‍රතිවිපාක මොනවාද යන්න ආගම අපට නිවැරදිවම කියයි.

ආගමක් නැති ජීවිතය යනු ජීවිතයේ අරමුණ සහ අපගේ පැවැත්ම පිළිබඳ පුළුල් දෘෂ්ටිය නොසලකා හරින ලද ජීවිතයක් මෙන්ම ඉදිරියේදී සිදුවීමට නියමිත දේවල් පිළිබඳ දැක්මක් නොමැති ජීවිතයකි. අල්-කුර්ආනයේ පහත සඳහන් පද අපට අවවාද කරන පරිදි ආගම පසෙකට දැමීම නුවණට හුරු නැත (67: 6-12):

> තම පරමාධිපතිව ප්‍රතික්ෂේප කළවුන්ට නිරයේ දඬුවම ඇත. (ඔවුහු) අවසානයේ යොමු වන ස්ථානය කෙතරම් නින්දනීය ද, එහි ඔවුන් විසි කරනු ලබන විට පිළිකුල් හඬක් ඔවුහු ශ්‍රවණය කරති. තවද එය උතුරා නටමින් පවතී. එය කෝපයෙන් පිපිරී යාමට තැත් කරයි. එහි කණ්ඩායමක් විසිකරනු ලබන සෑම විටකම "(නබිවරුන් අතුරින්) අවවාද කරන්නෙකු නුඹලා වෙත නොපැමිණියේ දැ?"යි (නිරයේ) භාරකරුවෝ එහි ඔවුන්ගෙන් විමසති. "එසේ නොව, අවවාද කරන්නා සැබැවින්ම අප වෙත පැමිණියේය. නමුත් අපි (එම අවවාද කරන රසූල්වරුන්ව) අසත්‍යය කළෙමු. තවද 'අල්ලාහ් කිසිවක් පහළ කළේ නැත. තවද නුඹලා මහත් මුළාවෙහි මිස (අන් කිසිවක) නැතැ'යි අපි (ඔවුනට) පැවසුවෙමු" යැයි ඔවුහු පවසති. තවද "අප සවන් දුන්නේ නම් හෝ අවබෝධ කරගත්තේ නම් හෝ අපි දළු ලා ඇවිළෙන ගින්නේ සගයින් නොවෙමු" යැයි ද ඔවුහු පවසති. එබැවින් ඔවුහු තමන්ගේ පාපයන් පිළිගනිති. එහෙයින් දළු ලා ඇවිළෙන ගින්නේ සගයින් (අල්ලාහ්ගේ කරුණාවෙන්) දුරස් ය! අදෘශ්‍යමානයෙහි තම පරමාධිපතිට බිය වන අය වන ඔවුනට සමාව ද, මහත් වූ තිළිණය ද ඇත.

# යමෙකු ට මුස්ලිම්වරයෙකු විය හැක්කේ කෙසේද?

ඉස්ලාමය පදනම් වී ඇති විශ්වාසය හා සබැඳි කොටස් හය (හෝ කුළුණු) සහ ආගමේ කොටස් පහ මෙම පොතේ 2 වන කොටසෙහි විස්තර කර ඇත. මෙම මූලධර්ම තේරුම් ගෙන පිළිගත් පසු යමෙක් සරලවම මුස්ලිම්වරයෙකු වන්නේ පහත සඳහන් දේ ප්‍රකාශ කිරීමෙනි.

අෂ්හදු අන් ලා ඉලාහ ඉල්ලල්ලාහ්
ව අෂ්හදු අන්න මුහම්මද
රසූලුල්ලාහ්.

අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු
වන්දනාමාන කිරීමට සුදුසු නැති
බව මම සාක්ෂි දරමි. මුහම්මද්
අල්ලාහ්ගේ පණිවිඩකරුවා ය.

මෙම ප්‍රකාශය අරාබි බසින් ෂහාදා ලෙස හැඳින්වේ, එයින් අදහස් කරන්නේ විශ්වාසය පිළිබඳ පොරොන්දුවක් සහ තහවුරු කිරීමකි. එය මුලින්ම අරාබි බසින් ද, පසුව නව මුස්ලිම්වරයාට තේරුම් ගත හැකි භාෂාවෙන් ද කියනු ලැබේ.

ෂහාදා උච්චාරණය කළ පසු යමෙක් මුස්ලිම්වරයෙකු බවට පත්වන අතර, මෙතැන් සිට විශ්වාසය සහ ආගම පිළිබඳ කොටස් සම්බන්ධයෙන් විශ්වාස කිරීමට හා ක්‍රියා කිරීමට කැප වී සිටී.

මුස්ලිම් නොවන අයෙකු ඉස්ලාමය වැළඳගත් විට, ඔහු හෝ ඇය සැබවින්ම ඔහුගේ හෝ ඇයගේ "උපන් ආගම" වෙත ආපසු යමින් සිටින්නේ සෑම කෙනෙකුම මුස්ලිම් ජාතිකයෙකු ලෙස උපත ලබන බැවිනි. එනම්, උපතේදී සෑම කෙනෙක්ම අල්ලාහ්ගේ කැමැත්තට පූර්ණ ලෙස යටත් වන අතර, මූලික සදාචාරය පිළිබඳ සහජ දැනුමක් ඇත (අරාබි බසින් ෆිත්රා). යමෙකු වැඩෙත්ම, පුද්ගලයා යම් ආගමකට යොමු කරන්නේ දෙමව්පියන් සහ අවට සංස්කෘතියයි. එබැවින් සත්‍යය සෙවීම සහ තර්කානුකූල දේ පිළිගැනීම මෙන්ම විශ්වාසය සහ ආගම පිළිබඳ කාරණා සම්බන්ධයෙන් තේරුම්ගැනීම පුද්ගලයාගේ වගකීම වේ.

# විශ්වාසය පිළිබඳ සත්‍යය

1. උපත ලැබීමේ ඇති අහම්බය නිසා අන්ධ විශ්වාසයක් කරපින්නාගැනීම සහ මුතුන්මිත්තන් අනුගමනය කළ දේ ම අනුගමනය කිරීම යනු සැබෑ විශ්වාසයකි යි සැලකිය නොහැක.

2. සැබෑ විශ්වාසය පදනම් විය යුත්තේ දැනුම, හේතුදැක්වීම් සහ තර්කනය මත ය.

3. කෙනෙකුගේ විශ්වාසයේ පදනම දැඩි, ස්ථිර සාක්ෂි මඟින් තහවුරු විය යුතුය.

සටහන: ඉස්ලාමයේ නම්, විශ්වාසය සහ හේතුදැක්වීම එකිනෙක හා බැඳී පවතී. කෙනෙකුගේ විශ්වාසය සනාථ කිරීමට සහ ශක්තිමත් කිරීමට හේතුදැක්වීමක් භාවිතා කිරීම අවශ්‍ය වේ.

# පාරිභාෂික පදමාලාව

අල්ලාහ්: මැවුම්කරුවාට අනන්‍ය පෞද්ගලික නාමය සහ විශ්වයේ පරමාධිපති. (කොටස 3 බලන්න)

ආයාහ්: කුර්'ආනයේ අඩංගු ඕනෑම වාක්‍යයකි. එහි 'දෙවියන්ගේ සංඥාව' යන අර්ථය ද තිබේ.

නායක / ජනාධිපති: මුස්ලිම් ප්‍රජාවේ නායකයා - මෙම වචනය පැමිණෙන්නේ 'කලීෆා' යන අරාබි වචනයෙන් වන අතර, 'රාජ්‍යය වෙනුවෙන් බලය පාවිච්චි කරන' යන අර්ථය ද එහි වේ.

හදීස්: හදීස් (හෝ හදීත්) සහ සුන්නාහ් යනු, පිළිවෙලින් මුහම්මද් නබිතුමාගේ (ඔහුට සමාදානය වේවා) කියමන් සහ ජීවන උදාහරණ වේ. ඉන් සෑදෙන නබිතුමාගේ ඉගැන්වීම් සමූහය, සාමූහිකව 'නබිතුමාගේ සුන්නාහ්' ලෙස හැඳින්වේ. (කොටස 8 බලන්න)

හජ්: මුස්ලිම්වරුන්ගේ වාර්ෂික මක්කාහ් වන්දනාව. (කොටස 2 බලන්න)

හිජ්රා: මක්කාවේ සිට මදීනා දක්වා මුස්ලිම්වරුන්ගේ සංක්‍රමණය ක්‍රි.ව. 622 දී සිදු වූ එය හිජ්රා දින දර්ශනය ලෙස හැඳින්වෙන මුස්ලිම් චන්ද්‍ර දින දර්ශනයේ ආරම්භය සනිටුහන් කළේය. (කොටස 4 බලන්න)

ඉබාදි: ඉස්ලාමීය නීති ගුරුකුලයක්. (කොටස 18 බලන්න)

ඉස්ලාම්: මැවුම්කරු වන අල්ලාහ්ගේ ඒකීයභාවය කෙරෙහි විශ්වාසය තැබීම සහ ඔහුගේ අභිමතය පූර්ණ ලෙස පිළිගැනීම හා කීකරු වන ලෙස නියෝග කරන ආගමේ නම. (කොටස 2 බලන්න)

ජිහාද්: අල්ලාහ්ගේ මාර්ගයේ අරගල කිරීම හෝ උත්සාහ කිරීම. මේ අනුව, අල්ලාහ්ගේ සතුට හා අනුමැතිය ලබා ගැනීමේ අදහසින් විශ්වාසවන්තයෙකු කරන සෑම ක්‍රියාවක්ම ජිහාද් වේ. (කොටස 16 බලන්න)

කඃබාහ්: එකම දෙවියන්ට නැමදීම සඳහා මිහිපිට ඉදිකරන ලද පළමු නිවසී එය මක්කාවේ මහා දේවස්ථාන පරිශ්‍රය තුළ පිහිටා ඇති අතර, සාමාන්‍යයෙන් කළු රෙදිවලින් ඔතා ඇත.

මදීනාහ්: මක්කාවට කිලෝමීටර් 400 ක් උතුරින් පිහිටි සෞදි අරාබියේ නගරයක්. එය ඉස්ලාමයේ දෙවන ශුද්ධ වූ මුස්ලිම් දේවස්ථානය වන නබිතුමාණන්ගේ දේවස්ථානය (අරාබි බසින් මස්ජිද් අල්-නබවි) පිහිටා ඇති නගරයයි.

මක්කාහ්: සෞදි අරාබියේ බටහිර කොටසට වන්නට පිහිටා ඇති නගරයක්. එය කඃබාව සහ ඉස්ලාමයේ ප්‍රථම අති ශුද්ධ මුස්ලිම් දේවස්ථානය වන 'නොකෙලෙසිය යුතු දේවස්ථානය' (හෝ අරාබි බසින් මස්ජිද් අල්-හරාම්) පිහිටි නගරයයි.

මුස්ලිම්: ඉස්ලාම් ආගමේ ප්‍රතිපත්ති විශ්වාස කොට පිළිපදින පුද්ගලයෙක්.

කිබ්ලාඃ: නැමදුම් කටයුතු සඳහා මුස්ලිම්වරු හැරී සිටින මක්කාහ්ව පිහිටි දිශාව.

කුර්'ආන්: මුහම්මද් නබිතුමාට (ඔහුට සමාදානය ලැබේවා) පහළ කළ අවසාන දිව්‍යමය පණිවිඩය. (6 වන කොටස බලන්න)

ෂරී'ආහ්: මූලික විශ්වාසයන් (ඇදහීම), නැමදුම් විධි, ආචාර ධර්ම, සමාජ ආර්ථික මූලධර්ම සහ දණ්ඩ නීති සංග්‍රහය ඇතුළත් ඉස්ලාමීය චර්යාධර්ම පද්ධතිය. (17 වන කොටස බලන්න)

ෂියා'ඃ: ඉස්ලාමයේ නීති ගුරුකුලයක්. (18 වන කොටස බලන්න)

සුන්නිඃ: ඉස්ලාමයේ නීති ගුරුකුලයක්. (18 වන කොටස බලන්න)

සූරාහ්: කුර්'ආනයේ ඇති ඕනෑම පරිච්ඡේදයක් හැඳින්වෙන්නේ මේ නමිනි.

උම්මාහ්: මුළු ලොවම සිසාරා සිටින මුස්ලිම් ප්‍රජාවේ සමස්තය.

# සමාප්ති සටහන්

1. කිසියම් අවස්ථාවක කිනම් නබිවරයෙකුගේ නමක් සඳහන් වුණත්, මුස්ලිම්වරු "ඔහුට/ඔවුන්ට අල්ලාහ්ගේ ආශිර්වාදය හා සමාදානය ලැබේවා" යනුවෙන් අල්ලාහ්ගෙන් අයදිති. (කුර්'ආනයේ 33:56, 37:181 ද බලන්න)

2. කුර්'ආන් 2:132, 136, 22:78

3. කුර්'ආනයේ බොහෝ තැන්වල විශ්වාසයේ කොටස් පිළිබඳව ප්‍රකාශ කොට ඇති උදාහරණ ලෙස; 2:3-4, 2:285, 4:136, 54:49 සහ අනෙකුත් වැකි.

4. අප විසින් සිදුකරන ක්‍රියා දෙවියන් විසින් පූර්වයෙන් සැලසුම් කොට නැති බව කුර්'ආනයේ පැහැදිලිව සඳහන් කර ඇත. උදාහරණ ලෙස; 4:62, 10:44, 13:11, 18:29, 30:41 සහ අනෙකුත් වැකි බලන්න.

5. කුර්'ආනයේ බොහෝ තැන්වල ආගමේ කොටස් පිළිබඳව ප්‍රකාශ කොට ඇති උදාහරණ ලෙස; 2:3, 2:43, 2:183, 2:196, 3:97, 22:78 සහ අනෙකුත් වැකි.

6. තක්වා යන්නෙහි තේරුම බිය වීම හෝ ආරක්ෂා කිරීමයි. එයින් අදහස් කරන්නේ අල්ලාහ්ගේ උදහසින් තමන්ව ආරක්ෂා කර ගැනීම සහ ඔහුගේ පැවැත්ම ගැන සවිඥානිකව සහ බියබැතියෙන් යුතුව සිටීම සඳහා උත්සාහ කිරීමයි. දෙවියන් පිළිබඳව මෙසේ සවිඥානික වීම, ශ්‍රද්ධාව හෝ ධර්මිෂ්ඨ බව ළඟා කරගැනීම ට ගාමක බලවේගයකි, එනම් යහපත කිරීම හා නපුරෙන් වැළකී සිටීම.

7. කුර්'ආන් 7:158, 21:107, 33:40, 34:28

8. නායකත්වය ලබාදීම සඳහා වූ අර්පණය ඉදිරිපත් වී තිබුණේ මක්කාහ්වේ වැදගතෙකු ලෙස සැලකුණු උත්බා බින් රාබි'ආ (අබූ සුෆ්යාන්ගේ මාමණ්ඩිය) විසිනි.

9. කුර්'ආන් 29:50-51

10. A. Yusuf Ali විසින් රචිත The Holy Qur'an, Translation and Commentary, The Islamic Foundation, London, 1975' 7:157 වැකිය පිළිබඳ විචාරය.

11. කුර්'ආන් 3:3, 4:47, 5:48, 15:9, 26:192-196, 76:23, සහ අනෙකුත් වැකි.

12. කුර්'ආනයේ බොහෝ වැකිවල මිනිසා සහ අල්ලාහ් අතර ඇති සබඳතාව ගැන මෙන්ම අනෙකුත් මැවීම් අතර ඇති සබඳතාව ගැන ද පවසා තිබේ. උදාහරණ වශයෙන්; 1:2, 2:21-22, 2:257, 7:54, 50:21, 82:10-12, 18:50, 6:112, 12:5, 6:38, 2:164, 31:10, 36:71-73, සහ අනෙකුත් වැකි.

13. කුර්'ආන් 2:38-39, 2:81-82, 17:9-10 සහ අනෙකුත් වැකි.

14. කුර්'ආන් 3:137, 10:71-73, 11:25-49, 12:1-113, 17:2-8, 71:1-28, සහ අනෙකුත් වැකි.

15. The Geological Concept of Mountains in the Qur'an, El-Naggar, ල පිටුව 5.

16. මේ විෂය ගැන වැඩිදුර කියවීම සඳහා කරුණාකර පහත දැක්වෙන යොමු බලන්නා: (1) Dr. Zakir Naik විසින් රචිත Qur'an & Modern Sciences (2) Maurice Bucaille විසින් රචිත The Bible, The Qur'an and Science (3) Caner Taslaman විසින් රචිත, Ender Gurol විසින් පරිවර්තනය කළ The Qur'an: Unchallengeable Miracle.

17. කුර්'ආන් 2:34, 17:61

18. කුර්'ආන් 14:44-46, 74:8-10, 80:33-46

19. කුර්'ආන් 13:22-23, 36:55-56, 52:21

20. කුර්'ආන් 5:48, 16:36, 10:47

21. කුර්'ආන් 3:64-65; 3:98-100, 4:47, සහ අනෙකුත් වැකි.

22. කුර්'ආන් 2:75, 2:79, 2:146, 159, 174, 3:71, 4:46, 5:13 සහ 5:15. ක්‍රිස්තියානි පසුබිමක් ඇති බයිබලය පිළිබඳ ශාස්ත්‍රඥයන් ද මේ කරුණ තහවුරු කරති, උදාහරණ සඳහා Bart D. Ehrman විසින් රචිත (1) 'Misquoting Jesus' සහ (2) 'Jesus Interrupted' බලන්න.

23. කුර්'ආන් 5:48.

24. කුර්'ආන් 11:118-119

25. කුර්'ආන් 3:59, 4:171, 5:75, 5:116-117, 19:30.

26. බයිබලය (KJV); මතෙව් 24:36, ජොහාන් 5:30, 14:28, 17:3 සහ 20:17, ක්‍රියා පොත 2:22 මේ විෂය ගැන වැඩිදුර කියවීමට පහත දැක්වෙන වෙබ් අඩවියට පිවිසෙන්න: http://www.islam-guide.com/ch3-10-1.htm. Dr. Lawrence Brown විසින් රචිත 'The First and Final Testament' ද ඔබට කියවිය හැක.

27. කුර්'ආන් 3:45, 4:171, 5:72, 19:30.

28. කුර්'ආන් 19:27–33 සහ 3:49; 5:110.

29. කුර්'ආන් 5:110 සහ 57:27.

30. බයිබලයේ සියලුම සංස්කරණ / ආකාරවලින් පැහැදිලි වන්නේ ජේසුස් (ඔහුට සමාදානය ලැබේවා) ඊශ්‍රායෙල් දරුවන් සඳහා එවන ලද බවයි. උදාහරණ සඳහා බයිබලය (KJV), මතෙව් 10:5-6 සහ මතෙව් 15:22-26 බලන්න.

31. මේ විද්‍යාඥයන් අතර අදේවවාදය සඳහා දැඩි සේ හඬ නැගූ ශ්‍රීමත් ඇන්ටනි ෆ්ලිව් ද විය. 2004 දී ඔහු දෙවියන් විශ්වාස කරන බව නිවේදනය කළ අතර, 2007 දී ඔහු 'There is God( How the World's Most Notorious Atheist Changed His Mind' යනුවෙන් පොතක් ද ලියා පළකළේය.

32. කුර්'ආන් 7:172 සහ 30:30.

33. කුර්'ආන් 3:86, 10:9, 13:27, 17:97, 18:17, 48:4, 74:31.

34. කුර්'ආන් 17:70, 23:115, 29:2, 30:8.

35. ඉතිහාසයේ කාන්තාවන්ට එරෙහිව සිදුකරන ලද අසාධාරණයන් පිළිබඳ උදාහරණ පහත දැක්වේ: (1) ඉස්ලාමයට පෙර අරාබියේ ළදරු දැරියන් පණපිටින් වළලනු ලැබීය. (2) රෝම ශිෂ්ඨාචාරය තුළ කාන්තාවන් වහලුන් ලෙස සැලකූ අතර, ග්‍රීකයෝ කාන්තාවන් වෙළඳ භාණ්ඩයක් ලෙස සැලකූහ. (3) ප්‍රංශයේදී කාන්තාවන් මිනිසුන් ගණයට අයත් වේ ද, නොවේ ද යන්න තීරණය කිරීම සඳහා ක්‍රි.ව. 587 දී සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. (4) 1850 ට පෙර කාන්තාවන් එංගලන්තයේ පුරවැසියන්

ලෙස නොසැලකූ අතර, 1882 වන තෙක් ඔවුන්ට පෞද්ගලික අයිතිවාසිකම් නොතිබුණි. (5) චීන සංස්කෘතිය තුළ පිරිමින්ට තම භාර්යාවන් වහලුන් ලෙස විකිණීමට අවසර දී තිබුණා පමණක් නොව, ඔවුන්ව පණපිටින් වළලන්නට පවා අවසර ලැබී තිබුණි. (6) හින්දු භක්තිකයන් ස්ත්‍රීන් සැලකුවේ මරණය, නිරය, වස හෝ ගින්නටත් වඩා දරුණු රෝගයක් ලෙස ය.

36. කුර්'ආන් 2:190, 2:193, 2:217, 4:75 සහ 8:39.

37. කුර්'ආන් 8:67-70. කුර්'ආන් 8:67-70. 8 වන සහ 9 වන පරිච්ඡේදවල (මෙන්ම වෙනත් පරිච්ඡේදවල) වැඩි කොටසක් වෙන්ව ඇත්තේ යුද්ධය සඳහා වූ තත්ත්වයන් හා කටයුතු කිරීම, යුද්ධයක දී හැසිරිය යුතු අයුරු, යුද්ධයක දී සටන් විරාමයකට යාම පිළිබඳ තීන්දු, සරණාගතයින්, යුද්ධයේ ජයග්‍රහණයේ ප්‍රතිඵලයක් ලෙස ලැබෙන ප්‍රතිලාභ කළමනාකරණය කිරීම සහ යුද සිරකරුවන්ට සැලකීම පිළිබඳව විමසීම සඳහා යි. ඓතිහාසිකව යුද සිරකරුවන්ට සැලකීම පිළිබඳ නීති හඳුන්වා දුන් ප්‍රථමයන් මුස්ලිම්වරුන් බව මෙහි දී සැලකිල්ලට ගැනීම වැදගත්ය.

38. වහල්භාවය අහෝසි කිරීමේ කාල රේඛාව http://en.wikipedia.org/wiki/Abolition_of_slavery_timeline

39. කුර්'ආන් 10:99, 109:1–6 සහ අනෙකුත් වැක.

40. යොමුකිරීම ඪෂ, පිටුව 183

41. යොමුකිරීම ඪෂළ පිටුව 4

42. යොමුකිරීම ඪෂළ පිටුව 4

43. යොමුකිරීම ඪෂෂළ පිටුව 110-114

44. යොමුකිරීම ඪෂෂළ පිටුව 116-118

# යොමුකිරීම්

I. The Holy Qur'an, Translation and Commentary, by A. Yusuf Ali, The Islamic Foundation, London, 1975.

II. Towards Understanding The Qur'an, by Sayyid Abul A'la Maududi, The Islamic Foundation, London, 1992.

III. Qur'an and Modern Sciences: Conflict or Conciliation? By Dr. Zakir Naik (2008), Islamic Research Foundation, Mumbai, India.

IV. Ulum Al-Qur'an, An Introduction to the Sciences of the Qur'an. By Ahmed Von Denfer, The Islamic Foundation, London, 1983

V. Muhammad in the Hindu Scriptures. By Dr. Ved Prakash Upaddhay, Published by A.S. Noordeen, Malaysia, 2007

VI. Tariq Ramadan, Radical Reform: Islamic Ethics and Liberation, Oxford University Press, Oxford, 2009.

VII. Clinton Bennet, Muslims and Modernity: An Introduction to the Issues and Debates, Continuum, New York, 2005.

VIII. Mehmet Ozalp, Islam between Tradition and Modernity, Barton Books, Australia, 2012.



"අර්-රහ්මාන්", මහා කාරුණිකයා. මෙය අල්ලාහ්ගේ ගුණාංගවලින් එකකි.

# සටහන්

تعريف الإسلام باللغة السنهالية

විකිණීම සඳහා නොවේ

एटम डीएनए की आणविक संरचना